# පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවන්හි පැනනැගුණු ගැටළු සමගින් මෙරට රාජ්‍ය විශ්වවිද්‍යාල හා එයට සමගාමීව ක්‍රියාත්මකවන උසස් අධ්‍යාපන ආයතන සම්බන්ධයෙන් වූ නිරීක්ෂණ ඇතුළත් විශේෂ විගණන වාර්තාව

**<u>පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවන්හි පැන නැගුණු ගැටළු සමඟින් මෙරට රාජ්‍ය විශ්වවිද්‍යාල හා එයට සමගාමීව ක්‍රියාත්මක වන උසස් අධ්‍යාපන ආයතන සම්බන්ධයෙන් වූ නිරීක්ෂණ ඇතුළත් විශේෂ විගණන වාර්තාව</u>**

**පටුන**


| | |
|---|---|
| වාර්තාවේ ස්වභාවය | 2.1 |
| වාර්තාවේ පසුබිම | 2.2 |
| 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත | 2.2.1 |
| විශ්වවිද්‍යාල පාලක සභාවේ සංයුතිය | 2.2.1.1 |
| විශ්වවිද්‍යාල සනාතන සභාවේ සංයුතිය | 2.2.1.2 |
| විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවා ඇති රාජ්‍ය විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන | 2.2.1.3 |
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ස්ථාපිත කිරීම | 2.2.2 |
| අනෙකුත් රෙගුලාසි හා ක්‍රමවේදයන් | 2.2.3 |
| උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මකවන විශ්වවිද්‍යාල | 2.2.4 |
| විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවල කාර්යභාර්යය හා අදාළවන පොදු කරුණු | 2.2.5 |
| රාජ්‍ය විශ්වවිද්‍යාල සඳහා ප්‍රවේශ ප්‍රතිපත්තිය | 2.2.5.1 |
| විශ්වවිද්‍යාල සඳහා සිසුන් ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය | 2.2.5.2 |
| දේශීය රාජ්‍ය විශ්වවිද්‍යාල සඳහා විදේශීය සිසුන් ඇතුළත් කිරීමේ ක්‍රමවේදය | 2.2.5.3 |
| විශ්වවිද්‍යාල කාර්යමණ්ඩලය විසින් එළඹෙන බැඳුම්කර ගිවිසුම | 2.2.6 |
| බාහිර උපාධි පාඨමාලා (ස්වයං මූල්‍ය පාඨමාලා) | 2.2.7 |
| විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන වෙනුවෙන් අන්තර්ජාල පහසුකම් සපයාගැනීම | 2.2.8 |
| දේශකවරුන්ගේ කාර්යභාර්යය | 2.2.9 |
| දේශන පැවැත්වෙන කාලය තීරණය කිරීම | 2.2.9.1 |
| විශ්වවිද්‍යාල මඟින් කෙරෙන පර්යේෂණ | 2.2.9.2 |
| සප්ත වාර්ෂික නිවාඩු හිමිකම | 2.2.9.3 |

පැමිණීම හා පිටවීම සනාථ කිරීම 2.2.9.4

සප්ත වාර්ෂික නිවාඩු සඳහා දීමනා ගෙවීම 2.2.9.5

විශ්වවිද්‍යාල සඳහා සිසුන් බඳවා ගැනීමේදී යෝග්‍යතා පරීක්ෂණ පැවැත්වීම 2.2.10

විශ්වවිද්‍යාල සිසුන් සඳහා නේවාසිකාගාර පහසුකම් 2.2.11

විශ්වවිද්‍යාල අනධ්‍යයන කාර්යමණ්ඩලය බඳවා ගැනීම 2.2.12

මූල්‍ය පාලනය 2.2.13

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත ප්‍රකාර විශේෂ අරමුදල් ඇති කිරීම 2.2.13.1

විශ්වවිද්‍යාල මඟින් රජයේ මුදල් ස්ථාවර තැන්පතුවල යෙදවීම 2.2.13.2

මාණ්ඩලික නිලධාරීන් සඳහා සංග්‍රහ වියදම් ගෙවීම 2.2.13.3

සේවක අර්ථසාධක අරමුදල හා විශ්වවිද්‍යාල සේවක භාරකාර අරමුදල සඳහා දායක මුදල් ගණනය කිරීම 2.2.14

ගිණුම්කරණ ක්‍රමවේදය 2.2.15

මෙම වාර්තාවේ විෂය පථය 2.3

මෙම විෂය වාර්තාවට අදාළ විගණන ප්‍රවේශය 2.4

නිරීක්ෂණ 3

රාජ්‍ය ව්‍යාපාර කාරක සභාව විසින් සාකච්ඡා කළ කරුණු සම්බන්ධයෙන් ප්‍රගතිය 3.1

විශ්වවිද්‍යාල පද්ධතියට අදාළව නිරීක්ෂණය වූ පොදු කරුණු 3.1.1

එක් එක් විශ්වවිද්‍යාලයට විශේෂිත වූ අඩුපාඩු සම්බන්ධව පොදු ව්‍යාපාර කාරක සභාවේ සාකච්ඡා කරන ලද කරුණු හා ලබාදෙන ලද නිර්දේශ, නියෝග හා ඒවායේ ක්‍රියාත්මකභාවය 3.1.2

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂමට විශේෂිත වූ අඩුපාඩු සම්න්ධව පොදු ව්‍යාපාර කාරක සභාවේ සාකච්ඡා කරන ලද කරුණු 3.1.3

විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන පද්ධතියට අදාළ පොදු නිරීක්ෂණ 3.2

දේශීය රාජ්‍ය විශ්වවිද්‍යාල සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමෙන් පසු ඇතිවන පුරප්පාඩු 3.2.1

දේශීය විශ්වවිද්‍යාල සඳහා විදේශීය සිසුන් ඇතුළත් කර ගැනීමෙන් පසු ඇතිවන පුරප්පාඩු 3.2.2

විශ්වවිද්‍යාල සඳහා සිසුන් බඳවා ගැනීමේදී යෝග්‍යතා පරීක්ෂණ පැවැත්වීම 3.2.3

අන්තර්ජාලය හරහා විශ්වවිද්‍යාල ප්‍රවේශය අයදුම්කිරීම. 3.2.4

සිසුන්ගේ නේවාසිකාගාර අවශ්‍යතා සහ අනෙකුත් පොදු පහසුකම් 3.2.5

විශ්වවිද්‍යාල මගින් බාහිර උපාධි පාඨමාලා (ස්වයං මූල්‍ය) පැවැත්වීම 3.2.6

සප්ත වාර්ෂික නිවාඩු සඳහා දීමනා ගෙවීම 3.2.7

විශ්වවිද්‍යාල ආචාර්යවරුන් සඳහා දේශන පැය වෙන්කිරීම 3.2.8

විශ්වවිද්‍යාල කාර්යමණ්ඩලය විසින් එළඹෙන බැඳුම්කර ගිවිසුම 3.2.9

විශ්වවිද්‍යාල මගින් පැවැත්වෙන විෂය පරීක්ෂණ 3.2.10

විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන වෙනුවෙන් අන්තර්ජාල පහසුකම් සපයාගැනීම 3.2.11

විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන පවත්වා ගෙන යනු ලබන ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය 3.2.12

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත ප්‍රකාර විශේෂ අරමුදල් ඇතිකර තිබීම 3.2.13

ප්‍රාග්ධන ප්‍රදානයන් 3.2.14

විශ්වවිද්‍යාල මගින් රජයේ මුදල් ස්ථාවර තැන්පතුවල යෙදවීම 3.2.15

විශ්වවිද්‍යාල සඳහා අනධ්‍යයන කාර්යමණ්ඩලය බඳවාගැනීම 3.2.16

විශ්වවිද්‍යාල තුළ ගිණුම් සැකසීමේ පොදු ක්‍රමවේදයක් අනුගමනය නොකිරීම 3.2.17

අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයන්ගේ පැමිණීම හා පිටවීම සනාථ කර ගැනීමකින් තොරව වැටුප් හා දීමනා ගෙවා තිබීම 3.2.18

කාර්යමණ්ඩල පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබීම 3.2.19

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතනය සඳහා ආයතන සංග්‍රහය 3.2.20

විශ්වවිද්‍යාල සඳහා පීඨ පැවරීම 3.2.21

මාණ්ඩලික නිලධාරීන් සඳහා සංග්‍රහ වියදම් ගෙවීම 3.2.22

සේවක අර්ථසාධක අරමුදල හා විශ්වවිද්‍යාල සේවක භාරකාර අරමුදල සඳහා දායක මුදල් ගණනය කිරීම 3.2.23

| | |
|---|---|
| බාහිර උපාධි පාඨමාලා ආදායම් විශ්වවිද්‍යාල අරමුදලට බැර නොකිරීම | 3.2.24 |
| උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මකවන විශ්වවිද්‍යාල | 3.2.25 |
| කොන්ත්‍රාත් පරිපාලනය | 3.2.26 |
| නිර්දේශ | 4 |

**පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවන්හි පැන නැගුණු ගැටළු සමගින් මෙරට විශ්වවිද්‍යාල පද්ධතිය සම්බන්ධයෙන් වූ නිරීක්ෂණ ඇතුළත් විශේෂ විගණන වාර්තාව.**

**විධායක සාරාංශය**

ශ්‍රී ලංකා රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය නියාමනයවන ප්‍රධානතම ආයතනය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වන අතර එම කොමිෂන් සභාව යටතේ විශ්වවිද්‍යාල 15 ක්, පශ්චාත් උපාධි ආයතන 09 ක්, උසස් අධ්‍යාපන ආයතන 10 ක් සහ මණ්ඩප 03 ක් ස්ථාපිත කර ඇත. එක් එක් විශ්වවිද්‍යාලයේ පාලන අධිකාරිය පාලක සභාව වන අතර ඒවායේ සනාතන සභාවන් අධ්‍යයන කටයුතු සම්බන්ධ උත්තරීතර සභාව ද වේ. මේ අනුව රාජ්‍ය විශ්වවිද්‍යාලයක සහ අනෙකුත් උසස් අධ්‍යාපන ආයතනයක ප්‍රධාන විධායක නිලධාරීන් අනුපිළිවෙළින් උපකුලපති හා අධ්‍යක්ෂ වේ. තව ද මෙම විශ්වවිද්‍යාල 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත මඟින් පාලනය වේ. විශ්වවිද්‍යාල මඟින් උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට ඉහළ මෙහෙවරක් සිදුවන අතර ඒ පිළිබඳව සැලකිල්ලට ගනිමින් සෑම රජයක් විසින්ම ශ්‍රී ලංකාවේ මානව සම්පත සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් සිදු  කරනු ලබන විශාල මූල්‍ය ආයෝජනයක් විශ්වවිද්‍යාල පද්ධතිය හරහා සිදුවේ. එසේ වුවද පසුගිය කාලවකවානුවල සිදුකරනු ලැබූ විගණනයේදී විශ්වවිද්‍යාල පද්ධතිය සම්බන්ධව අනාවරණය වූ නිරීක්ෂණ පිළිබඳව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් අවස්ථා ගණනාවකදී ඉතා ගැඹුරින් සාකච්ඡා කර එම ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා අවශ්‍ය උපදෙස් හා නිර්දේශ විටින්විට ලබා දී ඇතත් ඒවා විසඳාලීම සම්බන්ධව සතුටුදායක තත්ත්වයක් නිරූපණය නොවූ බැවින් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමාගේ ඉල්ලීම පරිදි මෙරට විශ්වවිද්‍යාල සම්බන්ධයෙන් වූ නිරීක්ෂණ ඇතුළත් මෙම විශේෂ වාර්තාව නිකුත් කිරීමට තීරණය විය.

මෙහිදී විශ්වවිද්‍යාල පද්ධතිය තුළ වර්තමානයේදී පවතින පොදු ගැටළු පිළිබඳව හා එක් එක් විශ්වවිද්‍යාලයට සුවිශේෂ වූ ගැටළු මෙන්ම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මඟින් ලබා දෙන ලද නියෝග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳව පරීක්ෂා කර ඉන් පැන නැගුණු නිරීක්ෂණ මෙම විශේෂ වාර්තාවේ ඇතුළත් වේ.

එහිදී හඳුනාගන්නා ලද පොදු කරුණු යටතේ පහත සඳහන් ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත.

(i) විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව පහළ යාම,
(ii) දේශීය හා විදේශීය සිසුන් විශ්වවිද්‍යාලයට ඇතුළත් කර ගැනීමෙන් පසුව ඇතිවන පුරප්පාඩු සම්පූර්ණ නොකිරීම,
(iii) විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කර ගැනීම සඳහා යෝග්‍යතා පරීක්ෂණ පැවැත්වීම,
(iv) විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපනය සම්බන්ධ කාර්යසාධන මට්ටම,

(v) කාර්යමණ්ඩලය විසින් එළඹෙන බැඳුම්කර ගිවිසුම් කඩකිරීම හා එම කඩකිරීම නිසා රජයට අයවිය යුතු මුදල් අයකර ගැනීමට අවශ්‍ය පියවර නොගැනීම,

(vi) බාහිර උපාධි පාඨමාලා අදාළ කාලපරිච්ඡේදය තුළ දී අවසන් කිරීමට පියවර නොගැනීම,

(vii) රාජ්‍ය මූල්‍ය ප්‍රතිපාදන හා අනෙකුත් ඉපැයීම්වලින් ජනිතවන අරමුදල් උපයෝජනය,

(viii) ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ හා ආචාර්යවරුන්ගේ පර්යේෂණ කෘති රටේ යහපත සඳහා යොදා ගැනීමේ ප්‍රගතිය,

(ix) සියළු රාජ්‍ය විශ්වවිද්‍යාල හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ගිණුම්කරණ ක්‍රියාවලියේදී පොදුවේ පිළිගත් ගිණුම්කරණ ක්‍රමවේදයක් අනුගමනය නොකිරීම

ඒ අනුව මෙම වාර්තාව මඟින් විශ්වවිද්‍යාල ක්ෂේත්‍රය රටේ ඉදිරි ගමනට ඇති වැදගත්කම සැලකිල්ලට ගෙන විශ්වවිද්‍යාල හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නියාමනය වන සියළුම අධ්‍යාපන ආයතන හා එහි පරිපාලන ව්‍යුහය ඇතුළත් පසුබිම් තොරතුරු මෙම වාර්තාවේ මූලිකව සඳහන් කර ඇති අතර තෝරා ගත් විශේෂ ක්ෂේත්‍රයන්ගේ සමස්ත කාර්යසාධන මට්ටම පිළිබඳ මෙහිදී සාකච්ඡා කර ඇත.

## 2. වාර්තාවේ ස්වභාවය හා පසුබිම

### 2.1 වාර්තාවේ ස්වභාවය

නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතිය සතු විශ්වවිද්‍යාල සියල්ල වෙන වෙනම කාරක සභාව ඉදිරියට කැඳවා එම විශ්වවිද්‍යාලයන්හි පවත්නා ගැටළු පිළිබඳ සාකච්ඡා කිරීමට 2017 අගෝස්තු 09 වන දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත කැඳවන ලද අතර මෙහිදි හඳුනාගත් ගැටළු විසඳීමට හා අනෙකුත් පොදු නිරීක්ෂණ හා ඒවා විසඳීමට ගත යුතු ක්‍රියාමාර්ග ඇතුළත් විශේෂ වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේ වැදගත්කම සැලකිල්ලට ගෙන පොදු ව්‍යාපාර කාරක සභාවේ උපදෙස් මත මෙම වාර්තාව සකස් කරන ලදී.

### 2.2 වාර්තාවේ පසුබිම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පාලනය වන සියළුම විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවල පොදු අඩුපාඩු ඇතුළු විගණන නිරීක්ෂණ ඇතුළත් වාර්තා විටින් විට පාර්ලිමේන්තුවේ සභාගත කර ඇති අතර එහිදී සාකච්ඡා කළ කරුණු හා කාරක සභා නියෝග ක්‍රියාත්මකවීම හා අනෙකුත් පොදු කරුණුවල වර්තමාන තත්ත්වය මෙහිදී විස්තර කර ඇත. ඊට අමතරව ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ක්ෂේත්‍රය හා අනෙකුත් උසස් අධ්‍යාපන ආයතන පාලනය වන අණපනත් හා රෙගුලාසි මෙන්ම සියළුම ආයතනවල ව්‍යුහය, ක්‍රියාවලිය හා ඒවායේ විවිධ අඩුපාඩු මෙහිදී සැකෙවින් සාකච්ඡා කර ඇත.

### 2.2.1 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවක් සහ විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලයක් පිහිටුවීම පිණිස ද, මණ්ඩප සහ පීඨ සහිත විශ්වවිද්‍යාල ද, වෙනත් උසස් අධ්‍යාපන ආයතන පිහිටුවීම, පවත්වාගෙන යාම සහ පරිපාලනය කිරීම සඳහා සහ ඊට සම්බන්ධ වූ හෝ ආනුෂංගික වූ කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

#### 2.2.1.1 විශ්වවිද්‍යාල පාලක සභාවේ සංයුතිය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 44 වගන්තිය සංශෝධනයට ලක්කර ඇති 1985 අංක 07 දරන විශ්වවිද්‍යාල (සංශෝධන) පනතේ 24 වගන්තිය ප්‍රකාරව පාලක සභාව පහත තැනැත්තන්ගෙන් සමන්විත වේ.

(i) උප කුලපතිවරයා ;

(ii) නියෝජ්‍ය උප කුලපතිවරයෙක් සිටි නම්, ඔහු ;

(iii) මණ්ඩපාධිපතිවරයෙක් සිටී නම්, ඔහු ;

(iv) පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ පීඨාධිපතිවරයෙක් සිටී නම්, ඔහු

(v) එක් එක් පීඨයේ පීඨාධිපතිවරයා ;

(vi) ස්වකීය සාමාජිකයන් අතුරෙන් සනාතන සභාව විසින් තෝරා ගනු ලැබූ සාමාජිකයන් දෙදෙනෙක්, සහ

(vii) ඉහත සඳහන් (i) වන, (ii) වන, (iii) වන, (iv) වන, (v) වන, (vi) වන ඡේද යටතේ මුළු සමාජික සංඛ්‍යාවට එකක් එකතු කළ සංඛ්‍යාවට සමාන සාමාජික සංඛ්‍යාවක්, ඒ සාමාජිකයන් සියළුදෙනාම අධ්‍යාපන, වෘත්තීය, වාණිජ කාර්මික විද්‍යාත්මක හෝ පරිපාලන ක්ෂේත්‍රයන්හි විශිෂ්ඨ සේවාවක් ඉටුකර ඇති තැනැත්තන් අතුරෙන් කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය යුතුය.

**2.2.1.2 විශ්වවිද්‍යාල සනාතන සභාවේ සංයුතිය**

1985 අංක 07 දරන විශ්වවිද්‍යාල (සංශෝධන) පනතේ 26 වගන්ති ප්‍රකාරව සනාතන සභාව පහත තැනැත්තන්ගෙන් සමන්විතවේ.

(i) උප කුලපතිවරයා ;

(ii) නියෝජ්‍ය උප කුලපතිවරයෙක් සිටී නම්, ඒ නියෝජ්‍ය උපකුලපතිවරයා;

(iii) මණ්ඩප වෙතොත්, ඒ එක් එක් මණ්ඩපයේ මණ්ඩපාධිපතිවරයා ;

(iv) විශ්වවිද්‍යාලයට අනුබද්ධ ආයතන හෝ උසස් අධ්‍යාපන මධ්‍යස්ථාන වෙතොත්, ඒ එක් එක් ආයතනයේ හෝ උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයා ;

(v) පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ පීඨාධිපතිවරයෙක් සිටී නම්, ඔහු ;

(vi) එක් එක් පීඨයේ පීඨාධිපතිවරයා ;

(vii) එක් එක් අධ්‍යයන අංශයේ ප්‍රධානියා ;

(viii) විශ්වවිද්‍යාලයේ සෑම ස්ථිර මහාචාර්යවරයෙක් ම ;

(ix) පුස්තකාලයාධිකාරීවරයා ; සහ

(x) එක් එක් පීඨයේ ස්ථිර ආචාර්යවරයන් විසින් තමන් අතුරෙන් තෝරා පත් කර ගන්නා මේ උපවගන්තියේ ඉහතින්ම වූ ඡේදවල සඳහන් ආචාර්යවරයන් නොවන ආචාර්යවරයන් දෙදෙනෙක්.

**2.2.1.3 විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවා ඇති රාජ්‍ය විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන**

**2.2.1.3.1 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවා ඇති අතර රාජ්‍ය විශ්වවිද්‍යාල පළාත් අනුව විහිදී ඇති ආකාරය පහත පරිදි වේ.**

| | පළාත | | විශ්වවිද්‍යාලය |
|---|---|---|---|
| (අ) | බස්නාහිර පළාත | **(i)** | කොළඹ විශ්වවිද්‍යාලය |
| | | **(ii)** | කැලණිය විශ්වවිද්‍යාලය |
| | | **(iii)** | මොරටුව විශ්වවිද්‍යාලය |
| | | **(iv)** | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| | | **(v)** | සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය |
| | | **(vi)** | ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |
| (ආ) | මධ්‍යම පළාත | **(vii)** | පේරාදෙණිය විශ්වවිද්‍යාලය |
| (ඇ) | උතුරු පළාත | **(viii)** | යාපනය විශ්වවිද්‍යාලය |

| | | | |
|---|---|---|---|
| (ඇ) | දකුණු පළාත | **(ix)** | රුහුණ විශ්වවිද්‍යාලය |
| (ඉ) | නැගෙනහිර පළාත | **(x)** | ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය |
| | | **(xi)** | ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය |
| (ඊ) | උතුරුමැද පළාත | **(xii)** | ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය |
| (උ) | සබරගමු පළාත | **(xiii)** | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය |
| (ඌ) | වයඹ පළාත | **(xiv)** | ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය |
| (එ) | ඌව පළාත | **(xv)** | ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය |

**2.2.1.3.2 විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවා ඇති පශ්චාත් උපාධි ආයතන**

(i) වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

(ii) කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

(iii) පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය

(iv) පුරා විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

(v) කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය

(vi) විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

(vii) ඉංග්‍රීසි පශ්චාත් උපාධි ආයතනය

(viii) මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

(ix) දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

**2.2.1.3.3 විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවා ඇති උසස් අධ්‍යාපන ආයතන**

(i) දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය

(ii) මානව සම්පත් අභිවර්ධන ආයතනය

(iii) කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක විද්‍යායතනය

(iv) ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය

(v) ජාතික පුස්ථකාල හා විඥාපන විද්‍යා ආයතනය

(vi) තොරතුරු තාක්ෂණ ආයතනය - මොරටුව විශ්වවිද්‍යාලය

(vii) ජෛව රසායන අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනය

(viii) මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය

(ix) සෞන්දර්ය අධ්‍යයනය පිළිබඳ ස්වාමි විපුලානන්ද ආයතනය

(x) කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා සඳහා වන අධ්‍යාපන ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය

**2.2.1.3.4 විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවා ඇති මණ්ඩප**

(i) ශ්‍රීපාලි මණ්ඩපය - කොළඹ විශ්වවිද්‍යාලය

(ii) වව්නියා මණ්ඩපය - යාපනය විශ්වවිද්‍යාලය

(iii) ත්‍රිකුණාමලය මණ්ඩපය - නැගෙනහිර විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

**2.2.2 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ස්ථාපිත කිරීම.**

ශ්‍රී ලංකා රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියේ නියාමන ආයතනය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වන අතර (UGC) එය 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ (ඇමුණුම 01) 1978 දෙසැම්බර් මස 22 දින ස්ථාපිත කරන ලදී. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සංශෝධනයට ලක්කළ 1985 අංක 07 දරන විශ්වවිද්‍යාල පනතේ 8 වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව සභාපතිවරයෙක්, උප සභාපතිවරයෙක් සහ වෙනත් සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත වන අතර ඔවුන් සියළුදෙනා ජනාධිපතිවරයා විසින් පත්කරනු ලැබේ.

විශ්වවිද්‍යාල පනත යටතේ ස්ථාපිත රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතන අතරට විශ්වවිද්‍යාල 15 ක්, පශ්චාත් උපාධි ආයතන 09 ක්, උසස් අධ්‍යාපන ආයතන 10 ක් සහ මණ්ඩප 03 ක් ස්ථාපිත කර ඇත. පාලක සභාව එක් එක් විශ්වවිද්‍යාලයේ පාලන අධිකාරිය වන අතර සනාතන සභාව අධ්‍යයන කටයුතු සම්බන්ධ උත්තරීතර සභාව වේ. විශ්වවිද්‍යාලයක සහ ආයතනයක ප්‍රධාන විධායක නිලධාරීන් අනුපිළිවෙළින් උපකුලපති හා අධ්‍යක්ෂ වේ.

**2.2.2.1 කොමිෂන් සභාවේ දැක්ම හා මෙහෙවර**

2020 වන විට ශ්‍රී ලංකාව කලාපය තුළ දැනුමේ කේන්ද්‍රස්ථානයක් බවට සහ ආසියාව තුළ උසස් අධ්‍යාපනයෙහි නියමවකු බවට පත් කරලීම කොමිෂන් සභාවේ දැක්ම වන අතර ජාතික සංවර්ධනය හා සමගාමීව, ගුණාත්මක ඉගැන්වීම් ඉගෙනුම්, ඉහළ ප්‍රතිඵලදායී පර්යේෂණ, නවෝත්පාදන ව්‍යවසාය, නිර්මාණාත්මක ප්‍රජා දායකත්වය, සාමය හා සමඟිය සහ ක්‍රමෝපායික ජාත්‍යන්තර සහයෝගය සඳහා කැපවූ තිරසාර, පුළුල් ලෙස පිළිගනු ලබන, ප්‍රවේශය උසස් අධ්‍යාපන පද්ධතියක් සඳහා යහපාලනය සහ කළමනාකාරිත්වය තුළින් මඟ පෙන්වීමට, ස්ථාපනය කිරීමට සහ සංවර්ධනය කිරීම. යන කරුණු එහි මෙහෙවර ප්‍රකාශයේ සඳහන් කර ඇත.

#### 2.2.2.2 කොමිෂන් සභාවේ සංවිධාන ව්‍යුහය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා පනතේ සංවිධාන ව්‍යුහය තුළ එය ස්ථාවර කමිටුවක් මගින් පාලනය වන අතර ඒ යටතේ සභාපති, උපසභාපති හා ලේකම් කාර්යාලයක් මගින් පාලනය වේ. ඒ යටතේ උපදෙපාර්තමේන්තු 05 ක් හා තත්ත්ව පාලන ඒකකයක් ඇතුළත් සංවිධාන ව්‍යුහයක් සැකසී ඇත. විස්තර ඇමුණුම් අංක 02 හි දැක්වේ.

#### 2.2.2.3 කොමිෂන් සභාවේ අරමුණු හා කාර්යයභාරය

- ජාතික ප්‍රතිපත්තිය හා අනුකූලව විශ්වවිද්‍යාල අධ්‍යාපනය සැලසුම් කිරීම හා සම්බන්ධීකරණය කිරීම
- විශ්වවිද්‍යාල අධ්‍යාපනය හා අදාළව පාර්ලිමේන්තුව මඟින් වෙන් කරන ලද අරමුදල් උසස් අධ්‍යාපන ආයතන අතර බෙදාදීම, සහ එවැනි එක් එක් උසස් අධ්‍යාපන ආයතන මඟින් සිදුකරන වියදම් පාලනය කිරීම
- උසස් අධ්‍යාපන ආයතනයන්හි අධ්‍යයන ප්‍රමිතීන් පවත්වා ගැනීම
- උසස් අධ්‍යාපන ආයතනයන්හි පරිපාලනය නියාමනය කිරීම
- එක් එක් උසස් අධියාපනය සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම නියාමනය කිරීම, සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත මඟින් හෝ යටතේ කොමිෂන් සභාව වෙත පැවරූ, ආරෝපිත හෝ වෙන් කරන ලද එවැනි බලතල, රාජකාරි සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සහ ඉටුකිරීම.

### 2.2.3 අනෙකුත් රෙගුලාසි හා ක්‍රමවේදයන්

මෙම ක්ෂේත්‍රයට අදාළ ආයතන හා වෙනත් පරිපාලනමය කටයුතු කරගෙන යාමට පදනම් වූ නෛතික පරිසරය තුළ පනතේ සඳහන් විධිවිධානවලට අමතරව  පහත සඳහන් ප්‍රතිපාදන අදාළ කර ගනු ලැබේ.

#### 2.2.3.1 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා ආයතන සංග්‍රහය

#### 2.2.3.2 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව නිකුත් කරන ලද චක්‍රලේඛ

#### 2.2.3.3 විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොත 2017/2018

### 2.2.4 උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මකවන විශ්වවිද්‍යාල

පහත සඳහන් විශ්වවිද්‍යාල උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ.

#### 2.2.4.1 ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

##### 2.2.4.1.1 බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය පිහිටුවීමේ අරමුණු

- ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි බුද්ධාගම පතුරුවාලීම හා ධර්මදූත කටයුතු පෝෂණය කිරීම සඳහා බෞද්ධ ධර්මය සහ විනය පිළිබඳ ශාස්ත්‍රධරයන් පුහුණු කිරීම.
- ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි පාලි භාෂාව, බෞද්ධ සංස්කෘතිය සහ බෞද්ධ දර්ශනය හැදෑරීම ප්‍රවර්ධනය කිරීම සහ වර්තමාන ලෝක තත්ත්වයන්ට ගැලපෙන පරිදි එම අධ්‍යයන නංවාලීම.
- පිරිවෙන්, පාසල් සහ ඒ හා සමාන ආයතනවල බුද්ධාගම හා පාලි භාෂාව ඉගැන්වීම සඳහා ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා සහ ගිහි පිරිමි ශිෂ්‍යයන් පුහුණු කිරීම.
- ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා සහ සියලුම ගිහි පිරිමි ශිෂ්‍යයන් අතර ආචාර ධර්මානුකූල පැවැත්ම හා මානසික ශික්ෂණය පවත්වාගෙන යාම සහ ඒවා වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.
- ඉහත සඳහන් කාරණා කිසිවක් සම්බන්ධ හෝ ආනුෂංගික වෙනත් යම් කාරණා

##### 2.2.4.1.2 බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ සංවිධාන ව්‍යුහය

පිළිවෙළින් මහෝපාධ්‍යානන් වහන්සේ, ලේඛකාධිකරි, මූල්‍යාධිකාරි, නියෝජ්‍ය ලේඛකාධිකාරි හා ඒ යටතේ පිහිටුවා ඇති ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි, වැඩ ඉංජිනේරු හා ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරි වශයෙන් ප්‍රධාන අංශ 03 ක් යටතේ එහි සංවිධාන ව්‍යුහය සැකසී ඇත.

### 2.2.4.1.3 බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ නියෝජනය

පාලක සභාව මහෝපාධ්‍යානන් වහන්සේ හා පීඨ නියෝජිතයින් දෙදෙනෙකුගෙන් සමන්විත වන අතර පීඨ නියෝජිතයින් ලෙස බෞද්ධ අධ්‍යයන පීඨාධිපති හා භාෂා අධ්‍යයන පීඨාධිපති පත් කරනු ලබයි.

**(i)** <u>සනාතන සභා නියෝජනය</u>

පිළිවෙළින් මහෝපාධ්‍යානන් වහන්සේ, ඒ ඒ පීඨයේ පීඨාධිපතිවරු, එක් එක් අධ්‍යයන අංශ ප්‍රධානීහු, පුස්තකාලයාධිකාරි, පීඨ නියෝජිත, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, පත්කරන ලද සමාජිකයින් 10 දෙදෙනෙකුගෙන් හා සනාතන සභා ලේකම්ගෙන් සමන්විත වේ.

### 2.2.4.2 ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය

### 2.2.4.2.1 විශ්වවිද්‍යාලය පිහිටුවීමේ අරමුණු

- බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම්වලට අනුකූලව ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා පුහුණු කිරීම.
- විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා අතර බෞද්ධ භාවනාව පිළිබඳ පුහුණුව සහ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම.
- ථේරවාදී බුද්ධ ධර්මය ශ්‍රී ලංකාවේ හා විදේශීය රටවල ප්‍රචාරය කිරීමට ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා පුහුණු කිරීම.
- බුද්ධ ධර්මය හැදෑරීමට සහ ඒ පිළිබඳව පර්යේෂණ කිරීම ධෛර්ය දීම.
- බෞද්ධ සංස්කෘතිය සහ එහි අගයයන් ප්‍රවර්ධනය කිරීම සහ
- ඉහත සඳහන් පරමාර්ථවලට සම්බන්ධ හෝ අනුෂාංගික වෙනත් කවර වුවද දෙයක් කිරීම.

### 2.2.4.2.2 විශ්වවිද්‍යාලයේ සංවිධාන ව්‍යුහය

උත්තරීතර සභාවේ මූලිකත්වයෙන් මහා මහෝපාධ්‍යානන් වහනේස් යටතේ පාලනය වන පාලක සභාව හා සනාතන සභාව යටතේ ක්‍රියාත්මක වන අතර ප්‍රධාන වශයෙන් අධ්‍යයන හා අනධ්‍යයන වශයෙන් වූ අංශ 2ක් ඇතුළත් ඒ යටතේ ඇති උපඒකක සමගින් මෙහි සංවිධාන ව්‍යුහය සැකසී ඇත. මෙය ඇමුණුම 03 හි දැක්වේ.

#### 2.2.4.2.3 පාලක සභාවේ නියෝජනය

මෙහිදී පාලක සභාව නියෝජනය වන්නේ පීඨාධිපති දෙදෙනෙක් අංශ ප්‍රධානි දෙදෙනෙක් බුද්ධ ශාසන විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් හෝ නම් කරන ලද අයෙකු වශයෙනි. මෙහිදී අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන සාමාජිකයින් අතර බුද්ධ ශාසනයට උසස් සේවාවක් කර ඇති නීති හා පරිපාලන යන ක්ෂේත්‍රවල පළපුරුද්දක් ඇති භික්ෂූන් 05 ක් වශයෙන් ඇතුළත් වේ.

## 2.2.5 විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවල කාර්යභාර්ය හා අදාළවන පොදු කරුණු

### 2.2.5.1 රාජ්‍ය විශ්වවිද්‍යාල සඳහා ප්‍රවේශ ප්‍රතිපත්තිය (ඇමුණුම 04)

2012 ජනවාරි 16 දිනැති අංක අමප/12/0111/521/004 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයට (ඇමුණුම 05) 2012 පෙබරවාරි 01 දින පැවැත්වුනු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ලබාදී තිබූ අනුමැතිය මත පහත ප්‍රවේශ ප්‍රතිපත්තිය අනුව මේ වනවිට රාජ්‍ය විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කිරීම සිදු කෙරේ.

**(අ)** බඳවා ගනු ලබන විෂය ධාරාවන් අනුව ප්‍රවේශ ප්‍රතිපත්ති වෙනස් වේ. මෙහිදී කලා විෂය ධාරාව සඳහා ප්‍රවේශවීමට අපේක්ෂා කරන සිසුන් අදාළ පාඨමාලා සඳහා තෝරාගැනීම ප්‍රධාන වශයෙන් දීප ව්‍යාප්ත කුසලතා පදනම මත පමණක් සිදුකෙරේ.

**(ආ)** අනෙකුත් අධ්‍යයන පාඨමාලාවන් සඳහා ඇති මුළු ස්ථාන සංඛ්‍යාවෙන් සියයට 40 ක් දක්වා දීප ව්‍යාප්ත කුසලතා පදනම මත පෙළගැසූ ඉසෙඩ් ලකුණු අනුව තෝරාගැනීම සිදුකෙරේ.

**(ඇ)** ඉතිරි සියයට 60 න් සියයට 55 ක් දක්වා දිස්ත්‍රික් කුසලතා පදනම මත සිසුන් තෝරා ගැනේ. ඒ අනුව එක් එක් පාඨමාලාවෙහි ඇති ස්ථාන සංඛ්‍යාවෙන් සියයට 55 ක් දක්වා, පරිපාලන දිස්ත්‍රික්ක 25 අතර එක් එක් දිස්ත්‍රික්කයේ ජනගහනයට සමානුපාතිකව එනම්, ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයේ ඒ ඒ දිස්ත්‍රික්කයේ ජනසංඛ්‍යා අනුපාතය අනුව බෙදාහැරේ.

**(ඈ)** මීට අමතරව බස්නාහිර පළාත හැර අනෙකුත් පළාත් 08 නියෝජනය කරන අධ්‍යාපන පහසුකම් අතින් දුෂ්කරයැයි හඳුනාගෙන ඇති දිස්ත්‍රික්ක 16 අතර ඉතිරි සියයට 5 බෙදාදෙනු ලැබේ. මෙහිදී එම ස්ථාන සංඛ්‍යාව දිස්ත්‍රික් 16 හි මුළු ජනගහනයෙන් ඒ ඒ දිස්ත්‍රික්කයේ ජන සංඛ්‍යාව අනුපාතය අනුව බෙදාවෙන් කරනු ලැබේ.

### 2.2.5.2 විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සිසුන් ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය

මේ සම්බන්ධව පහත ක්‍රියාවලිය අනුගමනය කරනු ලැබේ.

**(අ)** සෑම වර්ෂයකම අ.පො.ස. (උ.පෙළ) ප්‍රතිඵල නිකුත්වීමෙන් අනතුරුව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ සිසුන්ගෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අයදුම්පත් කැඳවනු ලබයි. මෙහිදී විශ්වවිද්‍යාල සඳහා ඇතුළත් කර ගන්නා පාඨමාලා හා ලියාපදිංචිවීමේ උපදෙස් ඇතුළත් ප්‍රවේශ අත්පොත වාර්ෂිකව මුද්‍රණය කොට විශ්වවිද්‍යාල ප්‍රවේශය බලාපොරොත්තුවෙන් සිටින අයදුම්කරුවන් වෙත නිකුත් කරනු ලැබේ.

**(ආ)** මේ අනුව ප්‍රවේශ අත්පොතේ දැක්වෙන උපදෙස් අනුගමනය කරමින් මේ වනවිට විශ්වවිද්‍යාල සඳහා අන්තර්ජාලය හරහා අයදුම්පත් යොමු කිරීම අනිවාර්යය අවශ්‍යතාවයක් බවට පත්කර ඇත.

**(ඇ)** එක් එක් අධ්‍යයන වර්ෂයට අදාළ කඩඉම් ලකුණු නිකුත් කළ පසු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ දැනුම්දීම මත අන්තර්ජාලය භාවිතා කර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වෙබ් අඩවිය හරහා සිසුන් තේරී පත් වූ විශ්වවිද්‍යාලවල/ උසස් අධ්‍යාපන ආයතනවල අදාළ පාඨමාලා සඳහා ලියාපදිංචි විය යුතුය.

**(ඈ)** පසුගිය වර්ෂ 04 ක් සඳහා රාජ්‍ය විශ්වවිද්‍යාලවල සිසුන් ඇතුළත් කර ගැනීම සම්බන්ධ තොරතුරු පහත පරිදි විය. ඒ අනුව අවසන් වශයෙන් එම කාලපරිච්ඡේදය අනුව විශ්වවිද්‍යාලවලට තෝරා ගනු ලබන සිසුන්ගේ ප්‍රතිශතය පිළිබඳ විස්තර පහත වගුවේ දැක්වේ.

| | 2013/2014 | 2014/2015 | 2015/2016 | 2016/2017 | 2017/2018 |
|---|---|---|---|---|---|
| විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා අයදුම් කළ ශිෂ්‍ය සංඛ්‍යාව | 55,991 | 58,176 | 68,299 | 71,106 | 78,894 |
| විශ්වවිද්‍යාලයට ඇතුළත් කර ගැනීමට තෝරාගත් ශිෂ්‍ය සංඛ්‍යාව | 25,200 | 25,676 | 29,110 | 30,668 | 30,550 |
| විශ්වවිද්‍යාල අධ්‍යාපනයට අයදුම් කළ ශිෂ්‍ය සංඛ්‍යාවෙන් විශ්වවිද්‍යාලයට තෝරාගත් ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස | 45 | 43.7 | 42.6 | 43.1 | 38.7 |

විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා අයදුම් කළ ශිෂ්‍ය සංඛ්‍යාව හා තෝරා ගත් ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස 2013/2014 වර්ෂයේ සිට 2017/2018 දක්වා වර්ෂ 05 ක කාලයක් තුළ සියයට 45 සිට සියයට 38.7 දක්වා අඩුවන ප්‍රවණතාවක් තිබුණි.

### 2.2.5.3 දේශීය රාජ්‍ය විශ්වවිද්‍යාලවලට විදේශ සිසුන් ඇතුළත් කර ගැනීමේ ක්‍රමවේදය

සෑම පාඨමාලාවකම පවත්නා ස්ථානවලින් සියයට 0.5 ක ප්‍රමාණයක් දක්වා (එකඟ වූ සංඛ්‍යාවට යටත්ව) විදේශීය සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික හා විදේශීය සිසුන් සඳහා වෙන් කර ඇත. ඒ අනුව, ශ්‍රී ලංකාවෙන් පිටත විදේශ රටකදී ශ්‍රී ලංකාවේ අ.පො.ස. (උසස් පෙළ) විභාගයට හෝ ලන්ඩන් විශ්වවිද්‍යාලය මඟින් පවත්වන අ.පො.ස. (උසස් පෙළ) විභාගයට හෝ සමාන විදේශීය සුදුසුකම්ලත් සිසුන්ට සහ තමන් අධ්‍යාපනය ලැබූ විදේශ රටෙහි විශ්වවිද්‍යාලයකට ඇතුළත්වීමට අවශ්‍ය සුදුසුකම්වලට සමාන සුදුසුකම් ලැබූවන්ට මේ සඳහා අයදුම් කළ හැකි වේ.

පහත සඳහන් ප්‍රමුඛතා අනුපිළිවෙළ අනුව සිසුන් තෝරා ගනු ලැබේ.

**(i)** අයදුම්කිරීම සඳහා සුදුසුකම් ලැබූ විභාගයට ආසන්නතම වසර හයක කාලය තුළ අවම වශයෙන් අධ්‍යයන වසර තුනක් විදේශ අධ්‍යාපනය ලබා ඇති විදේශීය රටවල දැනට සේවය කරන හෝ සේවය කර ඇති ශ්‍රී ලාංකික තානාපති නිලධාරීන්ගේ දරුවන්

**(ii)** ශ්‍රී ලංකාවේ සිටින විදේශීය තානාපති සේවා නිලධාරීන්ගේ දරුවන්

**(iii)** සාක් සංවිධානයේ සාමාජික රටවල සිසුන්

**(iv)** ඉහත (අ) යටතේ ආවරණය නොවන අවම වශයෙන් සුදුසුකම් ලැබූ විභාගයට ආසන්නතම අධ්‍යයන වර්ෂ තුනක කාලය විදේශීය රටක අධ්‍යාපනය ලබා ඇති ශ්‍රී ලාංකික සිසුන්

**(v)** ඉහත (ආ) සහ (ඇ) යටතේ ආවරණය නොවන අනෙකුත් විදේශීය සිසුන්

### 2.2.6 විශ්වවිද්‍යාල කාර්යමණ්ඩලය විසින් එළඹෙන බැඳුම්කර ගිවිසුම්

උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ පරිච්ඡේද 5 අංක 07 අනුව හා 2018 දෙසැම්බර් 17 දිනැති අංක 02/2018 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ ප්‍රකාරව (ඇමුණුම 06) විශ්වවිද්‍යාල අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලවල නිලධාරීන් සප්ත වාර්ෂික නිවාඩු ලබා වෙනත් ආයතනයක සේවයේ යෙදීමේදී හෝ අධ්‍යයන නිවාඩු ලබා විදේශ ගතවීමේදී නියමිත කාලය අවසානයේදී නැවත සේවයට පැමිණෙන බවට බැඳුම්කර ගිවිසුමකට එළඹිය යුතුය.

### 2.2.7 බාහිර උපාධි පාඨමාලා (ස්වයං මූල්‍ය පාඨමාලා)

මේ සම්බන්ධව පහත ප්‍රතිපාදන සලසා ඇත.

#### 2.2.7.1 විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන

**(අ)** 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 29(ඊ) වගන්තිය ප්‍රකාරව (ඇමුණුම 07) විශ්වවිද්‍යාලයක හෝ යම් පිළිගත් ආයතනයක ශිෂ්‍යයන් නොවන තැනැත්තන්ට "විශ්වවිද්‍යාල උපාධි" අභිඥාණ පත්‍ර හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ලබාගත හැකි වන පරිදි කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව බාහිර විභාග පැවැත්වීම සඳහා බලතල ලබාදී ඇත.

**(ආ)** 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 15 (v) වගන්තිය (ඇමුණුම 08) ප්‍රකාරව එක් එක් උසස් අධ්‍යාපන ආයතනයෙහි පැවැත්විය යුතු පාඨමාලා ද ප්‍රදානය කළයුතු උපාධි, අභිඥාන පත්‍ර හා වෙනත් ශාස්ත්‍රිය විශිෂ්ඨතා ද ඒ එක් එක් උසස් අධ්‍යාපන ආයතනයේ පාලක බල මණ්ඩලය විමසීමෙන් පසු නිශ්වය කිරීම සිදුකෙරේ.

#### 2.2.7.2 බාහිර උපාධි පාඨමාලා පැවැත්වීම

බාහිර උපාධි පාඨමාලා අනුව පසුගිය කාලපරිච්ඡේදයේ රාජ්‍ය විශ්වවිද්‍යාල 13 ක් මඟින් පවත්වා තිබූ බාහිර උපාධි පාඨමාලා සංඛ්‍යාව 33ක් විය. විස්තර ඇමුණුම් 09 හි දැක්වේ.

#### 2.2.7.3 බාහිර උපාධි පාඨමාලාවලට අදාළ ගෙවීම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 1/2016 ප්‍රකාරව (ඇමුණුම 10) ගෙවිය යුතු ප්‍රමාණයන් තීරණය කළ යුතු වන්නේ බාහිර උපාධි මධ්‍යස්ථාන/ ඒකකය විසින් යෝජනා කරන ලද සහ විශ්වවිද්‍යාලයේ මූල්‍ය කමිටුව සහ පාලක සභාව විසින් අනුමත කරන ලද වාර්ෂික අයවැය පදනම් කොට ගෙනය. එබැවින් අරමුණු කර ගත් දළ ආදායම සහ පොදු කාර්යය ගාස්තු, උපයෝගිතා ගාස්තු, විශ්වවිද්‍යාල පීඨය, අමාත්‍යාංශය සහ මධ්‍යස්ථාන සංවර්ධන අරමුදලට දායකත්වය පිණිස වෙන් කළ යුතු අනුගම්‍ය අඩු කිරීම් සැලකිල්ලට ගනිමින් ගෙවීම් සඳහා වූ ඉහළ සීමාවන් තීරණය කරනු ලැබේ.

### 2.2.7.4 බාහිර උපාධි පාඨමාලා ආදායම් විශ්වවිද්‍යාවල අරමුදලට බැර කිරීම.

මේ සම්බන්ධ පහත ප්‍රතිපාදන සලසා ඇත.

**(අ)** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිගේ අංක UGC/C/PS/60 හා 2000 ඔක්තොම්බර් 18 දිනැති ලිපිය ප්‍රකාරව ලබන ආදායම් විශ්වවිද්‍යාල ආදායමට බැරකළ යුතු වේ.

**(ආ)** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2016 මාර්තු 01 දිනැති අංක 04/2016 දරන චක්‍රලේඛයේ 5.1.6 වගන්ති ප්‍රකාරව (ඇමුණුම 11) විශ්වවිද්‍යාල විසින් පවත්වනු ලබන ස්වයං මූල්‍ය පාලන පාඨමාලා තුළින් උපයන ආදායමෙන් සියයට 0.01 ක ප්‍රතිශතයක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අරමුදලට බැරකළයුතු වේ.

### 2.2.8 විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන වෙනුවෙන් අන්තර්ජාල පහසුකම් සපයා ගැනීම.

විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන සඳහා අන්තර්ජාල පහසුකම් සැපයීම වෙනුවෙන් 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ඇපයෙන් සීමිත සමාගමක් ලෙස ලංකා එඩියුකේෂන් ඇන්ඩ් රිසර්ච් නෙට්වර්ක් (LEARN) සමාගම 2009 ජුනි 24 දින පිහිටුවා ඇත. (ඇමුණුම 12) මෙම සමාගමේ ආරම්භක සාමාජිකයින් ලෙස එවකට සිටි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා හා විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්ගේ එකඟතාව මත විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා අන්තර්ජාල පහසුකම් සැපයීමේ අරමුණින් මෙම සමාගම පිහිටුවා තිබුණි.

### 2.2.9 දේශකවරුන්ගේ කාර්යභාර්යය

#### 2.2.9.1 දේශන පැය පැවැත්වෙන කාලය තීරණය කිරීම.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2012 වර්ෂයේදී නිකුත් කළ විශ්වවිද්‍යාල පද්ධතියේ අධ්‍යයන කාර්යයන් සඳහා වූ සාරධර්ම පද්ධතියකට අනුව ආචාර්යවරයෙකු විසින් අධ්‍යයන වර්ෂයකදී ආවරණය කළ යුතු දේශන පැය ගණන පහත පරිදි විය.

| | පැය ගණන |
|---|---|
| අංශ ප්‍රධාන | 180 |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | 300 |
| සහාය මහාචාර්ය | 360 |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | 380 |
| කථිකාචාර්ය/ආධුනික කථිකාචාර්ය | 450 |
| උපදේශක/ I ශ්‍රේණිය | 480 |
| උපදේශක/ II ශ්‍රේණිය | 510 |

**2.2.9.2 විශ්වවිද්‍යාල මගින් කෙරෙන පර්යේෂණ**

විශ්වවිද්‍යාල විසින් සිදුකරනු ලබන පර්යේෂණවලින් එම විශ්වවිද්‍යාලවල තත්ත්වය ඉහළ නැංවෙන අතර ජාතික ආර්ථිකයටද විශාල දායකත්වයක් සපයනු ලැබේ. එබැවින් විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට පර්යේෂණාධාර ලබාදීම සඳහා රජය විසින් විශාල ප්‍රතිපාදන ප්‍රමාණයක් වාර්ෂිකව වෙන්කරනු ලැබේ.

**2.2.9.3 සප්ත වාර්ෂික හිමිකම් නියෝජනය කිරීම් කළ යුතුය.**

**සප්ත වාර්ෂික නිවාඩු හිමිකම මෙම ක්ෂේත්‍රයේ නියැලී ඇති දේශකවරුන්ගේ ප්‍රධාන හිමිකමක් වන අතර එය නියෝජනයවීම පහත පරිදි සිදු වේ.**

**(i)** වාර එකොළහක සේවයෙන් පසු එක වාරයක සප්ත වාර්ෂික නිවාඩු

**(ii)** වාර දහසයක සේවයෙන් පසු වාර දෙකක සප්ත වාර්ෂික නිවාඩු

**(iii)** වාර 21 ක සේවයෙන් පසු එක් අවුරුද්දක සප්ත වාර්ෂික නිවාඩු

මේ උපඡේදයේ කාර්ය සඳහා වාරයක සේවය යනුවෙන් අදහස් කෙරෙන්නේ ඒ වාරය තුළදී යටත් පිරිසෙයින් සති අටක පූර්ණ කාලීන සේවයයි. යම් විශේෂ අවස්ථාවකදී පාලක බල මණ්ඩලය විසින් වෙනත් ආකාරයට නිගමනය කරන්නේ නම් මිස, මේ සඳහා අනියම් නිවාඩු, වෛද්‍ය හා ප්‍රසූති නිවාඩු ගණන් නොගැනේ.

**2.2.9.4 පැමිණීම, පිටවීම සනාථ කිරීම.**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ x පරිච්ඡේදයේ 1.61 වගන්තිය සහ xx පරිච්ඡේදයේ 3(1) වගන්ති ප්‍රකාරව (ඇමුණුම - 13) අධ්‍යයන කාර්යමණ්ඩලවල සාමාජිකයින් නිවාඩු ලබාගැනීමේදී හා පැමිණීමේ හා පිටවීමේ වේලාව තහවුරු කළ යුතුවේ.

**2.2.9.5 සප්ත වාර්ෂික නිවාඩු සඳහා දීමනා ගෙවීම**

විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ II කොටසේ 36.1 වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ හා උසස් අධ්‍යාපන ආයතනවල සේවය කරන පහත කොටස්වලට අයත් කාර්ය මණ්ඩලය සම්පූර්ණ වැටුප් සහිත සප්ත වාර්ෂික නිවාඩු ලබා ගැනීමට හිමිකම් ඇත. ඒ අනුව පහත දැක්වෙන මහාචාර්යවරු ඇතුළුව අධ්‍යයන හා අනධ්‍යයන කාර්යමණ්ඩල තනතුරු 19 ක් සඳහා මේ වෙනුවෙන් හිමිකම් තිබේ.

(අ) මහාචාර්යවරු

(ආ) සහාය මහාචාර්යවරු

(ඇ) ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරු

(ඈ) 1980 මැයි 01 දිනට පෙර පත්කර හෝ උසස් කොට ඇති වෛද්‍ය සුදුසුකම් ඇති ආචාර්යවරයකු නොවන යම් කථිකාචාර්යවරයෙක්

(ඉ) අවශ්‍ය පශ්චාත් උපාධි සුදුසුකම් ලැබීමෙන් පසුව 1980 මැයි 01 දිනට පසු කථිකාචාර්ය ශ්‍රේණියට පත් කරන ලද හෝ උසස් කරන ලද යම් ආචාර්යවරයෙක්,

(ඊ) පුස්තකාලයාධිකාරි

(උ) නියෝජ්‍ය පුස්තකාලයාධිකාරි

(ඌ) ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරි

(එ) අවශ්‍ය පශ්චාත් උපාධි සුදුසුකම් ලැබුවාට පසුව පත්කරන ලද හෝ උසස් කරන ලද සහකාර පුස්තකාලාධිකාරි

(ඒ) නිලධාරින් සහ

ඉහත නිලධාරීන්ට අමතරව පහත තනතුරු උසුලන්නන් ද ආයතන සංග්‍රහය අනුව සුදුසුකම් ලබයි.

(අ) කොමිෂන් සභාවේ ලේකම්, අතිරේක ලේකම්, නියෝජ්‍ය ලේකම් සහ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්,

(ආ) කොමිෂන් සභාවේ ගණකාධිකාරි, ප්‍රධාන අභ්‍යන්තර විගණක, නියෝජ්‍ය ගණකාධිකාරි, ජ්‍යෙෂ්ඨ සහකාර ගණකාධිකාරි, සහ ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක

(ඇ) විශ්වවිද්‍යාලයක අතිරේක මූල්‍යාධිකාරි, නියෝජ්‍ය මූල්‍යාධිකාරි, සහ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරි

(ඈ) විශ්වවිද්‍යාල විද්‍යායතනයක අතිරේක ලේකම්, නියෝජ්‍ය ලේකම් සහ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්

(ඉ) විශ්වවිද්‍යාල විද්‍යායතනයක අතිරේක භාණ්ඩාගාරික, නියෝජ්ය භාණ්ඩාගාරික, සහ ජ්‍යෙෂ්ඨ සහකාර භාණ්ඩාගාරික

(ඊ) විශ්වවිද්‍යාල වෛද්‍ය නිලධාරි

(උ) ශාරීරික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යක්ෂ

(ඌ) උද්‍යාන පාලක සහ

(එ) කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබිය හැකි යම් වෙනත් තනතුරක් දරන්නෙක්

### 2.2.10 විශ්වවිද්‍යාල සඳහා සිසුන් බඳවා ගැනීමේ දී යෝගතා පරීක්ෂණ පැවැත්වීම

මේ සම්බන්ධයෙන් පහත ක්‍රමවේදයන් අනුගමනය කරනු ලැබේ.

**(අ)** විශ්වවිද්‍යාලය ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තොරතුරුවට අනුව ප්‍රථමයෙන්ම යෝග්‍යතා පරීක්ෂණයක් ආරම්භ කර ඇත්තේ 1976 වර්ෂයේ මොරටුව විශ්වවිද්‍යාලය විසින් පවත්වනු ලැබූ වාස්තු විද්‍යා පාඨමාලා සඳහාය. එසේ වුවද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2011/2012 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් තෝරා ගැනීමේදි ඔවුන්ව යෝග්‍යතා පරීක්ෂණයකින් තොරව තෝරා ගැනීමට තීරණය කර ඇත. කෙසේ වුවද සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ ගුරුවරුන් පිරිසක් එම තීරණයට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් ගොනු කරන ලදී. එම නඩුවේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව එම තීරණය ගැනීමට ප්‍රථමයෙන් ප්‍රවේශ කමිටුවෙන් විමසීමක් නොකිරීම සම්බන්ධයෙන් තාක්ෂණික ගැටළුවක් මතු වී තිබූ අතර ඒ අනුව දෙපාර්ශවයම එකඟතාවයකට පැමිණ නැවතත් යෝග්‍යතා පරීක්ෂණ පැවැත්වීමට තීරණය කර ඇත.

**(ආ)** යෝග්‍යතා පරීක්ෂණ සඳහා අධ්‍යයන පාඨමාලාවන් සඳහා තම විශ්වවිද්‍යාල අයදුම්පත්‍රයේ මනාපය දක්වා ඇති සෑම අපේක්ෂකයෙක්ම අදාළ විශ්වවිද්‍යාලය මඟින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණය ද සමත්විය යුතුය. අදාළ විශ්වවිද්‍යාලය පුවත්පත් දැන්වීමක් මඟින් යෝග්‍යතා පරීක්ෂණය සඳහා අයදුම්පත් කැඳවනු ලබන අතර සිසුන් විසින් තම අයදුම්පත් කෙලින්ම අදාළ විශ්වවිද්‍යාලය වෙත යොමු කළ යුතු වන අතර ඒ පිළිබඳ වැඩි විස්තර අදාළ විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරිගෙන් ලබා ගැනීමේ අවස්ථාව සිසුන් වෙත සලසා ඇත.

**(ඇ)** වාර්ෂිකව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ප්‍රවේශ අත්පොතෙහි දැක්වෙන මෙම යෝග්‍යතා පරීක්ෂණ පැවැත්වෙන ක්‍රමවේද හා දිනයන් ඒ ඒ විශ්වවිද්‍යාලය විසින් තීරණය කරනු ලබන අතර පවත්වනු ලැබූ යෝග්‍යතා පරීක්ෂණයේ ප්‍රතිඵල අදාළ විශ්වවිද්‍යාලය විසින් ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත දැනුම්දීමෙන් අනතුරුව එම ප්‍රතිඵල හා සිසුන් ලබා ඇති Z අගය සැලකිල්ලට ගෙන අදාළ පාඨමාලා සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම විසින් සිසුන් තෝරා ගැනීම සිදු කරනු ලබයි.

**(ඈ)** දිගින් දිගටම කටයුතු කළ ආකාරය අනුව යෝග්‍යතා පරීක්ෂණ ක්‍රියාවලිය සිදු කළ යුතු රාජ්‍ය විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන 25 විසින් මෙහෙයවනු ලැබූ පාඨමාලා 25 ක සංඛ්‍යාවක් පැවතුණි. විස්තර ඇමුණුම් 14 හි දැක්වේ.

### 2.2.11 විශ්වවිද්‍යාල සිසුන් සඳහා නේවාසිකාගාර පහසුකම්

විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවලට ඇතුළත්වන සිසුන් ඔවුන් ස්ථිරව පදිංචිය සිටින දිස්ත්‍රික්කයෙන් බැහැරව පිහිටි විශ්වවිද්‍යාලවලට උසස් අධ්‍යාපනය හැදෑරීම සඳහා ඇතුළත්වීමේදී ඔවුන්ගේ නේවාසික පහසුකම් විශ්වවිද්‍යාලය විසින් සපයා දිය යුතුව ඇත. එසේ නේවාසික පහසුකම් සපයාදීමේදී විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන සතුව ඇති නේවාසිකාගාරවලට අමතරව ඒ අවට ගොඩනැගිලි කුලී පදනම මත ලබා ගෙන අදාළ පහසුකම් ලබාදීමට කටයුතු කෙරේ.

### 2.2.12 විශ්වවිද්‍යාල අනධ්‍යයන කාර්යය මණ්ඩලය බඳවා ගැනීම

ඉහත ආයතනවල ඇතිවන පරිපාලන නොවන තනතුරුවල පුරප්පාඩු අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සකස් කරනු ලබන ලැයිස්තුවක් මගින් පිරවීමට 1996 ඔක්තොම්බර් 15 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශ අංක 107/96 මගින් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇත. (ඇමුණුම 15) ඒ අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද 1997 ජනවාරි 31 දිනැති අංක 698 දරන කොමිෂන් සභා චක්‍රලේඛය හා 2006 ජූනි 06 දිනැති අංක 876 දරන කොමිෂන් සභා චක්‍රලේඛය (ඇමුණුම 16) පදනම් කර ගෙන මේ දක්වා ආයතනවල ඇතිවන පරිපාලනමය නොවන තනතුරුවල පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදුකොට ඇත.

### 2.2.13 මූල්‍ය පාලනය

#### 2.2.13.1 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත ප්‍රකාර විශේෂ අරමුදල් ඇතිකර තිබීම

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 99 වගන්තියේ (ඈ) ඡේදය ප්‍රකාරව (ඇමුණුම 17) සියලුම උත්පාදන ආදායම් ඇතුලුව සියලුම අරමුදල් විශ්වවිද්‍යාල අරමුදලේ කොටසක් වියයුතු වේ.

#### 2.2.13.2 විශ්වවිද්‍යාල මගින් රජයේ මුදල් ස්ථාවර තැන්පතුවල යෙදවීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 වගන්තිය ප්‍රකාරව (ඇමුණුම 18) සියලුම අතිරික්ත මුදල්, මුදල් ඇමතිවරයාගේ පූර්ව අනුමැතිය මත ස්ථාවර තැන්පතු, භාණ්ඩාගාර බිල්පත්, කෙටිකාලීන තැන්පතු හෝ වෙනත් ඵලදායි ආයෝජනයක යෙදවිය යුතු වේ.

#### 2.2.13.3 මාණ්ඩලික නිලධාරීන් සඳහා සංග්‍රහ වියදම් ගෙවීම

1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව (ඇමුණුම 19) දීමනා දිරිදීමනා හා වෙනත් මූල්‍යාධාර ගෙවීමේදී අමාත්‍ය මණ්ඩලය, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හෝ භාණ්ඩාගාරය විසින් නිශ්චිතව අනුමත කරන ලද ප්‍රතිලාභ පමණක් තම පාලක මණ්ඩල අනුමැතිය ඇතිව ලබා ගත යුතු වේ.

### 2.2.14 සේවක අර්ථසාධක අරමුදල හා විශ්වවිද්‍යාල සේවක භාරකාර අරමුදල සඳහා දායක මුදල් ගණනය කිරීම

2003 ජූලි 18 දිනැති අංක පීඩී/අයි/එච්එම්/ඩීඑල්/ඒ 078 දරන අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව (ඇමුණුම 20) විශ්වවිද්‍යාල, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා ඒ යටතේ ඇති උසස් අධ්‍යාපන ආයතනවල අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට දායක මුදල් හා පාරිතෝෂිත දීමනා ගණනය කිරීමේදී අධ්‍යයන දීමනා හා මාසික හිලව් දීමනා සැලකිල්ලට නොගත යුතු බව සඳහන් වේ.

### 2.2.15 ගිණුම්කරණ ක්‍රමවේදය

රාජ්‍ය විශ්වවිද්‍යාලය විසින් ගිණුම්කරණ කටයුතු සඳහා විවිධ වූ පරිගණක මෘදුකාංග භාවිතා කරන අතරතුර තවත් විශ්වවිද්‍යාල විසින් එවැනි ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. මේ හේතුව නිසා ගිණුම්කරණ ක්‍රියාවලිය ඒකාකාරී ස්වරූපයක් පෙන්නුම් නොකෙරුණි. දැනට පරිගණක මෘදුකාංග භාවිතා කරමින් ගිණුම්කරණ ක්‍රියාවලිය ඉටුකරන විශ්වවිද්‍යාල විස්තර පහත වගුවේ දැක්වේ.

| විශ්ව විද්‍යාලය | භාවිතා කරනු ලබන මෘදුකාංගය |
|---|---|
| රුහුණු විශ්වවිද්‍යාලය | EQUAL මෘදුකාංග පද්ධතිය |
| කොළඹ, මොරටුව, යාපනය හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | ACC PAC මෘදුකාංග පද්ධතිය |
| කැලණිය විශ්වවිද්‍යාලය, සබරගමුව විශ්වවිද්‍යාලය | PACK මෘදුකාංගය පද්ධතිය |

## 2.3 මෙම විශේෂ වාර්තාවේ විෂයපථය

නියැදි පදනමින් පරීක්ෂාවට ලක්කර ඇති විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පවතින පොදු ගැටළු පිළිබඳව හා එක් එක් විශ්වවිද්‍යාලයට විශේෂ ලෙස බලපාන ලද විශේෂ ගැටළු මෙන්ම, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවලදී ලබා දෙන ලද නියෝග ක්‍රියාත්මක කිරීම ඒ පිළිබඳව වර්තමාන තත්ත්වය හා අනෙකුත් පොදු ගැටළු මෙන්ම විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන සඳහා බලපැවැත්වෙන නීති හා රෙගුලාසි, සංවිධාන ව්‍යුහය හා ක්‍රියාකාරකම් ඇතුළු සමස්ත තත්ත්වය පිළිබඳ පොදු කරුණු මෙම වාර්තාවේ පළමු පරිච්ඡේදයේ දක්වා ඇත.

## 2.4 මෙම විශේෂ වාර්තාවට අදාළ විගණන ප්‍රවේශය

විශ්වවිද්‍යාල පද්ධතියට අදාළ සියළු අණපනත් හා විටින්විට නිකුත් කරන ලද චක්‍රලේඛ, විධිවිධාන හා විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොත්වල ඇතුළත් ප්‍රතිපාදන මෙන්ම විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන සැලකිල්ලට ගන්නා ලදී. ඊට අමතරව ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතනවල මුදල් පරිපාලනය සම්බන්ධයෙන් බලපැවැත්වෙන ශ්‍රී ලංකා මුදල් රෙගුලාසි සංග්‍රහයේ හා භාණ්ඩාගාර චක්‍රලේඛවල විධිවිධාන අනුව කටයුතු කර ඇතිද යන්න පිළිබඳව අවධානය යොමු කරන ලදී.

තව ද මෙම ක්ෂේත්‍රයට අයත් ආයතනවල කාර්යසාධන සම්බන්ධ තොරතුරු අදාළ කර ගන්නා ලද අතර මෙම ක්ෂේත්‍රයට අදාළ විවිධ පාර්ශවවල අදහස් හා පැහැදිලිකිරීම් ද සැලකිල්ලට ගන්නා ලදී. ඊට අමතරව නියැදි පදනමින් තෝරා ගත් එක් එක් අංශවල තත්ත්වය නිරීක්ෂණය කර තහවුරු කර ගත් තොරතුරු මත මෙම වාර්තාවේ ඇතුළත් කරුණු පෙළ ගස්වා ඇත.

## 3. නිරීක්ෂණ

### 3.1 පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් සාකච්ඡා කළ කරුණු සම්බන්ධයෙන් ප්‍රගතිය

පසුගිය කාලපරිච්ඡේදය තුළ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම (UGC) සහ ශ්‍රී ලංකාවේ එක් එක් රාජ්‍ය විශ්වවිද්‍යාල සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද විගණකාධිපති වාර්තාවල සහ පොදු ව්‍යාපාර කාරක සභා රැස්වීම් පැවැත්වෙන අවස්ථාවල ඒ දිනයන්වලට පැවැති විශේෂිත ගැටළු සාකච්ඡාවට ලක්කර ඒ පිළිබඳව ලබාදුන් නිර්දේශ හා නියෝග ගණනාවක් පැවති අතර එම ඇතැම් නියෝග පොදුවේ විශ්වවිද්‍යාල පද්ධතියට අදාළ වූ ඒවා වූ අතර ඇතැම් නිර්දේශ හා නියෝග යම් නිශ්චිත රාජ්‍ය විශ්වවිද්‍යාල සම්බන්ධයෙන් අදාළ විය. මෙම නිර්දේශ හා නියෝග ක්‍රියාත්මකවීමේ වර්තමාන තත්ත්වය සමාලෝචනයට ලක්කර ඒවායේ වර්තමාන තත්ත්වය සැකෙවින් පහත පරිදි ඉදිරිපත් කර ඇත.

#### 3.1.1 විශ්වවිද්‍යාල පද්ධතියට අදාළව නිරීක්ෂණය වූ පොදු කරුණු

| | පොදු ව්‍යාපාර කාරක සභාව පැවැත්වූ දිනය | සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු | විශ්වවිද්‍යාලය / උසස් අධ්‍යාපන ආයතනය | කාරක සභාවේ නිර්දේශය/ නියෝගය | ගෙන ඇති ක්‍රියාමාර්ගය | වාර්තාවේ නිරීක්ෂණ සඳහා යොමුව |
|---|---|---|---|---|---|---|
| **01.** | 2017 මැයි 23 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ 20 වන පරිච්ඡේදයේ 3.1 වගන්තිය සහ x වන පරිච්ඡේදයේ 1.6.1 වගන්තියට ප්‍රකාරව අධ්‍යයන සේවකයන්ගේ පැමිණීම, පිටවීම හා නිවාඩු සනාථ කිරීම සම්බන්ධව | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | අධ්‍යයන සේවකයන්ගේ පැමිණීම, පිටවීම සහ නිවාඩු සනාථ කර ගැනීමට අදාළ ක්‍රමවේදයක් සකස් කළ යුතුවේ. | එවැනි ක්‍රමවේදයක් මේ දක්වා සකස් කර නොමැත. | 3.2.18 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **02.** | 2017 ජූලි 04<br><br>2017 සැප්තැම්බර් 22 | අධ්‍යයන කාර්යමණ්ඩල පුරප්පාඩු පිරවීමට කටයුතු නොකර බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ලබාගෙන තිබීම සම්බන්ධව හා මෙවැනි පුරප්පාඩු තත්ත්වයක් තුළ අධ්‍යයන කටයුතු කර ගන්නේ කෙසේද යන්න සාකච්ඡා කරන ලදී. | කොළඹ විශ්වවිද්‍යාලය<br><br>කැලණිය විශ්වවිද්‍යාලය | මේ සම්බන්ධ සති 06 ක් ඇතුළත වාර්තාවක් ලබාදෙන ලෙස නියෝග කිරීම. | මෙම තත්ත්වය තවදුරටත් පවතී. | |
| | 2017 නොවැම්බර් 23<br><br>2018 අප්‍රේල් 04 | | යාපනය විශ්වවිද්‍යාලය<br><br>මොරටුව විශ්වවිද්‍යාලය | - කාර්ය මණ්ඩල පුරප්පාඩු ඇතිවීමට බලපාන පොදු හේතු පිළිබඳව කාරක සභාව දැනුවත්කිරීම.<br>- වෘත්තීමය විශේෂ හැකියාවන් දක්ෂතාවන් ඇති අයගෙන් ලබා ගත හැකි සේවය පිළිබඳ ක්‍රමවේදයක් සැකසීම.<br>- එසේ ඇතුළත් කර ගන්නා ප්‍රමාණය කාර්යමණ්ඩලය තුළම තබා ගන්නවාද එසේ නොමැති නම් වෙනත් කාණ්ඩයක් (Category) යටතේ තබාගන්නේ ද යන අයිතිය විශ්වවිද්‍යාලයට ලබාදීම. | තවදුරටත් කාර්යමණ්ඩල පුරප්පාඩු පවතී. මෙහිදීආචාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම සම්බන්ධ මොරටුව විශ්වවිද්‍යාලයේ අදාළ පුරප්පාඩු පිරවීමට කටයුතු කර නැත. | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2018 මාර්තු 23 | - එම - | බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නියාමනය නොවන විශ්වවිද්‍යාලයක් බැවින් වඩා විනිවිද පෙනෙන බඳවා ගැනීමේ ක්‍රමවේදයක් සකස් කළ යුතු බවට. | අධ්‍යයන කාර්යමණ්ඩලය බඳවා ගැනීමේදී විවෘත දැන්වීම් පළකර අයදුම්පත් කැඳවා බඳවා ගැනීම් කටයුතු කිරීමට පාලක සභා අනුමැතියට යොමු කිරීමට කටයුතු කර ඇත. | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **03.** | 2017 ජූලි 04<br><br>2017 මැයි 23<br><br>2017 සැප්තැම්බර් 22<br><br>2017 නොවැම්බර් 23 | බැඳුම්කර ගිවිසුම් කඩකර ඇති ආචාර්යවරුන්ගේ අයවිය යුතුව ඇති මුදල් සම්බන්ධව සාකච්ඡා කිරීම. | කොළඹ විශ්වවිද්‍යාලය<br><br>පේරාදෙණිය විශ්වවිද්‍යාලය<br><br>කැලණිය විශ්වවිද්‍යාලය<br><br>යාපනය විශ්වවිද්‍යාලය | අදාළ හිඟ මුදල් අයකර ගැනීමට වඩා ප්‍රායෝගික ක්‍රමවේදයක් සකස් කරන ලෙස නියෝග කිරීම. | බැඳුම්කර මුදල් නැවත අයකර ගැනීමේ ක්‍රියාමාර්ග දැඩි කර ඇති බව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා පැවසුව ද එම හිඟ ශේෂ හා නැවත නැවත බැඳුම්කර ගිවිසුම් කඩකිරීම එලෙසම පවතී. | 3.2.9 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **04.** | 2017 සැප්තැම්බර් 22 | 2016 වර්ෂයේදී Lanka Education and Research Network (LEARN) සමාගම වෙතින් රු.මිලියන 43 ක මුදලක් වැයකර අන්තර්ජාල පහසුකම් ලබා ගැනීම සම්බන්ධව | කැලණිය විශ්වවිද්‍යාලය | (i) මෙම සමාගම වෙතින් මෙම සේවාව අඩු ලාභ ප්‍රතිශතයක් මත ලාභදායිව ලබා ගැනීමේ හැකියාව සොයා බලා වාර්තා කිරීම.<br><br>(ii) මෙම ආයතනයෙන් සේවය ලබා ගැනීම සම්බන්ධව ශක්‍යතා අධ්‍යයනයක් කොට ඒ පිළිබඳ කාරක සභාවට දැනුම්දීම. | පෙර ආකාරයෙන්ම සේවා සපයා ගැනීම හා ගෙවීම් කිරීම විශ්වවිද්‍යාල තුළ තවදුරටත් සිදුවෙමින් පවතී.<br><br>අදාළ කරුණු පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | 3.2.11 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **05.** | 2017 සැප්තැම්බර් 22 | රටට වැදගත් වන විශ්වවිද්‍යාල මඟින් සිදු කරන පර්යේෂණ පිළිබඳව ජනතාවට තොරතුරු ලබාදීම පිළිබඳව | කැලණිය විශ්වවිද්‍යාලය | - සියළු විශ්වවිද්‍යාලවල සිදු කෙරෙන පර්යේෂණ පිළිබඳව ගරු අමාත්‍යතුමාගේ අවධානය යොමු කොට පාර්ලිමේන්තු වාර්තාවක් ඉදිරිපත් කිරීම<br>- විශ්වවිද්‍යාල මඟින් සිදුකරන පර්යේෂණ පිළිබඳව පාසල් වැනි ආයතන මෙන්ම පාර්ලිමේන්තුවේ පරීක්ෂණ අංශයට ද දැනුවත් කිරීමට කටයුතු කිරීම. | ඊට අදාළ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 3.2.10 |
| **06.** | 2017 සැප්තැම්බර් 22 | 2011 වර්ෂයේදී ලද ඇමරිකානු ඩොලර් 50,000 ක විදේශ ප්‍රදානයන් යොදා ගෙන පාලි හා බෞද්ධ අධ්‍යයන අංශයේ විදේශ සිසුන් වෙනුවෙන් නේවාසිකාගාරයක් ඉදිනොකිරීම. | කැලණිය විශ්වවිද්‍යාලය | මෙම විගණන විමසුම නැවත පැන නොනැගීමට කටයුතු කිරීම. | 2018 වර්ෂය අවසන්විට ද අරමුදල එලෙසම පවතී. | |

### 3.1.2 එක් එක් විශ්වවිද්‍යාලයට විශේෂිත වූ අඩුපාඩු සම්බන්ධව පොදු ව්‍යාපාර කාරක සභාවේ සාකච්ඡා කරන ලද කරුණු හා ලබාදෙන ලද නිර්දේශ නියෝග හා ඒවායේ ක්‍රියාත්මකභාවය

| | පොදු ව්‍යාපාර කාරක සභාව පැවැත්වූ දිනය | සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු | විශ්වවිද්‍යාලය / උසස් අධ්‍යාපන | කාරක සභාවේ නිර්දේශය/ නියෝගය | ගෙන ඇති ක්‍රියාමාර්ගය |
|---|---|---|---|---|---|
| **01.** | 2018 අප්‍රේල් 04 | අනුමැතියෙන් තොරව සමාගම් හා ආයතන විශ්වවිද්‍යාල තුළ පවත්නා ගැනීම හා ගිවිසුම් ඇති කර ගැනීම.<br>යුනි කන්සන්ටන්සි සර්විසස් සමාගම - මොරටුව විශ්වවිද්‍යාලය | මොරටුව විශ්වවිද්‍යාලය | මෙය නීත්‍යානුකූල තත්ත්වයට පත්කිරීමට ක්‍රමවේදයක් සකස් කිරීම. | මේ වනවිට නීතිපතිගේ උපදෙස් සඳහා යොමු කර ඇත. |
| **02.** | 2018 අප්‍රේල් 04 | මොරටුව විශ්වවිද්‍යාලය හා කොඩ්ජෙන් ඉන්ටර්නැෂනල් සමාගම සමග ඇති කර ගත් ගිවිසුම | මොරටුව විශ්වවිද්‍යාලය | ගිවිසුම් සම්බන්ධ වාර්තාවක් මසක් ඇතුළත ලබාදීමට. | මේ දක්වා පොදු ව්‍යාපර කාරක සභාවට වාර්තාවක් ඉදිරිපත් කිරීමට කටයුතු සිදු කර නැත. |
| **03.** | 2018 අප්‍රේල් 04 | විශ්වවිද්‍යාලයේ ක්‍රීඩා පිටිය ඉදිකිරීම වෙනුවෙන් වර්ෂ 06 කට වැඩි කාලයක සිට ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු රු.4,435,700 ක මුදල භාණ්ඩාගාර අනුමැතියෙන් කපාහැරීම | මොරටුව විශ්වවිද්‍යාලය | කපාහැරීමට අදාළ අනුමැතිය සඳහා භාණ්ඩාගාරය වෙත යොමු කිරීම. | භාණ්ඩාගාරය වෙත යොමු කළ ද මේ දක්වා අනුමැතිය ලැබී නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 04. | 2018 අප්‍රේල් 04 | විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා ඉඩමක් මිලදී ගැනීම | මොරටුව විශ්වවිද්‍යාලය | මේ සම්බන්ධ යෝජනාව ප්‍රතිපාදන කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇති බවත්, 2018 වර්ෂයේ උසස් පෙළ විභාගයට පෙනී සිටින ශිෂ්‍යන්ගෙන් 60 දෙනෙකු 2019 වර්ෂයේ මේ සඳහා බඳවා ගැනීමට බලාපොරොත්තුවන බවට උපකුලපතිවරයා පවසා ඇත. | එසේ වුවද මේ දක්වා අදාළ ඉඩම මිලදී ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| 05. | 2017 ජූලි 04 | විශ්වවිද්‍යාල පනත මගින් ප්‍රතිපාදන සලසා නොතිබියදී සහ අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් තොරව ලෝක බැංකු ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ ආධාර මත විශ්වවිද්‍යාල කාර්යමණ්ඩලය යොදා ගනිමින් ව්‍යවහාරික විද්‍යාපීඨයේ ව්‍යාපාරික මධ්‍යස්ථානයක් ලෙස ඇපයෙන් සීමිත සමාගමක් පිහිටුවා තිබීම. | කොළඹ විශ්වවිද්‍යාලය | මෙවැනි ආයතනයක් පිහිටුවීමේ හැකියාව සොයා බලන ලෙස දැනුම්දීම. | නීතිපතිගේ උපදෙස් සඳහා යොමු කර ඇත. |
| 06. | 2017 අගෝස්තු 09 | ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාවට 2011 වර්ෂයෙන් පසු සිසුන් බඳවා ගෙන නොමැතිවීම සම්බන්ධව | සබරගමුව විශ්වවිද්‍යාලය | මෙම පාඨමාලාව නවීකරණය කොට නව ශිෂ්‍ය සංඛ්‍යාව බඳවා ගැනීමට කටයුතු කිරීම. | මේ වනවිට පාඨමාලා නවීකරණය කිරීමට ක්‍රියාමාර්ග ගෙන තිබුණ ද වන ශිෂ්‍ය සංඛ්‍යාවක් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| **07.** | 2017 අගෝස්තු 09 | 2014 වර්ෂයේ රු.123,052,693 ක් වැය කර ඉදිකර තිබූ විශ්වවිද්‍යාලයේ ක්‍රීඩා පිටියේ හා ක්‍රීඩාගාරය පැවති අඩුපාඩු පිළිබඳව සාකච්ඡා කරන ලදී. | සබරගමුව විශ්වවිද්‍යාලය | එම අඩුපාඩු සම්පූර්ණ කරන ලෙස නියෝග කිරීම. | සාකච්ඡාවට භාජනය කරන ලද අඩුපාඩු මේ දක්වා සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණි. |
| **08.** | 2017 නොවැම්බර් 17 | ප්‍රධාන සැලසුමක් **(master plan)** පිළියෙළ කිරීම වෙනුවෙන් 2007 වර්ෂයේදී එක්සත් රාජධානියේ ඉංජිනේරු ආයතනයකට රු.මිලියන 16.87 ක් ගෙවා තිබීම හා ඉන් අනතුරුව 2010 වර්ෂයේදී වෙනත් උපදේශන ආයතනයක් ලවා රු.මිලියන 7.2 ක් වැය කොට ප්‍රධාන සැලසුමක් සකසා තිබීම. | නැගෙනහිර විශ්වවිද්‍යාලය | පොදු ව්‍යාපාර කාරක සභාව තුළ මසක් ඇතුළත වාර්තාවක් ලබාදෙන ලෙස නියෝග කිරීම. | 2018 සැප්තැම්බර් 26 දින පොදු ව්‍යාපාර කාරක සභාව වෙත වාර්තාවක් යොමු කර තිබුණ ද අදාළ තොරතුරු සොයා ගත නොහැකි බව උපකුලපතිවරයා විසින් වාර්තාවේ දක්වා තිබීම. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 09. | 2018 සැප්තැම්බර් 05 | කළමණාකරණ මණ්ඩලය 2018 ජනවාරි සිට මැයි දක්වා කාලය තුල එක් වතාවක්වත් රැස්වී නොතිබීම ගැන සාකච්ඡාවිම. | පුරා විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | මේ පිළිබඳ මාසයක් තුළ කාරක සභාවට වාර්තා කිරිම. | කළමනාකරණ මණ්ඩල සංයුතිය වෙනස් කිරීමට කටුයුතු කර නොතිබූ අතර කාරක සභාව වෙත වාර්තාවක් ද ඉදිරිපත් කර නොතිබුණි. |
| 10. | 2018 සැප්තැම්බර් 05 | ආයතනයේ නියමාවලියේ 6(1)(ඇ) අනුව නිල බලයෙන් පත් වූ එක් 2017 වර්ෂයේ පවත්වා තිබූ කළමනාකරන මණ්ඩලය රැස්වීම් 08කින් එක් රැස්විමකට පමණක් සහභාගි වී තිබීම සහ කළමනාකරන මණ්ඩලයේ සංයුතිය වෙනස් කිරිම ගැන සාකච්ඡා කර තිබේද යන්න විමසීම. | පුරා විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | මේ පිළිබඳ මාසයක් තුළ කාරක සභාවට වාර්තා කිරිම. | |
| 11. | 2018 සැප්තැම්බර් 05 | විශ්වවිද්‍යාලය තුළ අධ්‍යයන මණ්ඩලයක් (Board of studies) ක්‍රියාත්මකව පවතීද යන්න විමසීම. | පුරා විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | ක්‍රියාවලිය ප්‍රකාරව සමාජ ප්‍රජා විද්‍යාව හා පාරිසරික ප්‍රජා විද්‍යාව නමින් අධ්‍යනය සභා 2ක් තිබිය යුතු වුවද ආයතනයේ ආරම්භයේ සිටම එක් අධ්‍යනය මණ්ඩලයක් ක්‍රියාත්මක වී තිබූ බව සාකච්ඡා විය. මෙයට හේතු ලෙස දෝෂ සහිත ස්ථාන හේතු වී ඇති බැවින් ඒවා නිවැරදි කළ යුතුව ඇති බැවින් මාස 02 ක් ඇතුළත අවශ්‍ය සංශෝධන කර වාර්තා කරන ලෙස නියෝග කිරිම. | අධ්‍යයන මණ්ඩල 2 ක් පත්කර තිබුණ ද පනතට අදාළ සංශෝධන මේ දක්වා සිදු කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| **12.** | 2017 ජුලි 04 | විශ්වවිද්‍යාලය මූලා කමිටුවේ නිර්දේශ මත විවිධ පීය හා දෙපාර්තමේන්තු සඳහා සංවර්ධන අරමුදල් පිහිටුවා තිබූ බවත් අරමුදල්වල 2016 වර්ෂය අවසන් වනවිට අරමුදල් 75 ක රු.119,069,777 ක් රඳවා ගෙන තිබූ අතර වියදම රු.73,754,623 ක් වීම. | කොළඹ විශ්වවිද්‍යාලය | විවිධ පීය හා දෙපාර්තමේන්තු සඳහා පිහිටුවා ඇති සංවර්ධන අරමුදල්වලට අදාළව කළයුතු වියදම් සැලසුම් කිරිමේදි පනතට පටහැනි නොවන ලෙස පනතේ වගන්ති වෙනස් කර අරමුදල් පවත්වාගෙනයාම සඳහා නීතිමය අවශ්‍යතා සලසා ගැනීමට උපදෙස් දීම. | 2018 දෙසැම්බර් 31 දින වනවිට අරමුදල් 177 ක රු.1,848,695,845 ක ශේෂයක් පැවැති අතර 2018 වර්ෂයට අදාළව දරා තිබූ වියදම අරමුදල් 52 ක් සම්බන්ධව රු.141,369,045 ක් විය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| **13.** | 2017 ජුලි 04 | උපාධි අධ්‍යයන පීඨයේ නව ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අධීක්ෂණය සම්බන්ධව උපදේශන ගිවිසුමට අදාළ නිරීක්ෂණ. | කොළඹ විශ්වවිද්‍යාලය | මෙම ගොඩනැගිල්ලේ අධීක්ෂණ කටයුතු පිටස්තර උපදේශකවරයෙකු වෙත පත්කර තිබීම හා ගෙවීම් කිරීම සම්බන්ධ වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව ගන්නා පියවර පිළිබඳ පාලක සභාව හා සාකච්ඡා කර විසඳුමකට පැමිණ ඒ බව කාරක සභාවට දැනුවත් කරන ලෙස නියෝග කිරීම. | වගකිව යුතු නිලධාරියාට එරෙහිව පියවර ගෙන නොමැත.<br>මෙම ගෙවීම අදාළ නිලධාරියා විසින්ම ඔහුගේ සාමාන්‍ය රාජකාරි කටයුතු පිළිබඳ බාහිරව පවරන ලද රාජකාරි වෙනුවෙන් කරන ලද සේවයට සිදුකරන ලද දීමනාවක් ලෙස සැලකීමට පාලක සභාව තීරණය කර ඇත. |
| **14.** | 2017 සැප්තැම්බර් 22 | පාලක සභාවේ සාමාජිකයින් හතර දෙනෙකු පෙර දැනුම්දීමකින් තොරව 2017 සැප්තැම්බර් 22 කාරක සභා හමුවට නොපැමිණීම. | කැලණිය විශ්වවිද්‍යාලය | කාරක සභාව විසින් ලබා දෙන ලද නියෝග/නිර්දේශ ඔවුන් නොපැමිණීමට හේතු කාරක සභාව වෙත සතියක් ඇතුළත දැනුම්දීම සභාවට හේතු පිළිබඳ සලකා බැලීමෙන් පසු එම නිලධාරීන් කාරක සභා හමුවට කැඳවීම. | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 15. | 2017 සැප්තැම්බර් 22 | රාගම වෛද්‍ය පීඨයේ විදේශීය සිසුන්ගෙන් අයකර ගන්නා ලද පාඨමාලා ආදායම විශ්වවිද්‍යාල ආදායමට බැර නොකිරීම පිළිබඳ සාකච්ඡාකිරීම. | කැලණිය විශ්වවිද්‍යාලය | ඉදිරියේදී මෙම ගැටළුව ඇති නොවන පරිදි එක් අරමුදලකට බැර කිරීම සඳහා කටයුතු යොදන ලෙස හෝ පීඨවලින් ලැබෙන මුදල් පවත්නා ක්‍රමයකට ගිණුම්ගත කිරීම සඳහා නීතිමය ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු යොදන ලෙස දැන්වීම. | මෙම තත්ත්වය තවදුරටත් එලෙසම පවතී. |
| 16. | 2017 සැප්තැම්බර් 22 | 2016 වර්ෂයේ ආරම්භ කරන ලද අරමුදල් 04 කට මාරු කර තිබූ රු.50,000,000 කින් අදාළ කාර්යය සඳහා කිසිදු මුදලක් වැය කර නොතිබීම. | කැලණිය විශ්වවිද්‍යාලය | අරමුදල් යෙදවීමේ කටයුතු විධිමත් කිරීම සඳහා අරමුදල් කළමනාකරණ කමිටුවක් පිහිටුවීමට කටයුතු කිරීම. | අරමුදල් කළමනාකරණ කමිටුව 2018 අවසානය වනවිටත් පත්කර නොමැත. |
| 17. | 2018 මාර්තු 23 | විශ්වවිද්‍යාල පාලක සභාවේ සංයුතිය සම්බන්ධව නීති ක්ෂේත්‍රය නියෝජනය නොකරන පරිපාලනමය ක්ෂේත්‍රය නියෝජනය කරන නිලධාරියෙකු පත්කර තිබීම.<br>එසේම එම නිලධාරියාට විශ්වවිද්‍යාලයේ ගොඩනැගිලි ඉදිකිරීම් සම්බන්ධ තාක්ෂණ ඇගයීම් කමිටුවේ සභාපති ලෙද කටයුතු කර තිබීමත් විශ්වවිද්‍යාල නේවාසිකාගාර ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂක ලෙස කටයුතු කර තිබීම නිසා ලබැදියාවන් අතර ගැටළුවක් බවට සාකච්ඡාකිරීම. | බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය | -පාලක සභා සංයුතියේ එක් සාමජිකයෙකු හෝ නීතිඥයෙකු වීම වැදගත් බැවින් ඒ සම්බන්ධව අවධානය යොමු කිරීම.<br>-ඉහත සඳහන් කරනු ලැබූ නිලධාරියා තාක්ෂණික ඇගයීම් කමිටුවේ සාමාජිකත්වය දරා තිබීම නොගැලපෙන බැවින් ඒ සම්බන්ධයෙන් ලබැඳියාවන් අතර ගැටුමක් ඇති නොවන පරිදි සුදුසු කටයුතු කිරීම. | මේ සම්බන්ධව කටයුතු කරන ලෙස උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය දැනුවත් කර ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| **18.** | 2018 මාර්තු 23 | බඳවා ගෙන තිබෙන ශිෂ්‍යයින් සංඛ්‍යාව පවතින පහසුකම්වලට සාපේක්ෂව අඩු ප්‍රමාණයක් බවට සාකච්ඡාකිරීම. | බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය | -මෙම කරුණු පිළිබඳ සොයා බැලීම සඳහා අමාත්‍යාංශ නිලධාරි කණ්ඩායමක් යෙදවීම.<br>-ගිහි සිසුන්ට කුලී පදනම යටතේ නේවාසික පහසුකම් ලබා ගැනීමට ඇති හැකියාව සම්බන්දව පරීක්ෂා කර බැලීමට පුවත්පත් දැන්වීම් පළ කිරීම.<br>-විශ්වවිද්‍යාලය සතුව පවතින සම්පත් සහ යටිතල පහසුකම් පිළිබඳ අවධානය යොමුකර මෙම විශ්වවිද්‍යාලයේ දැනට සිටින ශිෂ්‍ය පිරිසට වඩා වැඩි ශිෂ්‍ය පිරිසක් බඳවා ගැනීමේ හැකියාව පිළිබඳ පරීක්ෂා කර බලා ඒ සඳහා ගතයුතු පරිපාලනමය හා නෛතික ක්‍රියාමාර්ග මොනවාද යන්න පිළිබඳ මාස 02 ක් ඇතුළත කාරක සභාව වෙත වාර්තාව ඉදිරිපත් කිරීම. | 2018 ජුනි 26 දින කාරක සභාව වෙත වාර්තාවක් යොමු කර ඇති අතර නේවාසිකාගාර පහසුකම් සපයා ගැනීමට අදාළ පුවත්පත් දැන්වීම් පළකර ලංසු මිල ගණන් ලබා ගෙන තිබුණ ද විශ්වවිද්‍යාල අවශ්‍යතාවයට ගැලපෙන ස්ථානයක් නේවාසිකාගාරය සඳහා තෝරා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| **19.** | 2018 මාර්තු 23 | පරිගනක උපදේශ II ශ්‍රේණියේ තනතුර සඳහා සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවෙකු බඳවා ගෙන තිබීම. | බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය | අධ්‍යයන ප්‍රතිඵල ලේඛනය (Acadamic Transcript) අදාළ විශ්වවිද්‍යාලයෙන් ගෙන්වා ගෙන පරීක්ෂා කිරීම<br>අදාළ උපාධි සහතිකයන් නිසිපරිදි සනාථ කර එවන ලෙස අදාළ තනතුරට පත් වූ නිලධාරියාට දැනුම්දීම. | මේ වනවිටත් විනය පරීක්ෂණ අවසන් කර නැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| **20.** | 2017 සැප්තැම්බර් 21 | කෘෂිකර්ම පශ්චාත් උපාධි හදාරන ශිෂ්‍ය සංඛ්‍යාව වැඩිකර ගැනීමේ අපේක්ෂාව ඉටු නොවීම සහ එම පාඨමාලාව සඳහා සිසුන් ලියාපදිංචිය අඩුවීම සම්බන්ධව ක්‍රියාමාර්ග ගැනීම. | රුහුණු විශ්වවිද්‍යාලය | කෘෂිකර්ම පශ්චාත් උපාධිය හදරන සිසුන් කණ්ඩායම වැඩිකර ගැනීමේ අපේක්ෂාව ඉටුනොවීම සහ එම පාඨමාලාව සඳහා සිසුන් ලියාපදිංචිය අඩුවීමට අදාළව දුර්වලතා මගහරවා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. | මේවනවිට බෝග විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව පමණක් ක්‍රියාක්මක වන අතර මින් පෙර ආරම්භ කර තිබූ පාඨමාලා 07 න් 06 ක්ම ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතී. |

### 3.1.3 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂමට විශේෂිත වූ අඩුපාඩු සම්බන්ධව පොදු ව්‍යාපාර කාරක සභාවේ සාකච්ඡා කරන ලද කරුණු

| | පොදු ව්‍යාපාර කාරක සභාව පැවැත්වූ දිනය | සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු | විශ්වවිද්‍යාලය / උසස් අධ්‍යාපන ආයතනය | කාරක සභාවේ නිර්දේශය/ නියෝගය | ගෙන ඇති ක්‍රියාමාර්ගය | වාර්තාවේ නිරීක්ෂණවලට යොමුව |
|---|---|---|---|---|---|---|
| 01. | 2017 පෙබරවාරි 22 | දැන්වීම් පළ නොකර 2015 වර්ෂයේදී යම් තෝරා ගැනීමක් මත අවිධිමත්ව කර ඇති බඳවා ගැනීම් සම්බන්ධව | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | කැබිනට් තීරණ හා චක්‍රලේඛ විගණනය සඳහා යවන ලෙස නියෝග කිරීම. | මේ වනවිට ද ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීමකින් තොරව අමාත්‍යාංශය මඟින් පිළියෙළ කරනු ලබන ලැයිස්තුවක් මත අනධ්‍යන කාර්යමණ්ඩලය බඳවා ගැනීම සිදුකර ගෙන යාම. | 3.2.16 |
| 02. | 2017 පෙබරවාරි 22 | විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කර ගැනීමේ පුරප්පාඩු පැවතීම සම්බන්ධව සාකච්ඡා කිරීම. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | සිසුන් බඳවා ගැනීමේ විස්තර අඩංගු සංෂිප්ත වාර්තාවක් සතියක් තුළ කාරක සභාවට එවීමට නියෝග කිරීම. | සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ද තවදුරටත් පුරප්පාඩු පවතී. | 3.2.1 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 03. | 2017 පෙබරවාරි 22 | ක්‍රීඩා අංශයෙන් ජාතික මට්ටමට සහ ආසියානු මට්ටමට එන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට විශ්වවිද්‍යාලවලට ඇතුළත්වීමේ වරම් අහිමිවීම සම්බන්ධව | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් හා ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම් සමඟ එක්ව මාසයක් ඇතුළත ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලෙස නියෝග කිරීම හා ඒ පිළිබඳ ප්‍රගතිය කාරක සභාවට වාර්තා කිරීම. | ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | |
| 04. | | විශ්වවිද්‍යාල පද්ධතියේ පවතින ගැටළු 14 ක් නිරාකරණයට අදාළව පළකර තිබූ පුවත්පත් දැන්වීමක් පිළිබඳව | | ඒ පිළිබඳ විස්තර කාරක සභාවට එවන ලෙස සභාපතිට නියෝග කිරීම. | විශ්වවිද්‍යාල පද්ධතියේ ඇති නිරාකරණය කළ යුතු ගැටළු හා වැඩිදියුණු කළ යුතු කරුණු 16 ක් සම්බන්ධව විගණනයට කරුණු ඉදිරිපත් කර තිබුණ ද ඒ පිළිබඳ විස්තර කාරක සභාවට ඉදිරිපත් කර නොතිබුණි. | |

## 3.2 විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන පද්ධතියට අදාළ පොදු නිරීක්ෂණ

### 3.2.1 දේශීය රාජ්‍ය විශ්වවිද්‍යාල සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමෙන් පසු ඇතිවන පුරප්පාඩු

මේ සම්බන්ධ පහත කරුණු නිරීක්ෂණය විය.

**(අ)** විවිධ පාඨමාලා සඳහා සුදුසුකම් ලබන සිසුන් එම පාඨමාලාවල ලියාපදිංචි නොවීම, ලියාපදිංචි සිසුන් වෙනත් පාඨමාලාවලට මාරුවීම සහ තවදුරටත් පුරප්පාඩු පිරවීමට කටයුතු නොකරන ලෙස විශ්වවිද්‍යාලවලින් දැනුම්දීම යන හේතු මත විශ්වවිද්‍යාලවලට වාර්ෂිකව සිසුන් ඇතුළත් කිරීමෙන් අනතුරුව තවදුරටත් සිසු පුරප්පාඩු පැවතුණි. විස්තර පහත පරිදි විය.

වගුව අංක 02 - පුරප්පාඩු වූ ශිෂ්‍ය සංඛ්‍යාව 2013-2017

| අධ්‍යයන වර්ෂය | පුරප්පාඩු පැවති පාඨමාලාවලට අදාළව බඳවා ගැනීමට යෝජිත ශිෂ්‍ය සංඛ්‍යාව | එම පාඨමාලාවල ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු ශිෂ්‍ය සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 2013/2014 | 8,940 | 7,146 | 1,794 | 20 |
| 2014/2015 | 7,980 | 6,525 | 1,455 | 18 |
| 2015/2016 | 10,405 | 8,179 | 2,226 | 21 |
| 2016/2017 | 10,318 | 9,580 | 738 | 07 |
| 2017/2018 | 10,840 | 9,943 | 897 | 08 |

**(ආ)** කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාල සඳහා සිසුන් ඇතුළත් කිරීමේදී විවිධ පාඨමාලා සඳහා සුදුසුකම් ලබන සිසුන් එම පාඨමාලා යටතේ ලියාපදිංචි නොවීම හේතුවෙන් ඇති වූ පුරප්පාඩු සඳහා තවදුරටත් ඉල්ලුම් කර තිබූ සිසුන් බඳවා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් 2013/2014 අධ්‍යයන වර්ෂයට සාපේක්ෂව 2015/2016 අධ්‍යයන වර්ෂයේදී පැනනැගී තිබූ පුරප්පාඩු සංඛ්‍යාව පිළිවෙළින් 1,794 සිට 2,226 දක්වා වැඩිවීමක් දක්නට ලැබුණි. එසේම 2016/2017 අධ්‍යයන වර්ෂයේදී සිසුන් බඳවාගැනීම වට හතක් දක්වා වැඩි කිරීම හේතුවෙන් සිසු පුරප්පාඩු සංඛ්‍යාව 738 දක්වා පහළයාමක් ද දක්නට ලැබුණි. එසේ වුවද මෙම පුරප්පාඩු ප්‍රමාණය 2014/2018 අධ්‍යයන වර්ෂයේදී නැවතත් 897 දක්වා වැඩිවී ඇති බව නිරීක්ෂණය වේ.

**(ඇ)** විවිධ පාඨමාලා සඳහා සුදුසුකම් ලබන සිසුන් එම පාඨමාලාවල ලියාපදිංචි නොවීම, ලියාපදිංචි සිසුන් වෙනත් පාඨමාලාවලට මාරුවීම සහ තව දුරටත් පුරප්පාඩු පිරවීමට කටයුතු නොකරන ලෙස විශ්වවිද්‍යාලවලින් දැනුම්දීම යන හේතූන් මත 2016/2017 වර්ෂයේදී හා 2017/2018 අධ්‍යයන වර්ෂවලදී ඉහත පුරප්පාඩු තවදුරටත් පවතින බවද දක්නට ලැබුණි.

### 3.2.2 දේශීය විශ්වවිද්‍යාල සඳහා විදේශීය සිසුන් ඇතුළත් කර ගැනීමෙන් පසු ඇතිවන පුරප්පාඩු

2011 ජනවාරි 25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව (ඇමුණුම 21) අධ්‍යයන වර්ෂ කිහිපයක් සඳහා දේශීය විශ්වවිද්‍යාලවලට විදේශීය සිසුන් බඳවාගැනීමේදී යෝජිත ශිෂ්‍ය සංඛ්‍යාව හා බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව සැසඳීමේදී පසුගිය අධ්‍යයන වර්ෂ 04කට අදාළව පහත ශිෂ්‍ය පුරප්පාඩු ඇති විය. ඒ අනුව එක් එක් සමගාමී වර්ෂයන්වල එම පුරප්පාඩුවල වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

| අධ්‍යයන වර්ෂය | යෝජිත ශිෂ්‍ය සංඛ්‍යාව | තෝරාගත් ශිෂ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | යෝජිත සංඛ්‍යාව පුරප්පාඩු සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙසට |
|---|---|---|---|---|
| 2013/2014 | 58 | 14 | 44 | 76 |
| 2014/2015 | 18 | 9 | 9 | 50 |
| 2015/2016 | 38 | 17 | 21 | 55 |
| 2016/2017 | 53 | 5 | 48 | 91 |
| 2017/2018 | 53 | 13 | 40 | 69 |
| එකතුව | 220 | 58 | 162 | 73 |

(අ) දේශීය විශ්වවිද්‍යාල සඳහා තෝරා ගනු ලබන විදේශීය සිසුන් කොළඹින් බැහැර විශ්වවිද්‍යාල සඳහා ඇතුළත් නොවීමේ ප්‍රවණතාවය මෙම පුරප්පාඩු කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබූ අතර එම විශ්වවිද්‍යාලවල තත්ත්වය උසස් කිරීමත් සහ ප්‍රවාහන පහසුකම්, නවාතැන්, ආහාරපාන හා සනීපාරක්ෂක පහසුකම් ඇතුළු අනෙකුත් පහසුකම් ද ජාත්‍යන්තර තත්ත්වයට ගැලපෙන ලෙස වැඩි දියුණු නොවීම ද මේ සඳහා විශේෂයෙන් බලපා තිබුණි.

(ආ) යෝජිත මුළු ශිෂ්‍ය සංඛ්‍යාව හා බඳවා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව සැසඳීමේදී 2013/2014, 2014/2015, 2015/2016, 2016/2017 හා 2017/2018 අධ්‍යයන වර්ෂවල පිළිවෙළින් පුරප්පාඩු 44,09,21,48 හා 40 ක් ලෙස පැවතුණි.

(ඈ) 2014/2015 අධ්‍යයන වර්ෂයේදී විදේශ සිසුන් ඇතුළත් කළ පසු වෛද්‍ය විද්‍යා පාඨමාලාව සඳහා සිසු පුරප්පාඩු 04 ක් පැවති අතර 2015/2016 අධ්‍යයන වර්ෂයේදී වෛද්‍ය විද්‍යා පාඨමාලාව යටතේ වූ ජෛව විද්‍යා පාඨමාලාව යටතේ පුරප්පාඩු 05 ක් පැවතුණි.

(ඇ) 2013/2014 අධ්‍යයන වර්ෂයේදී ඉංජිනේරු විද්‍යා පාඨමාලාව සඳහා කලා පාඨමාලාව සඳහා පිළිවෙළින් සිසුන් 04 ක් සහ 18 ක් වශයෙන් පුරප්පාඩු පැවති අතර 2014/2015 අධ්‍යයන වර්ෂයේදී ඉංජිනේරු පාඨමාලාව සඳහා පුරප්පාඩු 05 ක් පැවතුණි. එසේම 2015/2016 අධ්‍යයන වර්ෂයේදී ඉංජිනේරු, භෞතික විද්‍යා සහ කලා උපාධි පාඨමාලාවල පිළිවෙළින් 6ක්, 9ක් සහ 24 ක් වශයෙන් පුරප්පාඩු පැවතුණි.

(ඉ) 2016/2017 අධ්‍යයන වර්ෂයේදී පාඨමාලා 05 කට පමණක් විදේශ සිසුන් 53 ක් බඳවා ගැනීමට යෝජිතව තිබූ අතර එම පාඨමාලා 05 න් පාඨමාලා 04 කට විදේශ සිසුන් 05 දෙනෙකු පමණක් තෝරා ගෙන තිබූ අතර තවදුරටත් එම පාඨමාලා 05 ට අදාළ පුරප්පාඩු 48 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) මේ අනුව 2016/2017 අධ්‍යයන වර්ෂයේදී යෝජිත විදේශ සිසුන් අතරින් තවදුරටත් පවතින පුරප්පාඩු අනුව වෛද්‍ය විද්‍යා, ඉංජිනේරු වැනි ඉතා ජනප්‍රිය පාඨමාලාවලට අදාළව පුරප්පාඩු 13 ක් පැවති බව නිරීක්ෂණය වූ අතර ඒ අනුව විදේශ සිසුන් සඳහා වෙන් කළ පංගු ප්‍රමාණය තවදුරටත් පුරප්පාඩුව පැවතුණි.

(උ) 2013/2014 අධ්‍යයන වර්ෂයේ සිට 2016/2017 අධ්‍යයන වර්ෂය සඳහා විදේශ සිසුන් ඇතුළත් කර ගැනීමේදී පවතින පුරප්පාඩු විදේශ සිසුන් වෙත වෙන් කර ඇති පංගු ප්‍රමාණයෙන් සම්පූර්ණ නොවන ප්‍රමාණය දේශීය සිසුන් වෙත ප්‍රවේශවීමට අවස්ථාව ලබාදීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

### 3.2.3 විශ්වවිද්‍යාල සඳහා සිසුන් බඳවා ගැනීමේ දී යෝග්‍යතා පරීක්ෂණ පැවැත්වීම

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

**(අ)** එක් එක් විශ්වවිද්‍යාලවල යෝග්‍යතා පරීක්ෂණ පැවැත්වීමේ අවශ්‍යතාවය ඇති පාඨමාලාවලට අදාළව පරීක්ෂණ පැවැත්විය යුතු දිනයන් නිශ්චිතව තීරණය කර නොතිබීම හේතුවෙන් එක් එක් විශ්වවිද්‍යාලවල පරීක්ෂණ පවත්වන දිනය හා එම පරීක්ෂණවල ප්‍රතිඵල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම වෙත දන්වා එවීමට ප්‍රමාදවන තත්ත්වයක් නිරීක්ෂණය විය. මේ හේතුවෙන් යම් අධ්‍යයන වර්ෂයකට අදාළව සිසුන් ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත් කැඳවීමෙන් අනතුරුව යෝග්‍යතා පරීක්ෂණ ප්‍රතිඵල ප්‍රතිපාදන කොමිෂම වෙත ලැබීම ප්‍රමාදවීම අධ්‍යයන වර්ෂයට අදාළ කඩඉම් ලකුණු නිකුත් කිරීම ප්‍රමාදවීමට එක් හේතුවක් වී තිබීම.

**(ආ)** දීප ව්‍යාප්ත මට්ටමින් පවත්වනු ලබන අධ්‍යාපන පොදු සහතිකපත්‍ර (උ.පෙළ) විභාගයට පෙනී සිට ඉහළ Z අගයක් හිමිකර ගෙන ඇති අයදුම්කරුවන් විශ්වවිද්‍යාලයට ඇතුළත් කර ගැනීමට පවත්වන යෝග්‍යතා පරීක්ෂණය අසමත්වීම හේතුවෙන් මනාපය පළ කරන ලද පාඨමාලාවට ඇතුළත්වීමට හෝ විශ්වවිද්‍යාලයකට පිවිසීමේ අවස්ථාව අහිමිවී තිබූ අවස්ථා නිරීක්ෂණය විය. මෙය විශ්වවිද්‍යාලවලට බඳවා ගැනීමේ රාජ්‍ය ප්‍රතිපත්තියට පටහැනි වනවා පමණක් නොව තෝරා ගත් පාඨමාලා සඳහා පමණක් පරීක්ෂණ පැවැත්වීම තුළින් සැමට සමානව සැලකීමේ පදනම නැති කර ඇති බව නිරීක්ෂණය විය. මේ තුළින් විවිධ අක්‍රමිකතා සිදුවීමේ ඉඩකඩ බැහැර කළ නොහැක.

**(ඇ)** කැලණිය විශ්වවිද්‍යාලය විසින් පවත්වනු ලැබූ කථන හා ශ්‍රවන විද්‍යා පාඨමාලාවට අදාළව පවත්වනු ලැබූ යෝග්‍යතා පරීක්ෂණය අනුව සමත්වීම සඳහා ලකුණු 70 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ලබා ගත යුතුය. එසේ වුවද සමත්විය යුතු එම ලකුණු මට්ටම සැලකිල්ලට නොගෙන ලකුණු 70 ට වඩා අඩු, ලකුණු 38-68 පරාසයේ ලබා තිබූ සිසුන් තෝරා ගැනීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම කටයුතු කර තිබුණි.

**(ඈ)** එක් එක් විශ්වවිද්‍යාලවල යෝග්‍යතා පරීක්ෂණය සමත්වීමේ අවශ්‍යතාවය ඇති පාඨමාලාවලට අදාළ පරීක්ෂණ පවත්වන අයදුම්කරුවන්ගේ සමත්/ අසමත්බව තීරණයවීම කෙරෙහි අදාළ පීඨයේ පීඨාධිපතිවරයා හෝ සම්බන්ධිත ආචාර්යවරුන්ගේ විනිශ්චය මත රඳවා පැවතිය හැකිවීම.

### 3.2.4 අන්තර්ජාලය හරහා විශ්වවිද්‍යාල ප්‍රවේශයට අයදුම්කිරීම.

අන්තර්ජාලය හරහා විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම්කිරීමේ ක්‍රමවේදය ආරම්භ වූ 2014/2015 අධ්‍යයන වර්ෂයේදී අන්තර්ජාලය හරහා මෙන්ම සාමාන්‍ය තැපැල මඟින් විශ්වවිද්‍යාල ප්‍රවේශයට අයදුම් කිරීමට අවස්ථාව සලසා තිබුණි. එසේ වුවද 2017/2018 අධ්‍යයන වර්ෂය වනවිට විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අන්තර්ජාලය හරහා අයදුම්පත් යොමුකිරීම මෙන්ම තේරීපත් වූ පාඨමාලා සහ විශ්වවිද්‍යාල සඳහා අන්තර්ජාලය හරහා ලියාපදිංචිවීම ද අනිවාර්ය අවශ්‍යතාවයක් බවට පත් කොට ඇත.

මේ සම්බන්ධව පහත නිරීක්ෂණය කෙරේ.

**(අ)** විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම්කිරීමට අන්තර්ජාලය හරහා ලියාපදිංචිය සිදුකරන මාර්ගගත පද්ධතිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය දක්වා රු.9,347,750 ක් වැය කර තිබූ අතර 2018 වර්ෂයේ සිට වසරකට රු.700,000 ක පමණ මුදලක් පද්ධතිය නඩත්තු වියදම් ලෙස වැය කිරීමට සිදුව තිබෙව බව නිරීක්ෂණය විය.

**(ආ)** මෙම මාර්ගගත පද්ධතිය භාවිතා කරමින් අන්තර්ජාලය හරහා විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම්කිරීමේදී අයදුම්කරුවන් මුහුණ දෙන ලද ගැටළු පිළිබඳ සලකා බැලීමේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම විසින් ලේඛන ගතකර, විගණනය වෙත ඉදිරිපත් කර තිබූ තොරතුරු අනුව 2015/2016 අධ්‍යයන වර්ෂයේදී ප්‍රවේශයේදී ඉදිරිපත් වූ 1081 ක් වූ ගැටළු ප්‍රමාණය 2018/2019 අධ්‍යයන වර්ෂය වනවිට 5602 දක්වා වැඩිවී තිබූ බව නිරීක්ෂණය විය.

**(ඇ)** විශ්වවිද්‍යාල ලියාපදිංචිය අයදුම්කරන සිසුන් අන්තර්ජාලය හරහා විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පත් පිරවීමේදී යම් ගැටළු සහගත තත්ත්වයක් මතු වුවහොත් ඒ සම්බන්ධව විමසීම සඳහා රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය ඇමතීම හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂමේ දුරකතන අංක 04 ක් ප්‍රවේශ අත්පොතේ දක්වා තිබුණි. එසේ වුවද සිසුන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම්කරන කාලපරිච්ඡේදය තුළ දුරකතන මාර්ගවල පැවති කාර්ය බහුලතාවය හේතුවෙන් එම අංක අමතා ගැටළුවලට විසඳුමක් ලබා ගැනීම අපහසුවීමෙන් අයදුම්කරුවන් අපහසුතාවයට පත්ව තිබූ අවස්ථා නිරීක්ෂණය විය.

### 3.2.5 සිසුන්ගේ නේවාසිකාගාර අවශ්‍යතා හා අනෙකුත් පොදු පහසුකම්

මේ සම්බන්ධ පහත කරුණු නිරීක්ෂණය වේ.

**(අ)** සමාලෝචිත වර්ෂය තුල ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය විසින් නේවාසිකාගාර පහසුකම් ලබාගැනීම වෙනුවෙන් 2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කාලය තුලදී රු.21,638,235 ක් වැයකර තිබුණි. එසේ වුවද විශ්වවිද්‍යාලය ආරම්භ කර වසර 12 ක් පමණ ගත වී තිබුණ ද ස්ථිර නේවාසිකාගාර ඉදි කිරීම සඳහා විශ්වවිද්‍යාලය විසින් අවධානය යොමු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

**(ආ)** කොළඹ විශ්වවිද්‍යාලයේ භික්ෂු නේවාසිකාගාරය 2006 වර්ෂයේ සිට බදු කුලී පදනම මත පෞද්ගලික ගොඩනැගිල්ලක පවත්වාගෙන යන අතර වසර 10 කටත් වැඩි කාලයක සිට කුලී පදනම මත පවත්වාගෙන යන නේවාසිකාගාරය සඳහා සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු.25,555,000 ක මුදලක් කුලී ලෙස ගෙවා තිබුණි. විශ්වවිද්‍යාලයට ස්ථිරවම භික්ෂු නේවාසිකාගාරයක අවශ්‍යතාවය තිබුණද මේ දක්වාම එම කාර්යය ඉටු වී නොතිබු බව නිරීක්ෂණය විය.

**(ඇ)** කොළඹ විශ්වවිද්‍යාල පරිගනක අධ්‍යයන ආයතනයේ අභ්‍යන්තර උපාධි පාඨමාලා සඳහා බඳවා ගන්නා සිසුන්ට නේවාසිකාගාර පහසුකම් සැපයීම සඳහා 2010 සහ 2014 වර්ෂවලදී කුලී පදනම මත නේවාසිකාගාර ලබාගෙන තිබූ අතර මේ සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.1,912,800 ක් කුලී ලෙස ගෙවා තිබුණි. ස්ථිර නේවාසිකාගාර පහසුකම් ලබාගැනීම සඳහා සුදුසු වැඩ පිළිවෙලක් සකස් කිරීමට කළමනාකාරීත්වයේ අවධානය යොමුකළ යුතු බව විගණනයේදී නිරීක්ෂණය විය.

**(ඈ)** ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ප්‍රවාහන කටයුතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී සහ පසුගිය වර්ෂ 04 ක කාලයක් සඳහා වාහන කුලිය වශයෙන් රු.81,657,380 ක් ගෙවා තිබුණු අතර විශ්වවිද්‍යාලය ස්ථාපිත කර, වසර 12 ක් ගත වී ඇතත් වාර්ෂික අයවැය ලේඛන මගින් ප්‍රතිපාදන සලසා ගැනීම තුළින් අත්පිට හෝ කල්බදු ක්‍රමය යටතේ වාහන මිලදී ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 3.2.6 විශ්වවිද්‍යාල මගින් බාහිර උපාධි පාඨමාලා (ස්වයං මූල්‍ය) පැවැත්වීම

#### 3.2.6.1 ප්‍රතිඵල නිකුත් කිරීමේ ප්‍රමාදය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාල දූරස්ථ අධ්‍යාපන ඒකකය විසින් නිකුත් කර තිබුණු ශිෂ්‍ය අත්පොත් අනුව ශිෂ්‍යයකු ලියාපදිංචි වී අධ්‍යයන වර්ෂ 3 ක කාලය තුළ උපාධිය සම්පූර්ණ කළ යුතු වුවත් විභාග පැවැත්වීමේ ප්‍රමාදයන්, ප්‍රතිඵල නිකුත් කිරීමට දීර්ඝ කාලයක් ගතවීම වැනි හේතුන් නිසා බාහිර පාඨමාලාවලට ලියාපදිංචි වන සිසුන්ට උපාධිය සම්පූර්ණ කිරීම සඳහා වර්ෂ 07 කට අධික කාලයක් ගත වී තිබුණි.

(ආ) බාහිර විභාගවල ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා මාස 5 සිට වර්ෂ 2 දක්වා කාලයක් ගත කර තිබුණු අතර නියමිත කාලය තුළ විභාග පැවැත්වීමට ද දූරස්ථ අධ්‍යයන ඒකකය විසින් ප්‍රමාද කර තිබුණි.

මෙම කාල ප්‍රමාදය නිසා බොහෝ බාහිර උපාධි හදාරන සිසුන් උපාධි සුදුසුකම් සම්පූර්ණ කරන විට වයස අවුරුදු 28 ක් පමණ වන බැවින් ඔවුන්ට රජයේ තරඟ විභාගවලට පෙනී සිටීමට ඇති හැකියාව අවම වී තිබුණි. එසේම විරැකියාව, තරුණ ශ්‍රමය ඌන උපයෝජිතව පැවතීම, විවාහ ප්‍රමාදවීම වැනි සමාජීය ගැටළු ද ඇතිවීමට ඇති ඉඩකඩ බැහැර කළ නොහැක.

### 3.2.7 සප්ත වාර්ෂික නිවාඩු සඳහා දීමනා ගෙවීම.

2017 වර්ෂය අවසන් දින වන විට එක් එක් විශ්වවිද්‍යාලවල සප්ත වාර්ෂික නිවාඩු ලබාගෙන සිටි අචාර්ය මණ්ඩල සාමාජිකයින් හා අනධ්‍යාන කාර්යමණ්ඩල සාමාජිකයින් වෙනත් විශ්වවිද්‍යාලවල අධ්‍යයන කටයුතුවල හා අනධ්‍යාන කාර්යමණ්ඩල තනතුරුවල සේවයේ යෙදී තිබුණි. (ඇමුණුම 22)

මේ සම්බන්ධව පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ වැඩ ඉංජිනේරුවරයා 2016 ජනවාරි 16 දින සිට වසර දෙකක සප්ත වාර්ෂික නිවාඩු ලබාගෙන එම විශ්වවිද්‍යාලයේ වැටුප් හා දීමනා ලෙස රු. 2,894,032 ක් ද කැලණිය විශ්වවිද්‍යාලයේ වැඩ ඉංජිනේරුවරයා ලෙස කාර්යය පැවරුම් පදනම මත සේවයේ යෙදීම හේතුවෙන් දීමනා ලෙස රු. 1,700,000 ලබාගෙන තිබීම.

(ආ) කොළඹ විශ්වවිද්‍යාලයේ සේවයේ නියතුව සිටි ජ්‍යේෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරයකු සප්තවාර්ෂික නිවාඩු ලබාගැනීමෙන් අනතුරව සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පැවති එම තනතුරේ තාවකාලික පදනම මත සේවයේ යෙදීම වෙනුවෙන් මාස 04 ක කාල පරිච්ඡේදයක් සඳහා රු. 71,792 ක දීමනාවක් සහ නිවාඩු ලබා ඇති කාල පරිච්ඡේය වෙනුවෙන් ද කොළඹ විශ්වවිද්‍යාලයෙන් රු. 565,294 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

(ඇ) කොළඹ විශ්වවිද්‍යාලයේ සප්ත වාර්ෂික නිවාඩු ලබාගත් ආචාර්යවරුන් 03 දෙනෙකු එම කාලය තුළදී ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විද්‍යාලයේ හා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කොන්ත්‍රාත් පදනම මත රාජකාරි කර තිබූ අතර එම ආයතන විසින් අදාළ කාලය වෙනුවෙන් රු. 3,068,793 ක දීමනාවක් ගෙවා තිබුණි. එසේම එසේ දීමනාවක් ගෙවා තිබියදී ස්ථිර සේවා ස්ථානයේදී රු. 7,202,882 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

(ඈ) සප්ත වාර්ෂික නිවාඩු කාලය තුළ වෙනත් විශ්වවිද්‍යාලයක සමාන තනතුරක ඇතිවන පුරප්පාඩු ආවරණය කිරීම සඳහා කොන්ත්‍රාත් පදනම මත පත්කිරීම සිදුකළ හැකිවන්නේ එම තනතුරේ සේවය කළ නිලධාරියා වැටුප් රහිත නිවාඩු ලබාසිටී නම් පමණක් වුවද කොළඹ විශ්වවිද්‍යාලයේ හිටපු මූල්‍යාධිකාරීගේ වැටුප් සහිත සප්ත වාර්ෂික නිවාඩු කාලය තුළම සප්ත වාර්ෂික නිවාඩු ලබා තිබුණු කොළඹ විශ්වවිද්‍යාලයේ මූල්‍යාධිකාරීවරිය මෙම විශ්වවිද්‍යාලයේ මූල්‍යාධිකාරී ලෙස පත්කර තිබුණි. ඒ අනුව එකම කාල පරිච්ඡේදයක් සඳහා මූල්‍යාධිකාරී තනතුර වෙනුවෙන් රු.2,328,598 ක් සහ රු.1,731,280 ක් ස්ථිර හා තාවකාලික නිලධාරීන් දෙදෙනෙකුට වැටුප් ලෙස ගෙවා තිබුණි.

### 3.2.8 විශ්වවිද්‍යාල ආචාර්යවරුන් සඳහා දේශන පැය වෙන්කිරීම

මේ සම්බන්ධව පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) ආචාර්යවරුන් සඳහා අධ්‍යයන කාර්යයන් පැවරීමේදී ඔවුන්ගේවැඩ පැවරුම් (work norm) ඉටුවන පරිදි අංශ ප්‍රධානීන් විසින් අධ්‍යයන කාල සටහන් ලබාදීමට කටයුතු නොකළ අවස්ථා පැවතුණි.

(ආ) දේශන ප්‍රතිමාන සැලැස්ම හා විෂය කාලසටහන් ප්‍රකාරව එක් එක් ආචාර්යවරයා විසින් පැවැත්විය යුතු දේශන පැය ගණන් හා සත්‍ය වශයෙන් පැවැත්වූ දේශන පැය ගණන සැසඳීමේදී ඇතැම් ආචාර්යවරුන් විසින් කාලසටහනේ ඇති දේශන පැය ගණන සම්පූර්ණ කර නොතිබුණු අවස්ථා පැවතුණි.

(ඇ) අධ්‍යයන කාර්යමණ්ඩල උපයෝජනය සඳහා පිළියෙළ කළ දේශන ප්‍රතිමාන සැලැස්ම ප්‍රකාරව කථිකාචාර්යවරුන්ට තනතුරු අනුව ලබාදිය යුතු අවම දේශන පැය ප්‍රමාණය අධ්‍යයන කාලසටහන් මඟින් ලබා දී නොතිබුණු පහත අවස්ථා නිරීක්ෂණය විය.

**(i)** ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයන අංශයේ සේවයේ නියුතු ස්ථිර අධ්‍යයන කාර්යමණ්ඩලයේ දේශකවරු 18 ක ගෙන් 11 කට දේශන ප්‍රතිමාන සැලැස්ම අනුව සතියකට ලබාදිය යුතු අවම දේශන පැය ප්‍රමාණය ලබාදී නොතිබීම.

**(ii)** සති 15 ක අධ්‍යයන කාලය තුළ විෂයන් 22 ක විෂය ආවරණයවීම සියයට 47 සිට සියයට 75 දක්වා අඩු පරාසයක පැවතීම.

**(iii)** සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ සංගීත පීඨයේ කථිකාචාර්යවරුන්ට අධ්‍යයන කාලසටහන් මඟින් වෙන්කළ දේශන පැය ගණනින් ආවරණය කළ තත්‍ය දේශන පැය ගණනේ ප්‍රතිශතය සියයට 14 සිට සියයට 80 දක්වා පරාසයක පැවතීම.

### 3.2.9 විශ්වවිද්‍යාල කාර්යමණ්ඩලය විසින් එළඹෙන බැඳුම්කර ගිවිසුම්

මේ සම්බන්ධව පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) ඒ අනුව නියමිත කාලය අවසන් වූ පසු නැවත සේවයට නොපැමිණීම හේතුවෙන් පහත පරිදි විශ්වවිද්‍යාල 17 කට ම අදාළව විශ්වවිද්‍යාල කාර්යමණ්ඩල සාමාජිකයින් ගිවිසුම් කඩකළ අවස්ථා නිරීක්ෂණය විය. ඒ අනුව අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 519 දෙනෙකු බැඳුම්කර කඩකිරීමට ලක්කර තිබූ අතර ඔවුන්ගෙන් අයවිය යුතු මුදල රු.836,133,700 ක් විය. විස්තර ඇමුණුමෙහි 23 දැක්වේ.

(ආ) මොරටුව විශ්වවිද්‍යාලයේ ගිවිසුම් කඩකල ආචාර්යවරයෙකුගෙන් අයකර ගතයුතු රු.4,093,176 ක් ඇපකරුවන්ගෙන් අයකර ගැනීම සඳහා පැවරූ නඩුවක් සම්බන්ධයෙන්, ඇපකරුවන් විසින් අත්සන් කරන ලද ගිවිසුමෙහි ඇප වටිනාකම ලෙස අකුරින් රුපියල් හාරලක්ෂ අනූ තුන් දහස් එකසිය හැත්තෑ පහයි ශත පනස් තුනක් ලෙසත් ඉලක්කමින් රු.4,093,176 ලෙසත් සඳහන්කර තිබුණි. (ඇමුණුම 24) මේ හේතුවෙන්, අකුරින් ලියූ අගය පිළිගැනීම සාමාන්‍ය සම්මතය බවත්, ඇප ගිවිසුමෙහි අකුරින් හා ඉලක්කමින් ලියා ඇත්තේ බැලූ බැල්මට ගිවිසුමෙහි අනෙක් කොටස් සම්පූර්ණ කළ තැනැත්තා නොවන බවත් ඉලක්කමින් ලියූ වටිනාකම නිවැරදි වුවත් නිවැරදි බවට තහවුරු කිරීමට මොරටුව විශ්වවිද්‍යාලය අපොහොසත් වීම හේතුවෙන් වලංගු නොවන ගිවිසුමට ඇතුලත් කරුණු සම්බන්ධයෙන් ඇපකරුවන් වගකීමට නොබැඳෙන බවත් අධිකරණ තීන්දුව මඟින් ප්‍රකාශයට පත්කර තිබුණි.

(ඇ) ඉහත 3.2.9 (අ) ඡේදයේ පරිදි බැඳුම්කර ගිවිසුම් කඩකිරීම හේතුවෙන් අයකර ගැනීමට නොහැකි වූ රු.මිලියන 836.1 ක මුදල් අයකර ගැනීමට විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ v පරිච්ඡේදයේ වගන්ති 7.6, 7.7, 7.8 ප්‍රකාරව (ඇමුණුම 25) කටයුතු කර නොතිබුණි.තවද විශ්වවිද්‍යාලයෙ හි වගකිව යුතු නිලධාරීන් විසින් නොසැලකිලිමත්ව හා වගකීම් විරහිතව කටයුතු කිරීම හේතුවෙන් මෙවැනි තත්ත්වයක් ඇතිවී තිබුණු බව නිරීක්ෂණය කෙරේ.

**3.2.10 විශ්වවිද්‍යාල මගින් පැවැත්වෙන විෂය පර්යේෂණ**

මේ සම්බන්ධව පහත කරුණු නිරීක්ෂණය වේ.

(අ) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරුන් 227 දෙනෙකු 2012 වර්ෂයේ සිට සිදුකරන ලද පර්යේෂණ අතුරින් 2012 වර්ෂයේ 24 දෙනෙකු, 2013 වර්ෂයේ 15 දෙනෙකු, 2014 වර්ෂයේ 08 දෙනෙකු, 2015 වර්ෂයේ 37 දෙනෙකු සහ 2016 වර්ෂයේ 54 දෙනෙකු වශයෙන් කථිකාචාර්යවරු 138 දෙනෙකු අදාළ පර්යේෂණ අතහැර දමා තිබුණු අතර විශ්වවිද්‍යාලය එම කථිකාචාර්යවරුන් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්යමණ්ඩලයේ 456 දෙනෙකු සඳහා 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා රු.62,496,364 ක පර්යේෂණ දීමනා ගෙවා තිබුණ ද නිලධාරීන් 454 දෙනෙකු පරීක්ෂණ කමිටුව වෙත වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) අපේක්ෂිත වියදම් පිළිබඳව නිශ්චිත තක්සේරු කිරීමකින් තොරව ඇස්තමේන්තු පිළියෙල කිරීමත්, පර්යේෂණ ක්‍රියාත්මක කිරීම, ජාත්‍යන්තර පර්යේෂණ පරිසංවාද, පර්යේෂණ හා ප්‍රකාශන ජාත්‍යන්තර හා දේශීය සමුළු සඳහා ඉදිරිපත් කිරීම යනාදිය සඳහා අධ්‍යයන කාර්යමණ්ඩලයේ අවධානය යොමු කිරීම ප්‍රමාණවත් නොවූ බැවිනුත් වාර්ෂිකව භාණ්ඩාගාරය විසින් ලබා දී තිබුණු ප්‍රාග්ධන ප්‍රදාන නිසි පරිදි උපයෝජනය කර නොමැති බව නිරීක්ෂණය විය.

(ඈ) පර්යේෂණාධාර ලබාගත් කථිකාචාරයවරුන් පර්යේෂණ යෝජනා නියමිත දිනට ලබානොදීම, පර්යේෂණ වාර්තා ඉදිරිපත් නොකිරීම හා ප්‍රගති වාර්තා කාලීන ඉදිරියට නොකිරීම හේතුවෙන් සත්‍ය වශයෙන් පර්යේෂණ සිදුකර ඇද්ද යන්න හා ප්‍රමාදවී ලබාදෙන පර්යේෂණ වාර්තා කොතරම් ඵලදායීද යන්න ගැටළු සහගතවන අතර පර්යේෂණාධාර ලබාදීමේ අපේක්ෂිත අරමුණු ඉටුවී තිබේද යන්න පිළිබඳ ගැටළු සහගත තත්ත්වයක් මේ අනුව නිරීක්ෂණය වේ.

### 3.2.11 විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපනය වෙනුවෙන් අන්තර්ජාල පහසුකම් සපයා ගැනීම

#### 3.2.11.1 අදාළ සමාගම තෝරා ගැනීම

2014 වර්ෂයේ සිට 2016 වර්ෂය අවසානය දක්වා විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනය වෙත සපයා තිබූ සේවය වෙනුවෙන් Lanka Education and Research Network (LEARN) සමාගම වෙත පහත පරිදි රු.856,078,253 ක මුදලක් ගෙවා ඇති බව සේවා සපයා ගන්නා ලද විශ්වවිද්‍යාලවල ගෙවීම් විස්තර අනුව නිරීක්ෂණය විය. (ඇමුණුම 26)

| වර්ෂය | ගෙවා ඇති මුදල |
|---|---|
| | රු. |
| 2014 | 152,301,098 |
| 2015 | 190,009,248 |
| 2016 | 257,649,251 |
| 2017 | 256,118,656 |
| | **856,078,253** |

#### 3.2.11.2 අදාළ සමාගම විසින් තීරණය කරන ලද ලාභාන්තිකය අනුව අනෙකුත් නිරීක්ෂණ

2013 වර්ෂයේ සිට 2016 වර්ෂ අවසානය දක්වා විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනය වෙත සේවා සැපයීමේදී සමාගම විසින් පහත පරිදි සියයට 27 සිට සියයට 75 දක්වා ලාභාන්තිකයක් රඳවා ගෙන තිබූ බව සමාගමේ ගිණුම් වාර්තා අනුව අනාවරණය විය.

| | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|
| රඳවා ගෙන තිබූ ලාභාන්තිකය සියයට | 27 | 38 | 41 | 75 |

මේ සම්බන්ධව පහත කරුණු නිරීක්ෂණය වේ.

**(අ)** උක්ත 2.2.8 පරිච්ඡේදයේ පරිදි විශ්ව විද්‍යාල තම උසස් අධ්‍යාපන ආයතන සඳහා අන්තර්ජාල පහසුකම් ලබා දීමේ අරමුණින් 3.2.11.1 ඡේදයේ පරිදි වාර්ෂිකව අසාමාන්‍ය ලෙස ගෙවීම් සිදුකරමින් LEARN සමාගම වැනි සමාගමක් පිහිටු වීම රාජ්‍ය මුදල් ඵලදායි නොවන ලෙස වැය කිරීමක් බව නිරීක්ෂණය විය. 2014-2017 කාල පරිච්ඡේදය තුළදී පමණක් මෙම සමාගම වෙත රු.මිලියන 856ක් පමණ ගෙවා තිබීම තුළින් එය පැහැදිලි වේ.

(ආ) තවද මෙම සමාගම විශ්ව විද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන සඳහා සේවා සැපයීමේදී අසාමාන්‍යය ලෙස 27% සිට 75%ක ලාභාන්තිකයක් රඳවා ගැනීම තුල මෙම සමාගම අසාමාන්‍ය ලෙස ලාභ ඉපයීමට කටයුතු කරන බවද නිරීක්ෂණය විය.

(ඇ) සියලුම විශ්වවිද්‍යාල සතුව තොරතුරු තාක්ෂණ ආයතනයන්, අධ්‍යයන පීඨ හෝ දෙපාර්තමේන්තු පැවතියදීත් ඒ සඳහා විශේෂඥ දැනුම සහිත පුද්ගලයින් සිටියදීත් අන්තර්ජාල පහසුකම් සැපයීම සඳහා අධික වියදමක් දරමින් මෙවැනි සමාගමක් පිහිටුවීම ඵලදායි නොවන බව විගණනය විසින් හඳුනාගන්නා ලදි.

(ඈ) මෙම සමාගම පිහිටුවීම සම්බන්ධයෙන් අනුමැතිය විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් පමණක් ලබා ගෙන තිබුණු අතර මෙවැනි සමාගමක් පිහිටු වීම සම්බන්ධයෙන් එම අනුමැතිය ප්‍රමාණවත් නොවන බවට හඳුනාගන්නා ලදි.

(ඉ) අරමුණු කිහිපයක් ඉටු කර ගැනීමේ පරමාර්ථයෙන් මෙම සමාගම පිහිටුවා තිබුණද එම අරමුණු නිසි පරිදි සමාගමෙන් ඉටුවන්නේ ද පිළිබඳව ගැටලු සහගත වේ.

(උ) මෙම සමාගම් විගණනය හා අවසන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ ක්‍රමවත් වැඩපිළිවෙළක් නොතිබුණි.

(ඌ) මහාභාණ්ඩාගාරය විසින් අධික ප්‍රාග්ධන පිරිවැයක් මත විශ්වවිද්‍යාල වෙත ලබා දෙන අරමුදල් මෙලෙස සමාගමක සමුච්චිතවීමට ඉඩහැරීම ඵලදායී නොවන බව ද නිරීක්ෂණය විය.

**3.2.12 විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන පවත්වා ගෙන යනු ලබන ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය**

මේ සම්බන්ධව පහත කරුණු නිරීක්ෂණය වේ.

(අ) මොරටුව විශ්වවිද්‍යාලය විසින් භුක්තිවිඳින පොතේ අගය රු.260,843,500 ක් වූ රජයට අයත් අක්කර 55 ක ඉඩම විශ්වවිද්‍යාලයට නීත්‍යානුකූලව පවරා නොතිබුණි.

(ආ) ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ලබා දෙන ලද කර්මාන්ත අමාත්‍යාංශය සතු හෙක්ටයාර 30.9667 ක් වූ ඉඩම අධ්‍යාපන අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට අදාළව 2008 පෙබරවාරි 10 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 05/0183/035/001 යටතේ ගත් තීරණය අනුව, විශ්වවිද්‍යාලයට වෙන්කර තිබුණු මෙම ඉඩමේ අයිතිය මේ දක්වා විශ්වවිද්‍යාලයට නීත්‍යානුකූලව පවරාගෙන නොතිබුණි.

(ඇ) සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය සතු වටිනාකම රු.1,022,650,000 ක් වූ රජය සතු අක්කර 3 රූඩ් 2 පර්.2.1 ක ඉඩමේ අයිතිය මේ දක්වා විශ්වවිද්‍යාලයට නීත්‍යානුකූලව පවරා ගෙන නොතිබුණි.

(ඈ) කැලණිය විශ්වවිද්‍යාලය භුක්ති විඳින අක්කර 3 රූඩ් 2 පර් 9.48 ක ඉඩම් කොටස් මේ දක්වා විශ්වවිද්‍යාලයට නීත්‍යානුකූලව පවරා ගෙන නොතිබුණි.

(ඉ) වයඹ විශ්වවිද්‍යාලය විසින් රු. මිලියන 10 ක් ගෙවා ලබා ගෙන ඇති පොල් පර්යේෂණ ආයතනයට අයත් අක්කර 5 ක ඉඩම පවරා ගැනීම වෙනුවෙන් 2013 වර්ෂයේදී රු. 1,013,750 ක් පන්නල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත තැන්පත් කර ඇතත් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් එම ඉඩම් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) වයඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ඉදිකෙරෙමින් පවතින රු. 77,872,750 කට තක්සේරු කර ඇති අක්කර 28 පර්චස් 12.84 ක භූමිය පවරා ගැනීමේ කටයුතු සඳහා විශ්වවිද්‍යාලය විසින් 2016 වර්ෂයේදී රු.16,500,000 ක් කුලියාපිටිය බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කර තිබූ අතර, අදාල පවරා ගැනීමේ කටයුතු 2018 වර්ෂය අවසන් වන විටද නිම වී නොතිබුණි.

(උ) විවෘත විශ්වවිද්‍යාලයේ නාවල ප්‍රධාන කාර්යාලය පිහිටි ඉඩම හා ප්‍රාදේශීය මධ්‍යස්ථාන 09 ක් හා මධ්‍යස්ථාන 18 ක් පිහිටි ඉඩම් කොටස් 21 අයිතිය පවරාගෙන නොතිබුණි.

(ඌ) සබරගමුව විශ්වවිද්‍යාලයේ පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා පවරා ගත් ඉඩමේ අයිතිය නිරවුල් නොමැති බැවින් ඉඩමට නඩු පවරා ඇති නිසා ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා විශ්වවිද්‍යාලය විසින් දරන ලද රු.1,494,543 ක මූලික වියදම නිෂ්ක්‍රීය වියදමක් වී තිබුණි.

(එ) සෞන්දර්ය විශ්වවිද්‍යාලය විසින් පරිහරණය කරනු ලබන ඉඩම් හා ගොඩනැගිලිවල නීත්‍යානුකූල අයිතිය 2018 දෙසැම්බර් 31 වන විටත් පවරා ගෙන නොතිබුණි.

(ඒ) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා මෙත් සෙවන ඉඩමෙන් අක්කර 5 ක බිම් ප්‍රමාණයක් පවරා ගැනීම වෙනුවෙන් 1994 ජූනි 29 දින ගෙන තිබුණු අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි 1998 වර්ෂය සිට 2010 වර්ෂය දක්වා අවස්ථා 3 කදී රු. මිලියන 24 ක්ද, සමාලෝචිත වර්ෂයේ රු. මිලියන 50 ක්ද වශයෙන් රු. මිලියන 74 ක් බස්නාහිර පළාත් සභාවට ගෙවා තිබුණද, අදාළ ඉඩම පවරා ගැනීමේ කටයුතු 2018 වර්ෂය අවසානය දක්වාම සිදුකර නොතිබුණි.

**(ඔ)** විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා ප්‍රාදේශීය මධ්‍යස්ථාන පවත්වාගෙන යන අක්කර 75 ක් වූ ඉඩම් 29 ක් අතුරින් විශ්වවිද්‍යාලය වෙත නීත්‍යානුකූල හිමිකම් ලබාගෙන ඇති අක්කර 53 ක් වූ ඉඩම් 07 ක් පමණි. ඉතිරි අක්කර 22 කින් සමන්විත වූ ඉඩම් 22 ක අයිතිය විශ්වවිද්‍යාලය වෙත පවරා ගැනීම කෙරෙහි ඉහළ කළමනාකාරීත්වය ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. තවද මාතර, මහනුවර, කළුතර හා කෑගල්ල යන ප්‍රදේශ තුළ විශ්වවිද්‍යාලය විසින් පරිහරණය කරන අක්කර 18 ක ඉඩම්වල අයිතිය විශ්වවිද්‍යාලය වෙත පවරාදී වර්ෂ 08 ත් 30 ත් අතර කාලපරාසයක් ගතවී තිබුණද 2018 වර්ෂය අවසානය දක්වාම හිමිකම් ඔප්පු ලබාගෙන නොතිබුණි.

**(ඕ)** විවෘත විශ්වවිද්‍යාලය අම්පාර අධ්‍යයන මධ්‍යස්ථානය පවත්වා ගෙන යන පර්චස් 77 ක් වූ ඉඩම 2004 සැප්තැම්බර් 24 දින සිට වසර 30 ක කාලයක් සඳහා බදු පදනම මත ලබාගෙන තිබූ අතර ඒ සඳහා 2004 වර්ෂයේ සිට 2018 වර්ෂය අවසානය දක්වා රු.217,500 ක් බදු කුලී ලෙස ගෙවා තිබුණ නමුත් විධිමත් බදු ගිවිසුමකට එළඹ නොතිබුණි.

**(ක)** අක්කර 03 ක් වූ බදුල්ලේ බදුලුපිටිය ඉඩම සහ පර්චස් 62 ක් වූ රත්නපුර ඉඩම විවෘත විශ්විද්‍යාලය වෙත පවරා ගැනීම සඳහා එහි තක්සේරු වටිනාකමින් සියයට 25 ක් බැගින් පිළිවෙලින් 2013 මාර්තු 20 දින රු.100,000 ක් සහ 2011 අගෝස්තු 09 දින රු.443,750 ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ගෙවා තිබුණ නමුත් 2018 දෙසැම්බර් 31 දින දක්වාම එහි ඉඩම්වල අයිතිය පවරාගෙන නොතිබුණි.

**(ග)** ඉහත හඳුනාගන්නා ලද විශ්ව විද්‍යාල ප්‍රයෝජනයට ගනු ලබන ඉඩම් වල නීත්‍යානුකූල අයිතිය අදාල විශ්වවිද්‍යාලය සතු වී නොමැති අතර පවරා ගැනීමේ කටයුතුද ප්‍රමාද වී තිබිණි.තවද නිත්‍යානුකූල හිමිකම නොමැති ඉඩම් වල රජයේ අරමුදලින් හා විශ්ව විද්‍යාල විසින් උපයන ලද ආදායමින් ගොඩනැගිලි ඉදිකිරීමට ද කටයුතු කර තිබුණි.මෙම තත්ත්වය අනාගතයේදී අදාල විශ්වවිද්‍යාල සඳහා අවධානමක් විය හැකි බවට හඳුනා ගන්නා ලදී.

### 3.2.13 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත ප්‍රකාර විශේෂ අරමුදල් ඇතිකර තිබීම

**මේ සම්බන්ධ පහත නිරීක්ෂණයන් කෙරේ.**

(අ) විශ්වවිද්‍යාලයන් විසින් වෙන වෙනම අරමුදල් ගිණුම් පවත්වා ගෙන ගොස් තිබූ අතර 2017 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාල 15 කට අදාළව පවත්වා ගෙන තිබූ අරමුදල් සංඛ්‍යාව 794 ක් වූ අතර එම අරමුදල්වල ශේෂය රු.5,666,943,414 ක් විය. (ඇමුණුම 27)

(ආ) විශ්වවිද්‍යාලවල කටයුතු වෙනුවෙන් වාර්ෂිකව පුනරාවර්තන හා ප්‍රාග්ධන වශයෙන් විශාල මුදලක් මහා භාණ්ඩාගාරයෙන් සපයනු ලැබේ. මෙම මුදල් භාණ්ඩාගාරය විසින් විවිධ අයුරින් ණය ගැනීම් මඟින් ලබා ගත් මුදල් වේ. විශ්වවිද්‍යාල විසින් මෙලෙස අරමුදල්වල මුදල් ආයෝජනය නොකර විශ්වවිද්‍යාල කටයුතු වෙනුවෙන් වාර්ෂිකව යෙද වූයේ නම් භාණ්ඩාගාර ප්‍රතිපාදන යම් ප්‍රමාණයකට හෝ අඩු කර ගැනීමට හැකි බව මේ තුළින් ඒක පුද්ගල ණයබර අඩු කර ගැනීමට හැකිවේ.

### 3.2.14 ප්‍රාග්ධන ප්‍රදානයන්

විශ්වවිද්‍යාල වෙත වාර්ෂිකව ප්‍රාග්ධන ප්‍රදාන ලබාදී තිබුණ ද අදාළ කාර්යයන් සඳහා උපයෝජනය නොකර වැය නොකළ ප්‍රදාන ලෙස රඳවා ගෙන තිබූ අවස්ථා නිරීක්ෂණය විය. ඒ අනුව 2017 දෙසැම්බර් 31 එසේ වැය නොකර රඳවා ගෙන සිටි මුදල රු.1,416,216,302 ක් විය. (ඇමුණුම 28)

මේ සම්බන්ධව පහත කරුණු නිරීක්ෂණය විය.

**(අ)** ඉහත පරිදි විශ්වවිද්‍යාලවල කටයුතු ඵලදායී හා කාර්යක්ෂමව ඉටුකිරීම උදෙසා රජය විසින් වාර්ෂිකව ප්‍රාග්ධන ප්‍රදාන ලබාදී තිබුණද එම මුදල් අදාළ කාර්යයන් සඳහා උපයෝජනය කිරීමෙන් තොරව වැය නොකළ ප්‍රදාන ලෙස රඳවා ගෙන තිබූ අවස්ථා නිරීක්ෂණය විය.

**(ආ)** අපේක්ෂිත වියදම් පිළිබඳව නිශ්චිත තක්සේරු කිරීමකින් තොරව ඇස්තමේන්තු පිළියෙල කිරීමත්, පර්යේෂණ ක්‍රියාත්මක කිරීම, ජාත්‍යන්තර පර්යේෂණ පරිසංවාද, පර්යේෂණ හා ප්‍රකාශන ජාත්‍යන්තර හා දේශීය සමුළු සඳහා ඉදිරිපත් කිරීම යනාදිය සඳහා අධ්‍යයන කාර්යමණ්ඩලයේ අවධානය යොමු කිරීම ප්‍රමාණවත් නොවූ බැවිනුත් වාර්ෂිකව භාණ්ඩාගාරය විසින් ලබා දී තිබුණු ප්‍රාග්ධන ප්‍රදාන නිසි පරිදි උපයෝජනය කර නොමැති බව නිරීක්ෂණය විය.

### 3.2.15 විශ්වවිද්‍යාල මගින් රජයේ මුදල් ස්ථාවර තැන්පතුවල යෙදවීම

විශ්වවිද්‍යාල ගිණුම්වල පවතින අතිරික්ත මුදල් වැඩි වටිනාකම් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. ඒ අනුව විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන 31 ක ආයෝජනය කර තිබූ මුළු වටිනාකම 2017 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 14,092 ක් විය. (ඇමුණුම 29)

මේ සම්බන්ධ පහත කරුණු නිරීක්ෂණය වේ.

**(ඇ)** ඉහත පරිදි ස්ථාවර තැන්පතුවල ආයෝජනය සඳහා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගත යුතු වුවත් විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන 33 ක් විසින් අනුමැතියකින් තොරව රු.මිලියන 14,139 ක මුදලක් ස්ථාවර තැන්පතුවල යොදවා තිබුණි.

**(ආ)** රජය විසින් ඉහළ පොළී අනුපාතයක් යටතේ රජයේ සුරකුම්පත් වැනි මාර්ගවලින් රජයේ වියදම් සඳහා අරමුදල් සම්පාදනය කර ගැනීමට කටයුතු කරන අතර එම තත්ත්වය නොසලකා විශ්වවිද්‍යාල විසින් භාණ්ඩාගාරයෙන් ලද මුදල් ස්ථාවර තැන්පත් වල යොදවා තිබීම ඵලදායි කාර්යයක් නොවන බව නිරීක්ෂණය විය.

**3.2.16 විශ්වවිද්‍යාල සඳහා අනධ්‍ය කාර්යය මණ්ඩලය බඳවා ගැනීම**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම හා විශ්වවිද්‍යාල අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පරිපාලනමය නොවන තනතුරුවලට බඳවා ගැනීමේ ක්‍රමවේදය සම්බන්ධව පහත කරුණු නිරීක්ෂණය විය.

උක්ත තනතුරු සඳහා බඳවා ගැනීමේ දී වාර්තාවේ 2.2.12 ඡේදයේ සඳහන් පරිදි අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නිකුත් කරනු ලබන ලැයිස්තුවක් මත බඳවා ගැනීම හේතුවෙන් හා විවෘත දැන්වීමක් මගින් ප්‍රසිද්ධ කර බඳවා ගැනීම් සිදු නොකිරීම හේතුවෙන් සුදුසුකම්ලත් පුරවැසියන් සියලු දෙනාට ඒ සඳහා ඉල්ලුම් කිරීමට ඇති අවස්ථාව අහිමි වී ඇති බව නිරීක්ෂණය විය.

**3.2.17 විශ්වවිද්‍යාලය තුළ ගිණුම් සැකසීමේ පොදු ක්‍රමවේදයක් අනුගමනය නොකිරීම.**

මේ සම්බන්ධ පහත කරුණු නිරීක්ෂණය වේ.

**(අ)** සියලුම විශ්වවිද්‍යාල සඳහා ගිණුම් පිළියෙළ කිරීම සඳහා පොදුවේ පිළිගත් මෘදුකාංග පද්ධතියක් භාවිතා නොකරන බව 2.2.15 ඡේදය අනුව නිරීක්ෂණය වේ. තවද අදාල මෘදුකාංග භාවිතා කලද ප්‍රසිද්ධ කිරීම සඳහා නිකුත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශන ගිණුම්කරන මෘදුකාංගය භාවිතා කර පිළයෙල නොකරන බවද නිරීක්ෂණය විය.ඒ අනුව ප්‍රසිද්ධ කරනු ලබන මූල්‍ය ප්‍රකාශන හා මෘදුකාංග භාවිතා කර සකස් කරනු ලබන මූල්‍ය ප්‍රකාශන අතර විවිධ වෙනස්කම් නිරීක්ෂණය වන බවද හඳුනාගන්නා ලදී. තවද මේ හේතුවෙන් විශ්වවිද්‍යාල අතර මූල්‍ය ප්‍රකාශන සැසඳීම ද ගැටළුකාරි වේ.

**(ආ)** සියලුම විශ්වවිද්‍යාල පොදුවේ පිළිගත් ගිණුම්කරන ක්‍රමවේදයන් අනුගමනය නොකිරීමත්, ගිණුම්පිළියෙල කිරීමේදී ප්‍රමාණවත් සැලකිල්ලක් නොදැක්වීමත්,විධිමත් භාවයකින් තොරව ජ'නල් සටහන් තැබීම ආදි කරුණු එලෙස ගිණුම්කරන අඩුපාඩු ඇතිවීමට හේතුවී ඇති බව නිරීක්ෂණය විය.

**3.2.18 අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයන්ගේ පැමිණීම හා පිටවීම සනාථ කර ගැනීමකින් තොරව වැටුප් හා දීමනා ගෙවා තිබීම.**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ X පරිච්ඡේදයේ 1.6.1 වගන්තිය සහ XX පරිච්ඡේදයේ 3 (1) වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යයන කාර්යමණ්ඩලයේ පැමිණීම හා නිවාඩු තහවුරු කර ගැනීමෙන් තොරව වැටුප් හා දීමනා වශයෙන් රු.මිලියන 5000.4 ක මුදලක් 2017 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළ ගෙවා තිබුණි.

**3.2.19 කාර්යමණ්ඩල පුරප්පඩු පිරවීමට කටයුතු නොකිරීම**

විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන 17 ක අනුමත අධ්‍යයන කාර්යමණ්ඩලය 4,596 ක් වුවත් තත්‍ය කාර්යමණ්ඩලය 3,335 ක් වූයෙන් පුරප්පාඩු 1,261 ක් පවතින බව නිරීක්ෂණය විය. (ඇමුණුම 30) එසේම විශ්වවිද්‍යාල අනධ්‍යයන කාර්යමණ්ඩලය අනුමත සේවක සංඛ්‍යාව 7,207 ක් වූ අතර තත්‍ය කාර්යමණ්ඩලය 5,716 ක් බව නිරීක්ෂණය විය. ඒ අනුව අනධ්‍යයන කාර්යමණ්ඩලය 1,491 ක් පුරප්පාඩු වී ඇති බව නිරීක්ෂණය වේ. විස්තර ඇමුණුම් අංක 31 හි දැක්වේ.

**3.2.20 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා ආයතන සංග්‍රහය**

මෙම ආයතන සංග්‍රහය නිකුත් කර වර්ෂ 34 ක් පමණ ගත වී තිබුණ ද සියළු සංශෝධනයන් සහිතව ආයතන සංග්‍රහය නැවත නිකුත් කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

**3.2.21 විශ්වවිද්‍යාල සඳහා පීඨ පැවරීම**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24 (ඈ) සහ 27 (1) උපවගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාල සඳහා පීඨයක් හෝ පීඨ පැවරුම් කිරීමේ බලය අමාත්‍යවරයා සතු වුවද, ඊට අනුකූල නොවන ලෙස රුහුණ විශ්වවිද්‍යාලයට පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය පැවරීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සිදු කර තිබූ අතර කොමිෂන් සභාවට එවැනි බලයක් තිබේද යන්න තහවුරු වන සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**3.2.22 මාණ්ඩලික නිලධාරීන් සඳහා සංග්‍රහ වියදම් ගෙවීම**

මේ සම්බන්ධව පහත කරුණු නිරීක්ෂණය වේ.

**(අ)** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2014 මාර්තු 26 දිනැති ආයතන චක්‍රලේඛ ලිපි අංක 6/2014 ප්‍රකාරව (ඇමුණුම 32) භාණ්ඩාගාර අනුමැතියකින් තොරව විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය වෙනුවෙන් මූලික වැටුපෙන් සියයට 10 සිට සියයට 20 දක්වා සංග්‍රහ දීමනා ගෙවා තිබුණි.

**(ආ)** ඉහත ඡේදයේ සඳහන් පරිදි භාණ්ඩාගාර අනුමැතියකින් තොරව විශ්වවිද්‍යාල චක්‍රලේඛ ලිපි පදනම් කරගෙන මාණ්ඩලික නිළධාරීන් වෙත සංග්‍රහ වියදම් දීමනා ගෙවීම භාණ්ඩාගාර තීරණ ඉක්මවා කටයුතු කිරීමක් බව නිරීක්ෂණය විය.

**උදා:-** කැලණිය විශ්වවිද්‍යාලය විසින් 2016 වර්ෂයේදී මූලික වැටුපෙන් සියයට 08 සිට සියයට 20 දක්වා වූ එකතුව රු.1,827,176 ක සංග්‍රහ වියදම් ගෙවා තිබීම.

**3.2.23 සේවක අර්ථසාධක අරමුදල හා විශ්වවිද්‍යාල සේවක භාරකාර අරමුදල සඳහා දායක මුදල් ගණනය කිරීම**

ඉහත අරමුදල් 02ට අදාළ දායක මුදල් ගණනය කිරීමේදී අධ්‍යයන දීමනාවද ඇතුළුව දායක මුදල් ගණනය කිරීම නිසා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 1997 සිට 2011 දක්වා එම අරමුදල් 02 සඳහා පිළිවෙළින් රු.මිලියන 129 ක් හා රු.මිලියන 25 ක දායක මුදල් වැඩිපුර ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.

**3.2.24 බාහිර උපාධි පාඨමාලා ආදායම් විශ්වවිද්‍යාල අරමුදලට බැර නොකිරීම.**

විශ්වවිද්‍යාල 15 කට අදාළව සලකා බැලීමේදී බාහිර උපාධි පාඨමාලා සඳහා ලැබූ මුදල් විශ්වවිද්‍යාල අරමුදලට බැරකර නොමැති අවස්ථා නිරීක්ෂණය විය.
උදාහරණ වශයෙන් වයඹ විශ්වවිද්‍යාලයේ 2016 දෙසැම්බර් 31 දින වන විට බාහිර පාඨමාලා 22 කින් ලැබී තිබුණු රු.111,669,967 ක මුදලක් ද කැලණි විශ්වවිද්‍යාලයේ රාගම වෛද්‍ය පීඨයේ විදේශීය සිසුන්ගේ අය කර ගන්නා ලද පාඨමාලා ගාස්තු ද, විශ්වවිද්‍යාල අරමුදලට බැරකර නොතිබුණි.

### 3.2.25 උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන විශ්වවිද්‍යාල

#### 3.2.25.1 ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

**(අ)** විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ නීති ක්ෂේත්‍රය නියෝජනය කරන සාමාජිකයාගේ තනතුර සඳහා නීති ක්ෂේත්‍රය නියෝජනය නොකරන පරිපාලන ක්ෂේත්‍රයේ නිලධාරියෙකු 2017 සැප්තැම්බර් මස සිට පත් කර තිබුණි.

**(ආ)** සනාතන සභා සාමාජිකයින් අතුරින් තෝරා පත් කර ගත් සාමාජිකයින් විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ නීති ක්ෂේත්‍රය නියෝජනය කරන සාමාජිකයාගේ තනතුර 2017 මාර්තු මස සිට පුරප්පාඩු වීමත් සමඟ එම තනතුර සඳහා නීතිඥයකු පත් කරන ලෙස විශ්වවිද්‍යාලය විසින් අමාත්‍යාංශය වෙත ඉල්ලීම් කර තිබුණි. එසේ වුවද අමාත්‍යාංශය විසින් නීති ක්ෂේත්‍රයේ සාමාජිකයෙකු වෙනුවට අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙකු ලෙස කටයුතු කර එ් වනවිට විශ්‍රාම ලබා සිටි (2017 ජූලි 07) නිලධාරියෙකු මෙම පුරප්පාඩුව සඳහා පත්කර ඇත. තවද මෙම නිලධාරියා විශ්වවිද්‍යාලයේ ගොඩනැගිලි දෙකක් ඉදිකිරීමට අදාළ තාක්ෂණ ඇගයීම් කමිටුවල සභාපති ලෙස කටයුතු කර තිබෙන අතර මොහු 2017 වර්ෂයේ සිට විශ්වවිද්‍යාල නේවාසිකාගාර ව්‍යාපෘතියේ අධ්‍යක්ෂවරයා ලෙස ද කටයුතු කර තිබුණි.

#### 3.2.25.2 ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය

විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයට අයත් ලේඛකාධිකාරි හා මූල්‍යාධිකාරි යන ප්‍රධාන තනතුරු 02 සඳහා 2012 වර්ෂයේ සිට ස්ථිර නිලධාරීන් පත් නොකර වෙනත් විශ්වවිද්‍යාලවල සප්ත වාර්ෂික නිවාඩු ලබා පැමිණෙන නිලධාරීන් තාවකාලිකව හා වෙනත් විශ්වවිද්‍යාලවල නිලධාරීන් වැඩබැලීමේ පදනම මත පත්කිරීමට කටයුතු කර තිබීම හේතුවෙන් විශ්වවිද්‍යාලයේ කාර්යක්ෂම පරිපාලනයක් පවත්වාගෙන යාම කෙරෙහි අහිතකර ලෙස බලපා ඇති බව නිරීක්ෂණය විය.

### 3.2.26 කොන්ත්‍රාත් පරිපාලනය

### 3.2.26.1 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

මේ සම්බන්ධව පහත කරුණු නිරීක්ෂණය විය.

**(අ) රජරට විශ්වවිද්‍යාලය**

**(i)** ද්විත්ව සේවක නිල නිවාස 04 ක් ඉදිකිරීම ගිවිසුම්ගත වටිනාකම රු.52,703,236 ක් වූ කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණි. තෝරාගත් ලංසුකරුගේ මූලික සුදුසුකම් වල පැවති අඩුපාඩු හේතුවෙන් සචලීකරණ අත්තිකාරම් ගෙවීමේදී වැඩබිමේ ස්ථාපිත වීමෙන් පසු සියයට 10 ක් හා ඉටු කරන ලද වැඩ වල වටිනාකම සියයට 20 ක් ඉක්මවූ පසු ඉතිරි සියයට 10 ක අත්තිකාරම් ලබා දෙන ලෙස තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශ කර තිබියදී එය නොසලකා ගිවිසුම් ගත වටිනාකමෙන් සියයට 20 ක් වූ රු.10,540,647 ක් එකවර අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි. ගිවිසුම් ප්‍රකාරව මෙම ඉදිකිරීම් 2017 ජූලි 05 දින අවසන් කළයුතුව තිබුණද 2018 අගෝස්තු 05 දින වන විට කොන්ත්‍රාත්කරු ඉදිකිරීම් කටයුතු අතරමග නතර කර කොන්ත්‍රාත්තුව අත්හැර දමා තිබුණි.

**(ii)** විශ්වවිද්‍යාලයේ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානය පිහිටුවීමට රු.මිලියන 143.3 ක වියදමින් සිව් මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2017 අගෝස්තු 24 දින ගිවිසුම්ගතව කොන්ත්‍රාත්කරු වෙත 2017 සැප්තැම්බර් 18 දින රු.16,449,500 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණි. ගිවිසුම් ප්‍රකාරව මෙහි ඉදිකිරීම් 2018 දෙසැම්බර් 16 දිනට අවසන් විය යුතුව තිබුණද 2018 සැප්තැම්බර් 30 දින වන විටත් කොන්ත්‍රාත්තුවේ වැඩ ආරම්භ කර නොතිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.1 පරිච්ඡේදය ප්‍රසම්පාදන කාර්යයන් ආරම්භ කිරීමට පෙර ප්‍රසම්පාදනයට අවශ්‍ය මූලික සූදානම්වීමේ කටයුතු ඇතුළත් සක්‍යතා අධ්‍යනයක් සිදු නොකිරීමත් ගොඩනැගිලි ඉදිකිරීමට අවශ්‍ය හරිත තත්ත්වය මැන බැලීමේ සහතිකය නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් ලබා නොගැනීමත් හේතුවෙන් ඉදිකිරීම ආරම්භ කිරීමට නොහැකිව තිබුණු අතර කොන්ත්‍රාත්කරු විසින් වර්ෂයකට අධික කාලයක් අත්තිකාරම් මුදල් අතරඳවාගෙන තිබුණි. කෙසේ වුවද විශ්වවිද්‍යාලය විසින් මේ සම්බන්ධයන් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන තිබූ බව තහවුරු නොවුණි.

**(ආ) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

රසායන විද්‍යාගාර ගොඩනැගිල්ල හා නව කලාගාරය අළුත්වැඩියා කිරීමේ කාර්ය කොන්ත්‍රාත්කරු අත්හැර ගොස් තිබුණු බැවින් 2012 අප්‍රේල් 25 දින කොන්ත්‍රාත්තුව අවලංගු කර තිබුණි. එසේ වුවද, කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණු රු. 2,268,483 ක අත්තිකාරම් මුදලින් ආවරණය නොකළ වැඩ වෙනුවෙන් අයවිය යුතු රු. 1,764,013 ක් කාර්යසාධන බැදුම්කරයෙන් අයකරගෙන නොතිබුණු අතර එම මුදල කොන්ත්‍රාත්කරුගෙන් අය කර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදීද කටයුතු කර නොතිබුණි.

**(ඇ) මොරටුව විශ්වවිද්‍යාලය**

විශ්වවිද්‍යාලය ඉදිකිරීම් ක්ෂේත්‍රය හා සම්බන්ධ උපදේශනාත්මක සේවාවන් ආයතන වලට සැපයීමේ ආයතනයක් වුවද සිය පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් තම ආයතනය සතු ශිල්පීය හා තාක්ෂණික සේවා දැනුම උපයෝගී කර ගැනීමකින් තොරව රු.4,545,000 ක් වැයකර පෞද්ගලික ආයතනයකින් උපදේශන සේවය ලබාගෙන තිබුණු අතර යෝජිත වාස්තු විද්‍යා ගොඩනැල්ල අදියර II ඉදිකිරීම සම්බන්ධයෙන් ද රු.මිලියන 5 ක් (වැට් රහිත) වැයකර උපදේශන සේවාව වෙනත් පෞද්ගලික ආයතනයකින් ලබාගෙන තිබුණි.

**(ඈ) වයඹ විශ්වවිද්‍යාලය**

**ව්‍යවහාරික විද්‍යාපීඨ ගොඩනැගිල්ල ඉදිකිරීම**

2014 ජුලි 10 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත ඉංජිනේරු ඇස්තමේන්තුව රු.315,250,260 ක්වූ ව්‍යවහාරික විද්‍යාපීඨ ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

**(i)** අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු 2014 අගෝස්තු 29 සිට 2016 මාර්තු 29 දක්වා වූ කාලරාමුව තුළ සිදුකළ යුතු බවට දන්වා තිබුණද 2019 වර්ෂයේ අප්‍රේල් මස අවසන් වනවිටත් වැඩ නිම කොට කොන්ත්‍රාත්කරු විසින් ගොඩනැගිල්ල භාරදීමට කටයුතු කර නොතිබුණි.

(ii) උසස් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ 2014 සැප්තැම්බර් 02 දිනැති අංක එච්ඊ/පීආර්/එම්ඕඑච්ඊ/ජීඊඑන් දරන ලිපිය ප්‍රකාරව ගිවිසුම්ගත කොන්ත්‍රාත් කාලය ඉක්මවා මාස 02 ක් පමණක් වූ දින දීර්ඝයක් විශ්වවිද්‍යාලයේ උපකුලපතිට ලබාදිය හැකි වුවත්, අදාල කර්මාන්තයේ තවදුරටත් නිමකළ යුතු වැඩ කොටස් හා ඒවා නිමකරන ආකාරය දැක්වෙන විස්තරයක්ද ලබා නොගෙන පළමු කාල දිගුව 2016 සැප්තැම්බර් 30 දක්වා මාස 06 ක් හා දෙවන කාල දිගුව 2016 දෙසැම්බර් 31 දක්වා මාස 3 ක් වශයෙන් උපකුලපති විසින් දින දීර්ඝ ලබා දී තිබුණි.

(iii) කොන්ත්‍රාත්කරු විසින් 2016 නොවැම්බර් 26 දින සිට 2016 දෙසැම්බර් 30 දක්වා කාලය තුල ඉටුකල වැඩ ඇතුලත් කර ඉදිකිරීම් නිමකල බවට 2017 මැයි 08 දින අවසන් බිල්පත් ඉදිරිපත් කර තිබුණද ඒ වනවිට වැඩ විෂයයන් 16 ක සියයට 5 සිට සියයට 100 දක්වා පරාසයක ඉටු නොකල වැඩ පැවති බව විගණනයේදී නිරීක්ෂණය වූ අතර 2018 වර්ෂය අවසන් වනවිටත් එම වැඩ කොටස් නිම කර නොතිබුණි.

(iv) ඉටු නොකල වැඩ පැවතියදී එය නොසලකා මුළු කොන්ත්‍රාත් වටිනාකම වූ රු.315,250,260 ක් ආවරණය වන පරිදි 16 වන අතුරු ගෙවීම ලෙස බිල්පත සංශෝධනය කරමින් රු.13,913,000 ක් ගෙවීම්කර තිබුණි.

(v) ගොඩනැගිල්ලේ දුරකථන සහ ජාලගත පද්ධතිය (Network System) සඳහා වූ කටයුතු මහල් දෙකක පමණක් සිදුකර අදාල වැඩ විෂයය අත්හැර දමා තිබුණද, ඒ වෙනුවෙන් ඇස්තමේන්තුගත රු.1,775,000 ක්වූ මුළු මුදලම කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි.

(vi) ශ්‍රවනාගාරය ඇතුළත සම්පූර්ණ කළයුතු වැඩ කොටස් 3 ක් වෙනුවෙන් රු.3,800,000 ක් ගෙවා තිබුණද, එම කාර්යයන් සම්පූර්ණ කර නොතිබුණි.

(vii) විෂයය අංක 32 අනුව රු.10,972,000 ක් ගෙවා තිබෙන ගොඩනැගිල්ලේ ඇතුළත වෙන්කිරීම් 3mm ඝණකම සහිත Compsite Board 02 කින් නිමකල යුතු වුවත්, ඊට අඩු ඝණකමින් යුත් Board ඒ සඳහා භාවිතා කර තිබුණි.

(viii) විෂයය අංක 38 අනුව Rain Water Disposal System වැඩ විෂයය සඳහා රු.1,977,437 ක්වූ මුළු මුදලම ගෙවා තිබුණද, අදාල කාර්යය සම්පූර්ණ කර නොතිබුණි.

**(ඉ) පේරාදෙණිය විශ්වවිද්‍යාලය**

සම සෞඛ්‍ය පීඨයේ ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් සහ කළමනාකරණ පීඨයේ කුළුණු (Colonode) ඉදිකිරීම වෙනුවෙන් පිළිවෙලින් 2011 දෙසැම්බර් 15 දින හා 2016 දෙසැම්බර් 22 දින එකතුව රු.2,387,929 ක සචලීකරණ අත්තිකාරම් කොන්ත්‍රාත්කරුවන් වෙත ලබා දී තිබුණි. එහෙත් 2015 ජුනි 04 දින වනවිට සෞඛ්‍ය පීඨ ගොඩනැගිල්ලේ ඉදිකිරීම් අත්හැර දමා තිබූ අතර කළමනාකරණ පීඨයේ කුළුණු ඉදිකිරීම ආරම්භ කිරීමකින් තොරවම අත්හැර දමා තිබුණි. එසේ වුවද එම කොන්ත්‍රාත්වලට අදාලව ලබාගෙන තිබුණු අත්තිකාරම් සුරක්ෂණය කල් ඉකුත් වීමට පෙර මුදල් කරවා නොගැනීම හේතුවෙන් එම වටිනාකමින් විශ්වවිද්‍යාලයට පාඩුවක් සිදු වී තිබුණි.

## 04. නිර්දේශ

පහත සඳහන් නිර්දේශ කරනු ලැබේ.

| | නිර්දේශය | යොමුව |
|---|---|---|
| 4.1 | බැඳුම්කර ගිවිසුම් කඩකිරීම හේතුවෙන් අයකර ගැනීමට නොහැකි වූ මුදල් කඩිනමින් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගැනීම හා බැඳුම්කර ගිවිසුම් සකස් කිරීමේදී නිසි වගකීමෙන් යුක්තව කටයුතු කිරීම. | 3.2.9 |
| 4.2 | විශ්වවිද්‍යාල මඟින් පවත්වන බාහිර උපාධි පාඨමාලා නියමිත වර්ෂ 03 ක හෝ 04 ක කාලය තුළ දී අවසන් කිරීමට අවශ්‍ය පියවර ගැනීම. | 3.2.6.1 |
| 4.3 | රජය විසින් විශ්වවිද්‍යාල සඳහා වාර්ෂිකව වෙන්කරනු ලබන ප්‍රාග්ධන ප්‍රතිපාදන ඵලදායී ලෙස උපයෝජනය සඳහා සැලසුම් සකස් කිරීම. | 3.2.14 |
| 4.4 | රටට ඵලදායිවන අංශ කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් පර්යේෂණ ක්ෂේත්‍රයන් තෝරා ගැනීම, පර්යේෂණ සඳහා වෙන් කරනු ලබන ප්‍රතිපාදන නිසිපරිදි උපයෝජනය කිරීම, පර්යේෂණ සම්බන්ධයෙන් විධිමත් පසුවිපරම් ක්‍රියාවලියක් ස්ථාපිත කිරීමට අවශ්‍ය පියවර ගැනීම සහ පර්යේෂණ තුළින් අනාවරණය වනු ලබන ප්‍රතිඵල රටට ප්‍රසිද්ධ කිරීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමට පියවර ගැනීම. | 3.2.10 |
| 4.5 | ආරම්භ කරනු ලබන පර්යේෂණ අවසන් නොකරන ලද හා ප්‍රමාද කරන ලද කථිකාචාර්යවරයන් සඳහා නීත්‍යානුකූල පියවර ගැනීමට කටයුතු කිරීම. | 3.2.10 |
| 4.6 | ස්වයං මූල්‍ය පාඨමාලාවලින් උපයන ආදායම නියමිත පරිදි කොමිෂන් සභා අරමුදලට මාරු කිරීමට අවශ්‍ය පියවර ගැනීම. | 3.2.24 |
| 4.7 | විශ්වවිද්‍යාල සඳහා පීඨ පැවරීමේදී පනත ප්‍රකාරව අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීම. | 3.2.21 |
| 4.8 | සිසුන්ගේ නේවාසිකාගාර අවශ්‍යතා සපුරාලීමට ස්ථාවර නේවාසිකාගාර ඉදිකිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම. | 3.2.5 |

| | | |
|---|---|---|
| **4.9** | ආචාර්යවරුන් සඳහා අධ්‍යයන කාර්යයන් පැවරීමේදී නිසිපරිදි අධ්‍යයන කාලසටහන් ලබාදීමත්, ලබාදුන් කාලසටහන් අනුව ආචාර්යවරුන් සේවයේ ලබාදුන්නේ ද යන්න හඳුනාගැනීම සඳහ පසුවිපරම් කිරීම. | **3.2.8** |
| **4.10** | විශ්වවිද්‍යාලවල විවිධ පාඨමාලා සඳහා සිසුන් බඳවා ගැනීමේදී පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණ ක්‍රමවේදය වෙනුවට සිසුන්ගේ මූලික අයිතිවාසිකම් කඩනොවන ලෙසට සාධාරණ ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන අ.පො.ස. උසස් පෙළ විභාගයට පෙනී සිට ඉහළ Z අගයක් ගනු ලබන සිසුන් වෙත විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අවස්ථාව ලබාදීම. | **3.2.3** |
| **4.11** | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂමට හා විශ්වවිද්‍යාල අනධ්‍යයන පරිපාලනමය නොවන තනතුරු සඳහා බඳවා ගැනීමේදී විවෘත දැන්වීමක් මඟින් ප්‍රසිද්ධ කර බඳවා ගැනීම් සිදු කිරීමට අවශ්‍ය පියවර ගැනීම. | **3.2.16** |
| **4.12** | භාණ්ඩගාරය විසින් ලබා දෙනු ලබන ප්‍රතිපාදන ස්ථාවර තැන්පතුවල යොදවන්නේ නම් ඒ සඳහා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමටත් එම මුදල් ඵලදායි ලෙස වෙන්කරනු ලබන කාර්යය සඳහා යොදවා ගැනීමටත් අවශ්‍ය පියවර ගැනීම. | **3.2.13** |
| **4.13** | සියලුම විශ්වවිද්‍යාල සඳහා පිළිගත් ගිණුම්කරණ මෘදුකාංග පද්ධතියක් හඳුන්වාදීමටත් ගිණුම්කරණ දෝෂ අවම කිරීම සඳහා එම පද්ධතිය මඟින් ප්‍රසිද්ධ කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට අවශ්‍ය කටයුතු කිරීම. | **3.2.17** |
| **4.14** | විදේශීය සිසුන් ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලවලට ඇතුළත්වීම ක්‍රමයෙන් පහළයාම හේතුවෙන් එම සිසුන් සඳහා වෙන්කරනු ලබන අවස්ථාවන් ප්‍රමාණය සඳහා දේශීය සිසුන් හට අවස්ථාව සලසාදීමට අවශ්‍ය පියවර ගැනීම. | **3.2.2** |
| **4.15** | විදේශීය සිසුන් විශ්වවිද්‍යාල කෙරෙහි දක්වන ආකර්ෂණය ඉහළදැමීම සඳහා අවශ්‍ය පියවර ගැනීම. | **3.2.2 (අ)** |

| | | |
|---|---|---|
| **4.16** | විශ්වවිද්‍යාලවල පවතින සිසුන්ගේ පුරප්පාඩු පිරවීම නිසිලෙස සම්පූර්ණ කිරීමට කටයුතු කිරීම තුළින් විශ්වවිද්‍යාල සුදුසුකම්ලත් සිසුන්ට විශ්වවිද්‍යාල සඳහා ඇතුළත්වීම සඳහා අවස්ථාව ලබාදීම. | **3.2.1** |
| **4.17** | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ තීරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ක්‍රියාමාර්ග හා පසුවිපරම් කිරීම සඳහා පියවර ගැනීම. | **3.1.1** |
| **4.18** | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා ආයතන සංග්‍රහය වර්තමානයට ගැළපෙන පරිදි සංශෝධනයට පියවර ගැනීම. | **3.2.20** |
| **4.19** | LEARN සමාගමෙහි කාර්යභාර්ය සම්බන්ධයෙන් නැවත විමර්ශණය කර එම සමාගමෙහි ඵලදායිතාවය පිළිබඳව ඇගයීම හා එක් එක් විශ්වවිද්‍යාලවල පවත්වා ගෙන යනු ලබන තොරතුරු තාක්ෂණ ආයතනවලට සම්බන්ධ විශේෂඥ දැනුම සහිත පුද්ගලයින් සම්බන්ධ කරගෙන අන්තර්ජාල පහසුකම් ලබා ගැනීම සඳහා පිරිවැය අවමවන වැඩපිළිවෙළක් සකස් කර ගැනීම. | **3.2.11** |
| **4.20** | විශ්වවිද්‍යාල සඳහා අන්තර්ජාල පහසුකම් සපයා ගැනීමේදී අදාළ විශ්වවිද්‍යාලවල පවතින තොරතුරු තාක්ෂණ අංශයන්ට පැවරීමත් ඒ සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් වැනි ආයතනයන් සහාය ලබා ගැනීමටත් පියවර ගැනීම. | **3.2.11.2** |

**ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න**

**විගණකාධිපති**

**2019 මැයි 24 දින**

## 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

[සහතිකය සටහන් කළේ 1978 දෙසැම්බර් මස 21 වන දින]

එල්. ඩී.—ඕ. 60/78.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවක් සහ විශ්වවිද්‍යාල සේවා අභියාචන මණ්ඩලයක් පිහිටුවීම පිණිස ද මණ්ඩප සහ පීඨ සහිත විශ්වවිද්‍යාල ද වෙනත් උසස් අධ්‍යාපන ආයතන ද පිහිටුවීම, පවත්වාගෙන යාම සහ පරිපාලනය කිරීම සඳහා සහ ඊට සම්බන්ධ වූ හෝ ආනුෂංගික වූ කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, එහි විධිවිධාන සියල්ලම හෝ ඉන් යම් විධිවිධානයක් සම්බන්ධයෙන්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක හෝ දිනවල එය ක්‍රියාත්මක වන්නේ ය. *(ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.)*

## I වන කොටස

### විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිහිටුවීම

2. (1) තත් කාලයෙහි කොමිෂන් සභාවේ සාමාජිකයන් වන තැනැත්තන්ගෙන් සමන්විත (මෙහි මින් මතු "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවක් මේ පනත යටතේ පිහිටුවනු ලැබේ. *(විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවක් පිහිටුවීම.)*

(2) කොමිෂන් සභාව යම් නාමකින් හැඳින්විය යුතු යයි (1) වන උපවගන්තියෙන් නියම කෙරේ ද ඒ නාමයෙන් කොමිෂන් සභාව අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් වන අතර—

(අ) ඒ නාමයෙන් කොමිෂන් සභාව විසින් සියලු අධිකරණවල නඩු පැවරීමට හා කොමිෂන් සභාවට විරුද්ධව නඩු පවරනු ලැබීමට ;

(ආ) කොමිෂන් සභාව විසින් ස්වකීය අභිමතය පරිදි මුද්‍රාව වෙනස් කිරීමට ;

(ඇ) චංචල හෝ නිශ්චල යන දෙවර්ගයේ ම දේපළ මිලට ගැනීමෙන් හෝ අන්‍යාකාරයකින් අත්කර ගැනීමට සහ ඒ දෙවර්ගයේ ම දේපළ සතුව සිටීමට, බද්දට හෝ කුලියට ගැනීමට හෝ දීමට, උකස් කිරීමට, ඔඩපනයට යටත් කිරීමට සහ විකිණීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට

කොමිෂන් සභාවට සම්පූර්ණ බලය හා අධිකාරය ඇත්තේ ය.

3. පහත සඳහන් කටයුතු කොමිෂන් සභාවේ අරමුණු වන්නේ ය :— *(කොමිෂන් සභාවේ අරමුණු.)*

(1) ජාතික ප්‍රතිපත්තියට අනුකූල වන පරිදි විශ්වවිද්‍යාල අධ්‍යාපනය සැලසුම් කිරීම හා සම්බන්ධීකරණය කිරීම;

2—ඒ 36614—13,500 (78/12)

ඇමුණුම - 02

## Organizational Chart of the University Grants Commission



## ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ සංවිධාන ව්‍යුහය



ඇමුණුම-04

අ-04

# 1 කොටස

## විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති රජයේ විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල ප්‍රථම උපාධි පාඨමාලා සඳහා ප්‍රවේශ වීමේදී බලපාන ප්‍රතිපත්ති හා නීතිරීති

### 1.1 රාජ්‍ය විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා ප්‍රවේශ ප්‍රතිපත්තිය

විෂය ධාරාවන් අනුව ප්‍රවේශ ප්‍රතිපත්තිය වෙනස් වේ.

මෙම අත්පොතෙහි 2.1 (1) ඡේදයේ 1 සිට 8 දක්වා සඳහන් කර ඇති කලා අධ්‍යයන පාඨමාලා සඳහා ප්‍රවේශ වීමට අපේක්ෂා කරන සිසුන් අදාළ පාඨමාලා සඳහා තෝරා ගැනීම ප්‍රධාන වශයෙන් දිප ව්‍යාප්ත කුසලතා පදනම මත සිදු කෙරේ. මෙම කාණ්ඩයට අයත් සිසුන් තෝරා ගැනීම සඳහා දිස්ත්‍රික් කුසලතා පදනම යොදා ගන්නේ නැත. එබැවින්, එම උපාධි පාඨමාලා සඳහා විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබා ගැනීමට සියලුම සිසුන් එක සමාන තරඟයක නිරත වේ.

කිසියම් අධ්‍යයන පාඨමාලාවකට තෝරා ගන්නා මුළු ශිෂ්‍ය සංඛ්‍යාව ජාතික ප්‍රතිපත්තියක් අනුව තීරණය කෙරේ. එයට අනුව, යම් දිස්ත්‍රික්කයකින් කිසියම් පාඨමාලාවකට ඇතුළත් කරගනු ලබන මුළු ශිෂ්‍ය සංඛ්‍යාව, 1993/1994 හෝ 2002/2003 අධ්‍යයන වර්ෂයන්වලදී එම පාඨමාලාවට ඇතුළත් කරගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාවෙහි උපරිමයට වඩා අඩු නොවන අයුරින් තෝරාගැනේ .

නමුත්, කලා අධ්‍යයන පාඨමාලා සඳහා සිසුන් තෝරා ගැනීමට දිප ව්‍යාප්ත කුසලතා පදනම යොදා නොගන්නා අවස්ථාවක් පවතී.

එනම්, පහත සඳහන් කලා අධ්‍යයන පාඨමාලා සඳහා සිසුන් තෝරා ගන්නා ක්‍රමවේදයයි.

1. සංගීතය
2. නර්තනය
3. නාට්‍ය හා රංග කලා
4. දෘශ්‍ය කලා
5. දෘශ්‍ය හා තාක්ෂණික කලා
6. චිත්‍ර හා නිර්මාණ

ඉහත සඳහන් අධ්‍යයන පාඨමාලා සඳහා සිසුන් තෝරා ගැනීම දිස්ත්‍රික් කුසලතා පදනම මත සිදු වේ. එම ක්‍රමවේදය පහතින් විස්තර කර ඇත.

එමෙන්ම අනෙකුත් විෂය ධාරාවන්ට එනම් වාණිජ්‍ය, ජෛවීය විද්‍යා, භෞතීය විද්‍යා, ඉංජිනේරු තාක්ෂණවේදය සහ ජෛවපද්ධති තාක්ෂණවේදය යන විෂය ධාරාවන් සඳහාද ප්‍රවේශය පහත ක්‍රමවේදය අනුව සිදු කරනු ලබයි.

1. කිසියම් පාඨමාලාවක් සඳහා ඇති මුළු ස්ථාන සංඛ්‍යාවෙන් 40% ක් දක්වා දිප ව්‍යාප්ත කුසලතා පදනම මත පෙල ගැසූ ඉසෙඩ් ලකුණු අනුව සිසුන් තෝරා ගැනීම සිදු කෙරේ.

2. ඉතිරි 60% න් 55% ක් දක්වා දිස්ත්‍රික් කුසලතා පදනම මත සිසුන් තෝරා ගැනේ. යම් දිස්ත්‍රික්කයකින් දිප ව්‍යාප්ත කුසලතා පදනම මත කිසියම් අධ්‍යයන පාඨමාලාවක් සඳහා තෝරා ගන්නා සිසුන්ට (40%) අමතරව, දිස්ත්‍රික් කුසලතා පදනම යටතේ තවත් 55% ක් දක්වාද අමතර සිසුන් සංඛ්‍යාවක් තෝරා ගැනේ. ඒ අනුව, එක් එක් පාඨමාලාවේ ඇති ස්ථාන සංඛ්‍යාවෙන් 55% ක් දක්වා, පරිපාලන දිස්ත්‍රික්ක 25 අතර එක් එක් දිස්ත්‍රික්කයේ ජනගහනයට සමානුපාතිකව එනම්, ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් ඒ ඒ දිස්ත්‍රික්කයේ ජන සංඛ්‍යා අනුපාතය අනුව බෙදා හැරේ.

3. මීට අමතරව, දිස්ත්‍රික්ක 16 ක් අධ්‍යාපන පහසුකම් අතින් දුෂ්කර යැයි හඳුනාගෙන ඇත. ඒ අනුව ඉතිරි 5%, එම දිස්ත්‍රික්ක 16 හි සිසුන් අතරෙහි බෙදා දෙනු ලැබේ. මෙහිදී එම ස්ථාන සංඛ්‍යාව දිස්ත්‍රික්ක 16 හි

මුළු ජනගහනයෙන් ඒ ඒ දිස්ත්‍රික්කයේ ජනසංඛ්‍යා අනුපාතය අනුව බෙදා වෙන් කරනු ලැබේ. මෙම 5%, එක් දිස්ත්‍රික්කයක් සඳහා පමණක් නොව දිස්ත්‍රික්ක 16 අතරම බෙදා හැරේ.

අධ්‍යාපන පහසුකම් අතින් දුෂ්කර යයි සලකනු ලබන දිස්ත්‍රික්ක 16 වන්නේ;

1. නුවරඑළිය
2. හම්බන්තොට
3. යාපනය
4. කිලිනොච්චිය
5. මන්නාරම
6. මුලතිව්
7. වව්නියා
8. ත්‍රිකුණාමලය
9. මඩකලපුව
10. අම්පාර
11. පුත්තලම
12. අනුරාධපුරය
13. පොලොන්නරුව
14. බදුල්ල
15. මොණරාගල
16. රත්නපුර

**කෙසේ වෙතත්, කිසියම් පාඨමාලාවකට සිසුන් තෝරා ගැනීමේදී දිස්ත්‍රික්ක පදනම මත වෙන්කරනු ලබන පංගු ප්‍රමාණය (එනම් 55% සහ 5% ක එකතුව) 1993/1994 හෝ 2002/2003 අධ්‍යයන වර්ෂයන්වලදී ඒ ඒ පාඨමාලාවලට ඇතුළත් කරගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාවෙහි උපරිමයට වඩා අඩු නොවන අයුරින් සිදුකෙරේ.**

**විශ්වවිද්‍යාල වලට සිසුන් අනුයුක්ත කිරීමේදී පැන නගින ප්‍රායෝගික ගැටළු සහ අනෙකුත් නොවැලැක්විය හැකි හේතු සාධක හේතුවෙන් ඒ ඒ පාඨමාලාවට තෝරා ගනු ලබන මුළු ශිෂ්‍ය සංඛ්‍යාව ඒ ඒ අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාලවලින් යෝජිත ප්‍රවේශ සංඛ්‍යාවලින් වෙනස් විය හැකි බව සැලකිය යුතුය. එම සංඛ්‍යා ඒ ඒ විශ්වවිද්‍යාල අතර බෙදී යන ආකාරය ආසන්න වශයෙන් මෙම අත්පොතෙහි ඇමුණුම (ආ) හි දක්වා ඇත.**

මෙම අත්පොතෙහි හයවන කොටසේ දක්වා ඇති පරිදි විශේෂ විධිවිධාන යටතේද එම ඡේදවල දක්වා ඇති කොන්දේසිවලට යටත්ව සීමිත සිසුන් සංඛ්‍යාවක් තෝරා ගැනේ.

## 1.2 විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම්

2017/2018 අධ්‍යයන වර්ෂයට අදාළව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සිසුන් තෝරා ගැනීම විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද වර්ෂ 2017 දී පැවති අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී අයදුම්කරුවන් ලබාගත් ඉසෙඩ් ලකුණුවල සාමාන්‍ය අනුව පෙළගැස්වූ කුසලතා අනුපිළිවෙල මත පදනම්ව සිදුකරනු ලැබේ.

විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා ඇති බවට නිවේදනය කර ඇති අපේක්ෂකයන් ;

(අ) තුන්වරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස (උසස් පෙළ) අනුමත විෂයයන් තුනටම අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

(ආ) සාමාන්‍ය පොදු ප්‍රශ්න පත්‍රයෙන් ද 30% කට නොඅඩු ලකුණු ප්‍රමාණයක් ලබා තිබිය යුතුය.

- **සාමාන්‍ය පොදු ප්‍රශ්න පත්‍රයට 30% ක් හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබාගැනීමට අපොහොසත් වූ අපේක්ෂකයන්, ඉසෙඩ් අගය අනුව ඔවුන් යම්කිසි විශ්වවිද්‍යාලයක පාඨමාලාවකට මෙම අධ්‍යයන වර්ෂයේදී තේරී පත් වුවහොත් එම තේරී පත් වූ පාඨමාලාවේ ලියාපදිංචි වීම සඳහා සුදුසුකම් නොලබයි.**

රහසිගතයි.

පිටපත්: ජනාධිපති ලේකම්.
අග්‍රාමාත්‍ය ලේකම්.
මුදල් හා ක්‍ර./ලේ.
අධ්‍යාපන/ලේ.
විගණකාධිපති.

මගේ අංකය: අමප/12/0111/521/004
2012 පෙබරවාරි මස 10 දින,
කොළඹ, අමාත්‍ය මණ්ඩල කාර්යාලයේදී

උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

2011/2012 අධ්‍යයන වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රවේශ
අත්පොත යාවත්කාලීන කිරීම

(උසස් අධ්‍යාපන ගරු ඇමතිතුමා ඉදිරිපත් කළ 2012-01-16 දි සංදේශය)

2012 පෙබරවාරි මස 01 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණයක් අවශ්‍ය කටයුතු සඳහා මේ සමග එවා ඇත.

එල්.පී.ජයම්පති,
අතිරේක ලේකම්.

අ.කලේ/එස්.අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

(ආ) න්‍යාය පත්‍රයේ විෂයයන්:

(I) අමාත්‍ය මණ්ඩල පත්‍රිකා:

14. අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 12/0111/521/004 වූ, "2011/2012 අධ්‍යයන වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොත යාවත්කාලීන කිරීම" යන මැයෙන් උසස් අධ්‍යාපන ඇමතිතුමා ඉදිරිපත් කළ 2012-01-16 දිනැති සංදේශය - (අමප අංක 95/0422/108/028 පිළිබඳව වූ 1995-03-08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අදාළ) ඉහත සංදේශය මුදල් හා ක්‍රමසම්පාදන ඇමතිතුමාගේ නිරීක්ෂණ සමග සලකාබලන ලදී. මේ පිළිබඳව සාකච්ඡා කිරීමෙන් අනතුරුව, සංදේශයේ 07 ඡේදයේ සඳහන් යෝජනා සඳහා අනුමැතිය දෙන ලදී. 2012/2013 අධ්‍යයන වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොත ප්‍රකාශයට පත්කිරීමට ප්‍රථමයෙන්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ අනෙකුත් අදාළ බලධාරීන් විමසමින්, විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා දැනට යොදාගනු ලබන නිර්ණායක සමාලෝචනය කොට, ඒ පිළිබඳව වාර්තාවක් අමාත්‍ය මණ්ඩලය විසින් සලකා බැලීම පිණිස, ඇමතිතුමා මාර්ගයෙන් ඉදිරිපත් කළයුතු බවට ද තීරණය කරන ලදී.

ක්‍රියා කළයුතු: උසස් අධ්‍යාපන අමාත්‍යාංශය - ඉහත නිරීක්ෂණ යාකොට ඇත.

පිටපත්: මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
අධ්‍යාපන අමාත්‍යාංශය - සංදේශයේ පිටපතක් සහ ඉහත නිරීක්ෂණ යාකොට ඇත.

## (B) Agenda Items :

## (III) Cabinet Papers

14. Cabinet Paper No.12/0111/521/004, a Memorandum dated 2012-01-16 by the Minister of Higher Education on "Update and Review the University Admissions Handbook for the Academic Year 2011/2012" - (Cabinet decision dated 1995-03-08 on CP No.95/0422/108/028 refers) the above Memorandum was considered along with the observations of the Minister of Finance and Planning. After discussion, approval was granted to the proposals in paragraph 07 of the Memorandum. It was also decided that action should be taken by the Secretary, Ministry of Higher Education to review the existing criteria for admission to Universities, in consultation with the University Grants Commission and other relevant authorities and submit a report to the Cabinet, through the Minister, for consideration, prior to the publication of the University Admissions Handbook for the Academic Year 2012/2013.

Action by: My/Higher Education - above observations annexed.

Copied to: My/Finance and Planning
My/Education - copy of Memorandum and above observations annexed.

(14)

# මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
# நிதி, திட்டமிடல் அமைச்சு
# MINISTRY OF FINANCE AND PLANNING

ප්‍රධාන අංශය 13 MAR 2012

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01 Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: 2484500, 2484600, 2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)- 11 - 2449823
වෙබ් අඩවිය / வெப் தளம் / Website: www.treasury.gov.lk

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | NPD/HDC/HE/CM/02/12 | ඔබේ අංකය / உமது இல. / Your No. | 12/0111/521/004 | දිනය / திகதி / Date | 2012 .02. |

අමාත්‍ය මණ්ඩල සංදේශය

<u>මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයාගේ නිරීක්ෂණ</u>

අමාත්‍යාංශය : උසස් අධ්‍යාපන

ශීර්ෂය සහ දිනය : 2011/2012 අධ්‍යයන වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොත යාවත්කාලීන කිරීම

2012.01.16

යෝජනා/ඉල්ලීම : පහත සඳහන් යෝජනා සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය අපේක්ෂා කෙරේ.

අ. කලා පාඨමාලා සඳහා විශ්වවිද්‍යාල ප්‍රවේශය 100% ක් දීප ව්‍යාප්ත කුසලතා පදනම මත සිදු කිරීම

ආ. කලා පාඨමාලා හැර සෑම අධ්‍යයන පාඨමාලාවක් සඳහා ම පවත්නා ස්ථාන වලින් 40% ක් දක්වා, දීප ව්‍යාප්ත කුසලතා පදනම මත පෙළ ගසන ලද Z ලකුණු අනුපිළිවෙල අනුව විශ්වවිද්‍යාල ප්‍රවේශය සිදු කිරීම

ඇ. කලා පාඨමාලා හැර සෑම අධ්‍යයන පාඨමාලාවකට ඇති ස්ථාන සංඛ්‍යාවෙන් 55% ක් දක්වා, පරිපාලන දිස්ත්‍රික්ක 25 අතර එක් එක් දිස්ත්‍රික්කයේ ජනගහනයට සමානුපාතිකව, එනම් ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් ඒ ඒ දිස්ත්‍රික්කයේ ජන සංඛ්‍යා අනුපාතය අනුව බෙදා හැරීම

ඈ. එක් එක් පාඨමාලාවේ ඇති ස්ථාන සංඛ්‍යාවෙන් 5% දක්වා වූ පංගු ප්‍රමාණයක් අධ්‍යයන පහසුකම් අතින් දුෂ්කර යයි සලකනු ලබන ඇමුණුම 1න් දක්වා ඇති දිස්ත්‍රික්ක 16 අතර, එම දිස්ත්‍රික්ක 16 හි මුළු ජනගහනයෙන් ඒ ඒ දිස්ත්‍රික්කයේ ජන සංඛ්‍යා ප්‍රතිශතය අනුව බෙදා හැරීම

ඉ. ඉහත සඳහන් පරිදි දිස්ත්‍රික් පංගු ප්‍රමාණයන් තීරණය කිරීමේදී, ඒ ඒ දිස්ත්‍රික්කයට නියමිත පංගු ප්‍රමාණය 1993/1994 හෝ 2002/2003 අධ්‍යයන වර්ෂයන් සඳහා වෙන් කරන ලද පංගු ප්‍රමාණයෙහි උපරිමයට අඩු නොවන පරිදි සිදු කිරීම

නිරීක්ෂණ : විශ්වවිද්‍යාල වලට සිසුන් ඇතුලත් කර ගැනීම සඳහා දැනට ක්‍රියාත්මක විශ්වවිද්‍යාල ප්‍රවේශ ප්‍රතිපත්තිය මගින් පාඨමාලා සඳහා සිසුන් තෝරා ගැනීම කිසිදු ගැටළුවකින් තොරව සාර්ථකව සිදුකරගෙන යනු ලබයි. එබැවින් ඉහත ක්‍රමවේදය මේ දක්වා විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොතට ඇතුලත් කර නොමැතිනම් මේ අවස්ථාවේදී එම අත් පොතට මෙම ක්‍රමවේදය ඇතුලත් කිරීම යෝග්‍ය නොවේ යැයි නිරීක්ෂණය කරමි. 2012 වර්ෂයේදී ජන සංගණනය සිදු කර අවසන් කිරීමට නියමිත බැවින් එම දත්ත අනුව විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොත යාවත්කාලීන කිරීම සුදුසු වේ.

මහින්ද රාජපක්ෂ
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය

# UNIVERSITY GRANTS COMMISSION

INTERNAL AUDIT CIRCULAR LETTER : 02/2018

No.20, Ward Place,
Colombo 07
17.12.2018

Vice-Chancellors of Universities
Rectors of Campuses
Directors of Institutes

## RECOVERY OF BOND VALUES OF VIOLATED BONDS AND AGREEMENTS

The Commission at its 996th meeting held on 04th October 2018 having considered the list of long outstanding bonds, recommendations of the Audit Committee and the Management Committee granted approval for the following remedial actions.

i. To strictly advice to HEIs to give effect to the provisions given in the UGC and the Higher Educational Institutions Establishments Code which is mentioned in paragraph 7 of Chapter V and entrust the Internal Auditor of the relevant HEIs to follow up the implementation of the same.

ii. To advice the HEIs to establish Bond Recovery Review Committees within the HEIs.

iii. To advice the Establishment Divisions of the HEIs to submit its progress half yearly to the Audit Committee of the University to enable the Audit Committee to make its recommendations to the Council.

iv. To conduct awareness programmes to officers who handle the subject of bonds and agreements in the HEIs to enable them to execute enforceable bonds and agreements.

Please take action accordingly.

Prof. Mohan de Silva
Chairman

Copies
1. Secretary/Ministry of Education & Higher Education
2. Chairman's Office/UGC
3. Vice-Chairman/UGC
4. Members of the UGC
5. Secretary/UGC
6. Deans of Faculties
7. Registrars of Universities
8. Internal Auditor/UGC
9. Accountant/UGC
10. Bursars of Universities
11. Librarians/SAL/AL of the Higher Educational Institutions/Institutes
12. Deputy Registrars/ Snr. Asst. Registrars/ Asst. Registrars of Campus /Institutes
13. Deputy Bursars/Snr .Asst. Bursars/ Asst. Bursars of Campuses/ Institutes
14. Deputy Internal Auditors / Snr. Asst. Int. Auditors/ Asst. Int. Auditors of HEIs
15. Auditor –General
16. Govt. Audit Superintendents of Universities
17. Secretaries of Trade Unions

File No. UGC/CIA/F/IA Cir./1

(ඇ) චංචල හෝ නිශ්චල යන දෙවර්ගයේ ම දේපළ, මිලට ගැනීමෙන් හෝ අන්‍යාකාරයකින් අත්කර ගැනීම සහ එකී මිලට ගැනීමක් ප්‍රකාර හෝ ප්‍රදානයකින් හෝ ත්‍යාගයකින්, බද්දකින්, අන්තිම කැමැති පත්‍රයක් මගින් වූ දීමනාවකින් හෝ අන්‍යාකාරයකින් එය වෙත පැවරෙන එකී දේපළක් ගැනීම, භාර ගැනීම සහ අයත්ව සිටීම;

(ඈ) එකී දේපළක් විකිණීම, උකස් කිරීම, බදු දීම, හුවමාරු කර ගැනීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම:

එසේ වුව ද යම් දේපළක් විශ්වවිද්‍යාලය වෙත පවරනු ලැබුවේ යම් නීතියක්, උචිත සාධන පත්‍රයක් හෝ නියමයක් මගින් ද ඒ නීතියෙන්, සාධන පත්‍රයෙන් හෝ නියමයෙන් ඇති කරන ලද සීමා කිරීමක්, කොන්දේසියක් හෝ තහනම් කිරීමක් කඩ කරමින් එකී දේපළ විකුණන ලද්දේ නම්, උකස් කරන ලද්දේ නම්, බදු දෙන ලද්දේ නම්, හුවමාරු කරන ලද්දේ නම් හෝ අන්‍යාකාරයකින් බැහැර කරන ලද්දේ නම්, ඒ විකිණීම, උකස් කිරීම, බදු දීම, හුවමාරු කිරීම හෝ බැහැර කිරීම නිර්බල වන්නේ ය; තව ද

(ඉ) මේ පනතින් හෝ යම් උචිත සාධන පත්‍රයකින් විශ්වවිද්‍යාලය වෙත පවරනු ලැබූ හෝ නියම කරනු ලැබූ සියලු බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම.

(2) මේ පනතින් හෝ යම් උචිත සාධන පත්‍රයකින් අන්‍යාකාර විධිවිධාන ප්‍රකාශිතව ම සලස්වා ඇත්තේ නම් මිස, මේ වගන්තියේ ඉහත සඳහන් විධිවිධානවලින් විශ්වවිද්‍යාලයක් වෙත පවරනු ලැබූ බලතල විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් ක්‍රියාත්මක කළ යුතු ය.

29. කොමිෂන් සභාවේ බලතල, කාර්ය හා කර්තව්‍යවලට යටත්ව, විශ්වවිද්‍යාලයකට පහත සඳහන් කටයුතු කිරීමට බලය ඇත්තේ ය :— විශ්වවිද්‍යාලයක බලතල.

(අ) ශිෂ්‍යයන් ඇතුල් කර ගැනීම හා අනුමත කරන ලද යම් අධ්‍යයන ක්ෂෙත්‍රයක ඉගැන්වීම සඳහා විධිවිධාන සැලැස්වීම;

(ආ) විවිධ අධ්‍යයන ක්ෂේත්‍රවල ප්‍රවීණත්වය ලැබූ තැනැත්තන් නිශ්චය කිරීමේ කාර්යය සඳහා විභාග පැවැත්වීම;

(ඇ) විශ්වවිද්‍යාලයේ පරමාර්ථවලට සමාන හෝ සාරානුකූලව සමාන පරමාර්ථ ඇති ශ්‍රී ලංකාවේ හෝ පිටරට වෙනත් විශ්වවිද්‍යාල හෝ ආයතන සමග, ආචාර්යවරයන්, ශිෂ්‍යයන් හා ශාස්ත්‍රධරයන් හුවමාරු කර ගැනීමෙන් හෝ අන්‍යාකාරයකින් සහයෝගයෙන් ක්‍රියා කිරීම;

(ඈ) පශ්චාත් උපාධි පාඨමාලා පැවැත්වීම හා ඒ කාර්යය සඳහා ශ්‍රී ලංකාවේ හෝ පිට රට වෙනත් විශ්වවිද්‍යාල හෝ බලධරයන් සමග විශ්වවිද්‍යාලය විසින් තීරණය කරන ආකාරයකින් හා එසේ තීරණය කරන කාර්ය සඳහා සහයෝගයෙන් ක්‍රියා කිරීම;

(ඳ) විශ්වවිද්‍යාලයෙහි හෝ යම් පිළිගත් ආයතනයක අනුමත කරන ලද පාඨමාලා හදාරා විශ්වවිද්‍යාලයෙහි අතුරු ව්‍යවස්ථාවකින් නියමිත විභාගවලින් සාමාර්ථය ලැබූ තැනැත්තන්ට හා තැනැත්තන් වෙත උපාධි, අභිඥාන පත්‍ර හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීම හා පිරිනැමීම ;

(ඊ) විශ්වවිද්‍යාලයෙහි හෝ යම් පිළිගත් ආයතනයක ශිෂ්‍යයන් නොවන තැනැත්තන්ට විශ්වවිද්‍යාලයේ උපාධි, අභිඥාන පත්‍ර හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ලබා ගැනීමට හැකි වන පරිදි, කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව, බාහිර විභාග පැවැත්වීම ;

(උ) විශ්වවිද්‍යාලයෙහි හෝ යම් පිළිගත් ආයතනයක ශිෂ්‍යයන්ව නොසිටිමින් විශ්වවිද්‍යාලයේ බාහිර විභාගවලින් සාමාර්ථය ලැබූ තැනැත්තන්ට උපාධි, අභිඥාන පත්‍ර හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා, කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව, ප්‍රදානය කිරීම හා පිරිනැමීම ;

(ඌ) අතුරු ව්‍යවස්ථාවකින් නියම කරනු ලැබිය හැකි කොන්දේසි පිට වෙනත් විශ්වවිද්‍යාලවල උපාධිධාරීන් හෝ ශිෂ්‍යයන් විශ්වවිද්‍යාලයේ සම තත්ත්වයේ හෝ සමාන උපාධිවලට හා පාඨමාලාවලට ඇතුල් කර ගැනීම හා ඔවුන් විශ්වවිද්‍යාලයේ උපාධිධාරීන් හා ශිෂ්‍යයන් ලෙස ලියාපදිංචි කිරීම ;

(එ) විශ්වවිද්‍යාලයක සෙනෙට් සභාව විසින් නිර්දේශ කරනු ලැබ ඒ විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් අනුමත කරන ලද තැනැත්තන්ට සම්මාන උපාධි හෝ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා පිරි නැමීම ;

(ඒ) අතුරු ව්‍යවස්ථාවකින් නියම කරනු ලැබිය හැකි පරිදි, විශ්වවිද්‍යාලයට ඇතුල්වීමට අපේක්ෂා කරන තැනැත්තන් හෝ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන් වෙනත් විශ්වවිද්‍යාලවල දී හෝ විශ්වවිද්‍යාල තත්ත්වයේ අධ්‍යාපන ආයතනවල දී සාමාර්ථය ලත් විභාග හා ගත කළ අධ්‍යයන කාල සීමාව විශ්වවිද්‍යාලයේ එවැනි විභාගවලට හා එවැනි අධ්‍යයන කාල සීමාවලට හෝ, ඉන් යම් කොටසකට සමාන ලෙස පිළිගැනීම හා ඕනෑම අවස්ථාවක ඒ පිළිගැනීම ඉවත් කර ගැනීම ;

(ඔ) විශ්වවිද්‍යාලයේ කාර්ය සඳහා පුස්තකාල, රසායනාගාර හා වෙනත් ගොඩනැගිලි ඉගැන්වීමේ හෝ පදිංචිවීමේ කාර්ය සඳහා ඉදි කිරීම, ඒවාට උපකරණ සැපයීම හා ඒවා පවත්වා ගෙන යාම ;

(ඕ) මහාචාර්ය තනතුරු, සහාය මහාචාර්ය තනතුරු, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරු හෝ කථිකාචාර්ය තනතුරු හා විශ්වවිද්‍යාලයේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි වෙනත් තනතුරු ඇති කිරීම ;

(ක) අධිශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ඡාත්‍ර දක්ෂිණා, ආධාර ශිෂ්‍යත්ව, පදක්කම් හා වෙනත් ත්‍යාග ඇති කිරීම හා ප්‍රදානය කිරීම ;

ලැබූ සිවිල් හෝ අපරාධ නඩුවක් සම්බන්ධයෙන් ඔහුට දැරීමට සිදු වන යම් වියදමක්, ඔහු විසින් ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලද්දේ යයි අධිකරණය පිළිගනිත හොත්, ඔහු විසින් ඒ වියදම ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී අයකර ගන්නා ලද්දේ නම් මිස, කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(4) කොමිෂන් සභාවට විරුද්ධව ගෙන එනු ලබන යම් නඩුවක දී කොමිෂන් සභාවේ සාමාජිකයකුට හෝ ඔහුගේ දේපළට විරුද්ධව පිට බලපත්‍රයක් නිකුත් නො කළ යුතු ය.

## II වන කොටස

### විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ බලතල, කාර්ය හා කර්තව්‍ය

මේ කොටසේ මතු දැක්වෙන විධිවිධාන වෙනත් ඇතැම් විධිවිධාන ක්‍රියාත්මකවීම කෙරෙහි හානිකර නොවන බව.

**14.** කොමිෂන් සභාව වෙත යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍ය යක් පවරන හෝ නියම කරන මේ පනතේ වෙන යම් කොටසක විධිවිධාන ක්‍රියාත්මකවීම කෙරෙහි මේ කොටසේ මතු දැක්වෙන විධි විධාන හානිකර නොවන්නේ ය.

කොමිෂන් සභාවේ බලතල.

**15.** කොමිෂන් සභාව විසින් පහත සඳහන් බලතල සියල්ලම හෝ ඉන් යම් බලයක් හෝ දරා ක්‍රියාත්මක කළ යුත්තේ ය:—

(i) එක් එක් උසස් අධ්‍යාපන ආයතනයේ මුදල් අවශ්‍යතා සම්බන්ධයෙන් කලින් කල පරීක්ෂණ හෝ විමර්ශන පැවැත්වීම;

(ii) එක් එක් උසස් අධ්‍යාපන ආයතනයේ පාලක බල මණ්ඩලය විමසා ඒ උසස් අධ්‍යාපන ආයතනයේ නඩත්තුව හා සංවර්ධනය හෝ වෙන යම් සාමාන්‍ය හෝ විශේෂ කාර්යයක් සඳහා ත්‍රෛවාර්ෂික අය වැය වාර්තා කලින් කල පිළියෙළ කිරීම;

(iii) එක් එක් උසස් අධ්‍යාපන ආයතනයට රජයේ අරමුදලින් යම් මුදලක් ප්‍රදානය කිරීම අවශ්‍ය නම් නැතහොත් අභිමත නම්, ඒ මුදලෙහි ස්වභාවය හා ප්‍රමාණය සම්බන්ධයෙන් කලින් කල අමාත්‍යවරයා වෙත නිර්දේශ කිරීම;

(iv) පඩි හා වැටුප් පිළිබඳ ආණ්ඩුවේ සමස්ත ප්‍රතිපත්තියට අනුකූලව, උසස් අධ්‍යාපන ආයතනවල කාර්ය මණ්ඩලයේ විවිධ ශ්‍රේණිවලට ගෙවිය යුතු පාරිශ්‍රමික ප්‍රමාණය හා කාර්ය මණ්ඩලයට ලැබිය යුතු වෙනත් ප්‍රතිලාභවල ස්වභාවය හා ප්‍රමාණය කලින් කල නිශ්චය කිරීම;

(v) එක් එක් උසස් අධ්‍යාපන ආයතනයෙහි පැවැත්විය යුතු පාඨමාලා ද ප්‍රදානය කළ යුතු උපාධි, අභිඥාන පත්‍ර හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා ද ඒ එක් එක් උසස් අධ්‍යාපන ආයතනයේ පාලක බල මණ්ඩලය විමසීමෙන් පසු නිශ්චය කිරීම ;

(vi) එක් එක් උසස් අධ්‍යාපන ආයතනයට වාර්ෂිකව ඇතුල් කළ යුතු මුළු ශිෂ්‍ය සංඛ්‍යාව හා ඒ ශිෂ්‍ය සංඛ්‍යාව එහි විවිධ පාඨමාලාවලට වෙන් කරන ආකාරය, ඒ එක් එක් උසස් අධ්‍යාපන ආයතනයේ පාලක බල මණ්ඩලය විමසීමෙන් පසු නිශ්චය කිරීම ;

(vii) නියමාවලි මගින් සංයුතිය, බලතල, කාර්ය හා කාර්යභාර නියම කරනු ලැබූ ප්‍රවේශ කමිටුවක් විමසීමෙන් පසු, එක් එක් උසස් අධ්‍යාපන ආයතනයට ඇතුල් කර ගැනීම සඳහා ශිෂ්‍යයන් තෝරා ගැනීම ;

(viii) විශ්වවිද්‍යාලයේ හෝ යම් පිළිගත් ආයතනයක ශිෂ්‍යයන් නොවන තැනැත්තන්ට විශ්වවිද්‍යාලයේ උපාධි, අභිඥාන පත්‍ර හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා ලබා ගැනීමට හැකි වන සේ එක් එක් විශ්වවිද්‍යාලය විසින් පැවැත්විය යුතු බාහිර පරීක්ෂණ ඒ එක් එක් විශ්වවිද්‍යාලයේ පාලක බල මණ්ඩලය විමසීමෙන් පසු නිශ්චය කිරීම ;

(ix) උසස් අධ්‍යාපන ආයතනවල කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ පරිපාටි සහ පත්කිරීමේ ක්‍රම සකස් කිරීම ;

(x) යම් උසස් අධ්‍යාපන ආයතනයක ප්‍රධාන විධායක නිලධරයා විසින් කොමිෂන් සභාවේ සැලකිල්ලට යොමුකරනු ලබන්නා වූ ද ඒ උසස් අධ්‍යාපන ආයතනයේ ශිෂ්‍යයන්ගේ විනයට අදාළ වන්නා වූ ද කරුණු විමර්ශනය කිරීම හෝ විමර්ශනය කිරීමට සැලැස්වීම හා ඒ පිළිබඳව ප්‍රතිකර්ම පියවර ගැනීම ; සහ

(xi) මේ පනතෙහි නිශ්චිතව සඳහන් බලතල ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ද 3 වන වගන්තියෙහි දැක්වෙන අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා ද අවශ්‍ය වන වෙනත් සියලු ක්‍රියා හෝ දේ කිරීම.

**16.** කොමිෂන් සභාවේ එක් එක් මුදල් වර්ෂය ඉකුත් වී මාස හයක කාලයක් ඉකුත් වන්නට පෙර, ඒ වර්ෂයේ කොමිෂන් සභාවේ වැඩ කටයුතු පිළිබඳ සම්පූර්ණ තොරතුරු ඇතුළත් වාර්තාවක් කොමිෂන් සභාව විසින් අමාත්‍යවරයා වෙත යැවිය යුතු අතර අමාත්‍යවරයා එහි පිටපත් පාර්ලිමේන්තුව ඉදිරියේ සභාගත කිරීමට සැලැස්විය යුතු ය. කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන මිලකට ඒ වාර්තාවේ පිටපත් මහජනයාට ලබාගැනීමට කොමිෂන් සභාව විසින් සැලැස්විය යුතු ය. කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව.

ඇමුණුම - 09

බාහිර උපාධි පාඨමාලා පවත්වන විශ්වවිද්‍යාල හා පවත්වනු ලබන උපාධි පාඨමාලා

| | University | Degree Name |
|---|---|---|
| 01. | University of Colombo | Batchelor of Sciencein in Electronics & Automation |
| | | Batchelor of Infroemation Technology |
| | | Batchelor of Science in Financial Engineering |
| 02. | University of Peradeniya | Batchelor of Business Adminstration |
| | | Batchelor of Arts (General) |
| 03. | University of Sri Jayawardenapura | B.Sc. Business Admintration (General) |
| | | Batchelor of Humanities & Social Sciences |
| | | Batchelor of Arts in English (General) |
| | | B.Sc. Management (Public) General |
| | | Batchelor of Commerce (General) |
| | | Batchelor of Social Sciences (General) in Environment and Development Studies |
| 04. | University of Moratuwa | Batchelor of Information Technology |
| 05. | Wayamba University of Sri Lanka | Batchelor of Science in Plantation Management |
| 06. | University of Kelaniya | B.Sc. (Physiotheraphy) Diploma – to- Degree upgrade |
| | | Batchelor of Science (Speech & Language Therapy) |
| | | Batchelor of Science (Occupational Therapy) |
| | | Batchelor of Commerce (Special) |
| | | Batchelor of Science (General) |
| | | Batchelor of Business Management |
| | | Batchelor of Arts |

| | | |
|---|---|---|
| 07. | Rajarata University of Sri Lanka | Batchelor of Business Admintration |
| | | Batchelor of Business Admintration (General) |
| 08. | Univesity of Ruhuna | Batchelor of Arts |
| 09. | Sabaragamuwa University of Sri Lanka | Batchelor of Business Admintration (Agribusiness Management) |
| | | Certifiacate in IT |
| | | Certifiacate in English |
| | | Higher Diploma in Corporative Management |
| 10. | University of Jaffna | Batchelor of Commerce |
| 11. | South Eastern University of Sri Lanka | Batchelor of Commerce (B.Com) General |
| | | Batchelor of Business Admintartion (General) |
| | | Batchelor of Arts (BA) General |
| 12. | University of the Visual & Performing Arts | Batchelor of Performing Arts (External) General |
| 13. | Eastern University, Sri Lanka | Batchelor of Business Management (External) General |

ඇමුණුම - 10

# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

කොමිෂන් සභා චක්‍රලේඛ අංක: 01/2016

අංක 20, වෝඩ් පෙදෙස
කොළඹ 07

2016 ජනවාරි මස 1 වැනිදා

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

**බාහිර උපාධි සහ විස්තාරිත පාඨමාලා මධ්‍යස්ථාන /ඒකක කළමනාකරණය සඳහා සහ බාහිර විභාග පැවැත්වීම සහ ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා ගෙවීම් අනුපාතික තීරණය කිරීම සඳහා වන මාර්ගෝපදේශ**

ඉහත කරුණ සම්බන්ධව 2005.04.26 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 861 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

බාහිර උපාධි සහ විස්තාරිත පාඨමාලා පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ස්ථාවර කමිටුව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ සැලකීමෙන් අනතුරුව, බාහිර උපාධි සහ විස්තාරිත පාඨමාලා මධ්‍යස්ථාන /ඒකක (EDP මධ්‍යස්ථාන /ඒකක) කළමනාකරණය සඳහා සහ බාහිර විභාග පැවැත්වීම සහ ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා ගෙවීම් අනුපාතික තීරණය කිරීම සඳහා වූ මාර්ගෝපදේශ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී. ඒ අනුව, දැන ගැනීම සහ අනුකූලතාව සඳහා මෙම චක්‍රලේඛයෙහි සඳහන් මාර්ගෝපදේශ සියලුම විශ්වවිද්‍යාල/ උසස් අධ්‍යාපන ආයතන /ආයතන වෙත නිකුත් කෙරේ.

විභාග සහ ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා ගෙවිය යුතු සත්‍ය ගාස්තු ප්‍රමාණයන්. කෙසේ නමුත්, තීරණය කළ යුතු වන්නේ බාහිර උපාධි මධ්‍යස්ථානය /ඒකකය විසින් යෝජනා කරන ලද සහ විශ්වවිද්‍යාලයේ මූල්‍ය කමිටුව සහ පාලක සභාව විසින් අනුමත කරන ලද වාර්ෂික අයවැය පදනම් කොට ගෙන ය. එබැවින්, අරමුණු කර ගත් දළ ආදායම සහ (අ) පොදු කාර්ය ගාස්තු (ආ) උපයෝගිතා ගාස්තු (ඇ) විශ්වවිද්‍යාලය, පීඨය, අධ්‍යනාංශය සහ මධ්‍යස්ථාන සංවර්ධන අරමුදලට දායකත්වය පිණිස වෙන් කළ යුතු අනුගම්‍ය අඩු කිරීම් සැලකිල්ලට ගනිමින් මෙහි සඳහන් කර ඇති ගෙවීම් සඳහා වූ ඉහළ සීමාවන්, ගෙවිය යුතු සත්‍ය අනුපාතික තීරණය කිරීමේ මාර්ගෝපදේශයක් වශයෙන් භාවිත කළ යුතු වේ.

මෙම චක්‍රලේඛයෙන් නියම කර ඇති පරිදි, චක්‍රලේඛයෙහි ලැයිස්තුගත සියලුම සේවා සහ අයිතමයන් සඳහා ගෙවීම් සිදු කිරීමට අවශ්‍ය අරමුදල් බාහිර උපාධි මධ්‍යස්ථානයේ /ඒකකයේ උපයාගත් අරමුදල් මඟින් ලබා ගත යුතු අතර, අමුණා ඇති උපලේඛනයෙහි නියම කර ඇති ඉහළ සීමා අනුපාතික 2016.01.01 දින සිට ක්‍රියාත්මක වන අතරතුර අනෙකුත් ගෙවීම් සහ අනුපාතික, විශ්වවිද්‍යාලය සහ ලෝක බැංකු - විසි එක්වන සියවස සඳහා උසස් අධ්‍යාපන ව්‍යාපෘතියේ (WB-HETC) ව්‍යාපෘති සැලසුම් සහ සංවර්ධන ඒකකය (PPDU) අතර HETC ව්‍යාපෘතිය - බාහිර උපාධි පාඨමාලා ප්‍රදාන ( HETC-EDP) සඳහා ගිවිසුම අත්සන් කළ දින සිට ක්‍රියාත්මක වේ.

2005.04.26 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 861 මෙයින් අවලංගු කෙරේ.

කරුණාකර ඒ අනුව කටයුතු කරන්න.

අ/කළේ: මහාචාර්ය මොහාන් ද සිල්වා
සභාපති

පිටපත්:
1. ලේකම් / උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍යාංශය
2. සභාපති කාර්යාලය / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. උප සභාපති / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයන්
5. ලේකම් / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරිවරුන්
8. ගණකාධිකාරී / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
9. විශ්වවිද්‍යාල මූල්‍යාධිකාරීවරුන්
10. උසස් අධ්‍යාපන ආයතන/ ආයතනවල පුස්තකාලයාධිපතිවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන් / සහකාර පුස්තකාලයාධිපතිවරුන්
11. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය ලේඛකාධිකාරිවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරිවරුන් / සහකාර ලේඛකාධිකාරිවරුන්
12. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරුන් / සහකාර මූල්‍යාධිකාරීවරුන්
13. අභ්‍යන්තර විගණක / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
14. විශ්වවිද්‍යාලවල රජයේ විගණක අධිකාරීවරුන්
15. උසස් අධ්‍යාපන ආයතනවල ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන්
16. වෘත්තීය සමිති ලේකම්වරුන්
17. විගණකාධිපති

ලිපි ගොනු අංකය :යූජීසී/එච්ආර්/6/2/3 (ඊඑක්ස්)

## බාහිර උපාධි සහ විස්තාරිත පාඨමාලා මධ්‍යස්ථාන /ඒකක කළමනාකරණය සඳහා සහ බාහිර පරීක්ෂණ පැවැත්වීම සහ ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා ගෙවීම් අනුපාතික තීරණය කිරීම සඳහා වන මාර්ගෝපදේශ

**1.** අර්ධ කාලීන පදනම මත පත් කරන ලද පරිපාලන තනතුරු දරන අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ගෙවිය යුතු දීමනා

| තනතුර / පැවරුම | අනුපාතිකය (රු) |
|---|---|
| අධ්‍යක්ෂ | ඔහුගේ / ඇයගේ නිත්‍ය තනතුරෙහි මූලික වැටුපෙන් 25% |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | ඔහුගේ / ඇයගේ නිත්‍ය තනතුරෙහි මූලික වැටුපෙන් 20% |
| අධ්‍යයන පාඨමාලා සමායෝජක | ඔහුගේ / ඇයගේ නිත්‍ය තනතුරෙහි මූලික වැටුපෙන් 15% |
| කළමනාකරණ මණ්ඩල රැස්වීම් (රැස්වීම් වාරයකට එක් සාමාජිකයෙක් සඳහා) | 2,000.00 |
| අධ්‍යයන මණ්ඩල (රැස්වීම් වාරයකට එක් සාමාජිකයෙක් සඳහා) | 1,500.00 |

**2.** විශ්වවිද්‍යාල මඟින් පවත්වනු ලබන බාහිර උපාධි පරීක්ෂණ සඳහා ගෙවීම් අනුපාතික (ඉහළ සීමා)

**2.1** අධ්‍යයන කාර්ය මණ්ඩලය

| | ක්‍රියාකාරකම | අනුපාතික ( ඉහළ සීමාවන්) (රු.) |
|---|---|---|
| | | අවසාන /වාර්ෂික පරීක්ෂණය *1 |
| අ | සෝද්‍ය පත් කියවීම ඇතුළත්ව පැය තුනක කාලයකින් යුතු ප්‍රශ්න පත්‍රයක් සැකසීම | 2,400.00 |
| ආ | සෝද්‍ය පත් කියවීම ඇතුළත්ව ප්‍රශ්න පත්‍රයක් පරිවර්තනය කිරීම | 750.00 |
| ඇ | නියන්ත්‍රණය / සුපරීක්ෂණය ( ප්‍රශ්න පත්‍රයක් සඳහා) | 1,200.00 |
| ඈ | පිළිතුරු පත්‍රයක් ලකුණු කිරීම සඳහා ( පිළිතුරු පත්‍රයක් සඳහා) *2 | 120.00 |

1

| | | |
|---|---|---|
| ඉ | ප්‍රායෝගික පරීක්ෂණයක් පිළියෙල කිරීම, පැවැත්වීම සහ ලකුණු ලබා දීම සඳහා පරීක්ෂකයකුට ලබා දෙන සංයුක්ත ගාස්තුව - අපේක්ෂකයන් 10දෙනෙකුගෙන් යුතු කණ්ඩායමක් සඳහා ( උපරිම වශයෙන් පරීක්ෂකයන් දෙදෙනෙකු (02)) පැය තුනක කාල පරිච්ඡේදයක් සඳහා | 2,000.00 |
| ඊ | පාඨමාලා කාලය තුළ ඇගයීම් සඳහා ලකුණු ලබා දීම -( පාඨමාලා ඒකකයක්/ සමාසිකයක් සඳහා උපරිමව පැවරුම් දෙකක් (02) සඳහා ක්‍රෙඩිට් අගය 2-4 වන | පැවරුමක් සඳහා 30.00 |
| උ | ශාස්ත්‍රීය නිබන්ධනය හෝ පර්යේෂණ නිබන්ධනය ඇගයීම ක්‍රෙඩිට් අගය මත - නිබන්ධනය හෝ ව්‍යාපෘති වාර්තාව මගින් පමණක් පාඨමාලාව ඇගයීමට ලක් කරන අවස්ථාවන්හි දී<br>ක්‍රෙඩිට් අගය 3-5<br>ක්‍රෙඩිට් 5කට වඩා වැඩි | <br><br><br><br>1000.00<br>2000.00 |
| ඌ | නිබන්ධනය සහ ව්‍යාපෘති වාර්තා අධීක්ෂණය ක්‍රෙඩිට් අගය මත පදනම්ව<br>ක්‍රෙඩිට් අගය 3-5<br>ක්‍රෙඩිට් 5කට වඩා වැඩි | <br><br>2500.00<br>5000.00 |
| එ | වාචික -සම්මුඛ පරීක්ෂණය ( එක් ශිෂ්‍යයකු සඳහා) *3 | 50.00 |

*1 සමාසික මට්ටමේ පරීක්ෂණ පවත්වන්නේ නම්, අවසන් /වාර්ෂික පරීක්ෂණ සඳහා අනුමත අනුපාතික භාවිතයෙන් සමාසික 2 සඳහා ගෙවිය යුතු මුළු මුදල වාර්ෂික පරීක්ෂණය සඳහා වන ඉහළ සීමාව ඉක්මවා නොයන පරිදි මධ්‍යස්ථානයේ කළමනාකරණ මණ්ඩලයට අදාළ අයිතම ( අ, ආ, ඇ, ඈ, සහ ඉ) සඳහා වන අනුපාතික තීරණය කළ හැකිය.

*2 පහත දක්වා ඇති පරිදි නියම කරන ලද කාලපරිච්ඡේදය තුළ අදාළ ප්‍රශ්නපත්‍රයේ ලකුණු ඉදිරිපත් කිරීම වෙනුවෙන් එක් පිළිතුරු පතක් සඳහා රු.30 බැගින් වන විශේෂ දීමනාවක් පරීක්ෂකවරුන්ට ගෙවනු ඇත.

අ) පිළිතුරු පත් 100ක් ලකුණු කිරීම - පරීක්ෂකවරයාට /ඇගයීම්කරුට පිළිතුරුපත් භාර දුන් දින සිට මසක් *ඇතුළත.*

ආ) පිළිතුරු පත් 101 – 300 ක් දක්වා ලකුණු කිරීම - පරීක්ෂකවරයාට /ඇගයීම්කරුට පිළිතුරුපත් භාර දුන් දින සිට *සති හතරක් ( සති 04) ඇතුළත.*

ඇ) විශේෂ දීමනාව සඳහා හිමිකම් ලැබීමට කිසිදු පරීක්ෂකවරයකුට /ඇගයීම්කරුවකුට එක් පරීක්ෂණයක් සඳහා එකවර පිළිතුරු පත් 300ක උපරිමයක් ලකුණු කිරීමට අවසර නැත.

*3 පරීක්ෂණයට ලක් කරන ලද සිසුන් සංඛ්‍යාව මත පදනම් වූ මුළු මුදල මණ්ඩලයේ සාමාජිකයන් සංඛ්‍යාව අතර බෙදිය යුතුය.

## 2.2 පරිපාලන සහ සහය කාර්ය මණ්ඩල සඳහා අනුමත ගෙවීම් අනුපාතික (ඉහළ සීමා) **1

**අ) යතුරුලියනය/ මුද්‍රණය/ පැකට්වු කිරීම අධීක්ෂණය සඳහා ගෙවීම්**

| | | අනුපාතික (රු) |
|---|---|---|
| අ | ප්‍රශ්න පත්‍ර සාමාන්‍ය අධීක්ෂණය හා හැසිරවීම ( දෙන ලද විභාගයක එක් පශ්න පත්‍රයක් වෙනුවෙන්) | 300.00 |
| ආ | ප්‍රශ්න පත්‍ර යතුරුලියනය අධීක්ෂණය ( දෙන ලද විභාගයක එක් පශ්න පත්‍රයක් වෙනුවෙන්) | |
| ඇ | පරිලෝකනය / ද්විගුණනය (පිටපත් කිරීම), පැකට්වු කිරීම සහ මුද්‍රා තැබීම ( දෙන ලද විභාගයක එක් පශ්න පත්‍රයක් වෙනුවෙන්) | |

**1 මෙම සේවාවන් අධ්‍යක්ෂ හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂ අධ්‍යයන සම්බන්ධීකාරකවරයෙකු විසින් සපයන අවස්ථාවක දී, ඔහු /ඇය ද මත මෙම ගෙවීම සඳහා හිමිකම් ලබන අතර එහිදී බාහිර විභාග භාර නියෝජ්‍ය ලේඛකාධිකාරීවරයා / ජොෂ්ය සහකාර ලේඛකාධිකාරීවරයාට ගෙවීම් නොකළ යුතුය.

**ආ) පරිලෝකනය / පිටපත් කිරීම, පැකට්වු කිරීම සඳහා ගෙවීම්**

| | විස්තරය | අනුපාතික (රු) |
|---|---|---|
| අ | ආචාර්යවරයා විසින් එක් පිටුවක් යතුරුලියනය කිරීම උපරිමය රු.540/- දක්වා ( දෙන ලද විභායක එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා) | ප්‍රශ්න පත්‍රයක එක් පිටුවක් සඳහා 90.00<br>සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයක් සඳහා 540.00 |
| ආ | ලිපිකරු/ලඝු ලේඛක /සමාන ශ්‍රේණියක කාර්ය මණ්ඩලය / කාර්යාල සහයක හෝ රාජකාරිය පැවරා ඇති පුද්ගලයා උපරිමය රු.360/- දක්වා (දෙන ලද විභායක එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා) | ප්‍රශ්න පත්රයක එක් පිටුවක් සඳහා 60.00<br>සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයක් සඳහා 360.00 |
| ඇ | පැකට්වු සෑදීම- ලිපිකරු/ලඝු ලේඛක /සමාන ශ්‍රේණියක කාර්ය මණ්ඩලය / කාර්යාල සහයක හෝ රාජකාරිය පැවරා ඇති පුද්ගලයකු විසින් (දෙන ලද විභායක එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා) | 60.00 |
| ඇ | මුද්‍රණය කිරීම - පිටපත් යන්ත්‍ර ක්‍රියාකරු විසින් (දෙන ලද විභායක එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා) | 60.00 |

**ඇ) අධීක්ෂක / සමීක්ෂක සහ අනෙකුත් කාර්ය මණ්ඩලය සඳහා ගෙවීම ( විශ්වවිද්‍යාලය / උසස් අධ්‍යාපන ආයතනය තුළ පිහිටා ඇති මධ්‍යස්ථාන ඇතුළත)** *1,2

අ) පැය 04ක හෝ පැය 04කට අඩු එක් පරීක්ෂණ වාරයක් සඳහා විශ්වවිද්‍යාල සේවකයන්ට ගෙවීම

| | | බාහිර පරීක්ෂණ |
|---|---|---|
| | විස්තරය | ගාස්තු (රු) |
| 1 | අධීක්ෂක *3 | 2,000.00 |
| 2 | පරිපාලන සම්බන්ධීකාරක | 1,500.00 |
| 3 | සමීක්ෂක | 1,250.00 |
| 4 | ලිපිකරු | 450.00 |
| 5 | තාක්ෂණ නිලධාරී | 375.00 |
| 6 | විද්‍යාගාර සහායක | 325.00 |
| 7 | ශාලා සහායක | 375.00 |

*1 විශ්වවිද්‍යාලය / උසස් අධ්‍යාපන ආයතනය ඇතුළත එහෙත් සමාන්‍ය රාජකාරී වේලාවෙන් පරිබාහිරව පරීක්ෂණ පැවැත්වෙන විට, පවතින අනුපාතික ප්‍රකාරව ඉහත සඳහන් සේවකයන්ට අතිකාල ගෙවීම් කළ යුතුය.

*2 පරීක්ෂණ විශ්වවිද්‍යාලයෙන් / උසස් අධ්‍යාපන ආයතනයෙන් පිටත දී පැවැත්වෙන විට අදාළ චක්‍රලේඛයන්හි නියම කර ඇති අනුපාතික ප්‍රකාරව යැපුම් දීමනාව සහ අතිකාල ගෙවීම ලබා දිය යුතුය. සේවකයා යැපුම් දීමනා ඉල්ලා නොසිටින විට රාත්‍රිය සඳහා නවාතැන් පහසුකම් අවශ්‍ය නම් එය විශ්වවිද්‍යාලය මඟින් සූදානම් කළ යුතු වන්නේය. නවාතැන් සඳහා සුදුසු ස්ථානයක් තෝරා ගැනීම නිසි ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනුගමනය කරමින් විශ්වවිද්‍යාලය මඟින් සිදු කළ යුතුය. එවැනි අවස්ථාවන්හි දී ගෙවීම් සිදු කිරීම සෘජුවම නවාතැන් පොළ වෙත හෝ අදාළ කාර්ය මණ්ඩල සාමාජිකයන් විසින් බිල්පත් ඉදිරිපත් කිරීම මත පරිපාලන සම්බන්ධීකාරක වෙත හෝ කළ යුතුය.

*3 පරීක්ෂණ මණ්ඩලය විසින් නම් කරන ලද අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෙකු ( ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය හෝ ඉහළ කාණ්ඩයක) විය යුතුය.

**2.3 අධ්‍යයන කළමනාකරුවන්ට ගෙවීම - පීඨාධිපති, දෙපාර්තමේන්තු ප්‍රධානී සහ වෙනත් ( මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ විභාග) * 1,2,3**

| | විස්තරය | බාහිර පරීක්ෂණය අවසාන /වාර්ෂික ගාස්තුව (රු) |
|---|---|---|
| අ | පීඨාධිපති | 7,500.00 |
| ආ | දෙපාර්තමේන්තු ප්‍රධානී | 7,500.00 |
| ඇ | අධ්‍යක්ෂ / බාහිර උපාධි පාඨමාලා මධ්‍යස්ථානය | 10,000.00 |
| ඇ | නියෝජ්‍ය අධ්‍යක්ෂ / විභාග, බාහිර උපාධි පාඨමාලා මධ්‍යස්ථානය | 10,000.00 |
| ඉ | වැඩසටහන් සමායෝජක | 10,000.00 |
| ඊ | පාඨමාලා සමායෝජක | 7,500.00 |

* [1] බාහිර විභාග සම්බන්ධයෙන් කටයුතු කරන මධ්‍යස්ථානය /ඒකකය පිළිතුරුපත් මිටිය ( මිටි) අදාළ පීඨවල පීඨාධිපති හරහා පරීක්ෂකයාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් අදාළ පරීක්ෂකවරයා වෙත පරීක්ෂණය නිම වී දින හතක් (07) ඇතුළත යැවිය යුතුය.

* [2] ප්‍රශ්න පත්‍ර ලැබුණු දින සිට මාස තුනක් ඇතුළත පරීක්ෂකයා විසින් පරීක්ෂකයාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා සහ අදාළ පීඨයේ පීඨාධිපති හරහා ලකුණු/ ප්‍රශ්නපත්‍ර මිටිය බාහිර විභාග ශාඛාව වෙත යැවිය යුතුය.

* [3] පීඨාධිපති, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ, අධ්‍යයන වැඩසටහන් සමායෝජක සහ පාඨමාලා සමායෝජකවරුන් ඉහත ගෙවීම් සඳහා හිමිකම ලබනු ඇත්තේ ඔවුන් පහත කොන්දේසි 4 සපුරා ගැනීමට දායක වන්නේ නම් පමණක් බව කාරුණිකව සටහන් කර ගන්න.

කොන්දේසිය 01

2 සියලුම විශ්ව විද්‍යාලවල උපකුලපතිවරුන් හා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යක්ෂවරුන් වෙත } අවශ්‍ය නිවැරදි කිරීම කර එහි පිටපතක් සහිතව විගණකාධිපති වෙත යැවීම සඳහා

3 [illegible],
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලය
බුද්ධශ්‍රාවක භික්ෂු විශ්ව විද්‍යාලය } -එම-

4 අධ්‍යක්ෂ ජනරාල්,
රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව } ප්‍රතිපාදන නිදහස් කිරීමේදී සැලකිල්ලට ගැනීම සඳහා

5 විගණකාධිපති,



To:0112674772 Page:1/1

කම්කරු දෙපාර්තමේන්තුව
தொழிற் திணைக்களம்
DEPARTMENT OF LABOUR

දුරකථන / தொலைபேசி / Telephones: 581142, 581143, 581146, 581148, 581149, 584373, 593260

මගේ අංකය / எனது இல. / My No.: පා/ආයතන/11.
ඔබේ අංකය / உமது இல. / Your No.: එයි/පි/යූපීයි/5.

කම්කරු මහලේකම් කාර්යාලය, තැ. පෙ. 575, කොළඹ 5, ශ්‍රී ලංකාව.
தொழில் செயலகம், அ. பெட்டி இல. 575, கொழும்பு 5. இலங்கை
Labour Secretariat, P. O. Box 575, Colombo 5, Sri Lanka.


2001..08..24 දින/Day

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
කොළඹ 7.
2001 AUG 30
තැපැල් අංශය

**පාරිතෝෂික ගෙවීම් හා අර්ථසාධක අරමුදල**
**සඳහා විවිධ දීමනා අදාල කර ගැනීම**

ඉහත කරුණ සම්බන්ධයෙන් ඔබගේ සමාංක හා 2001.06.19 දිනැති ලිපිය හා බැඳේ.

සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ 'මුළු ඉපයීම්' අර්ථනතනයට අධ්‍යයන දීමනාව හෝ ගිලන් දීමනාව ඇතුලත් නොවන බව දන්වනු කැමැත්තෙමි. එසේම එම දීමනාව ජීවන වියදම් දීමනාවට සමාන නොවන හෙයින් පාරිතෝෂික ගණනය කිරීමට ද අදාල නොවිය යුතු බව කරුණාවෙන් දන්වා සිටිමි.

දායක නොවන විශ්‍රාම වැටුප් ක්‍රමයන් යටතේ විශ්‍රාම වැටුපකට හිමිකම් ඇති කම්කරුවෙකුට හෝ කම්කරුවන් සම්බන්ධයෙන් පාරිතෝෂිකයට හිමිකම් නැති බව වැඩිදුරටත් දන්වා සිටිමි.

එස්. ඒ. නිමල් සරනතිස්ස.
වැ. බ. කම්කරු කොමසාරිස් (කා. ස).
කම්කරු කොමසාරිස් ජනරාල් වෙනුවට.

අමුණුම 21

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் அமைச்சு
MINISTRY OF FINANCE AND PLANNING

...01. செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01 Sri Lanka

ෆැක්ස් / பெக்ஸ் / Fax } (94)-11 - 2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website } www.treasury.gov.lk

NPD/HRD/EDU/CM/11/2011

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2011.02.

අමාත්‍ය මණ්ඩල සංදේශය

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයාගේ නිරීක්ෂණ

| | | |
|---|---|---|
| අමාත්‍යාංශය | : | උසස් අධ්‍යාපන අමාත්‍යාංශය |
| ශීර්ෂය හා දිනය | : | ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවලට වැඩි විදේශීය සිසුන් ප්‍රමාණයක් ආකර්ශණය කර ගැනීම<br>2011.01.25 |
| යෝජනාව/ඉල්ලීම | : | පහත සඳහන් යෝජනාව සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය අපේක්ෂා කෙරේ.<br>දේශීය සිසුන්ට මෙරට විශ්වවිද්‍යාලවල ප්‍රවේශවීමට වෙන්කර ඇති ඉඩ ප්‍රස්ථාවන් කිසිදු අයුරකින් අඩු නොකරමින් යෝජිත පරිදි දේශීය විශ්වවිද්‍යාලවලට එක් පාඨමාලාව සඳහා ඇතුලත් කරගන්නා විදේශීය සිසුන් ප්‍රමාණය 2011 වසරේ පටන් 0.5% සිට 5% දක්වා ආරම්භයේදී වැඩිකිරීමටත් එහි සාර්ථකත්වයෙන් පසුව මෙම ප්‍රමාණය 10% දක්වා වැඩිකිරීමට හා ඒ සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත අවසර ලබාදීමට |
| නිරීක්ෂණ | : | ශ්‍රී ලංකාව දැනුමේ ආර්ථිකයක් බවට පත් කිරීම සඳහා විදේශීය ශිෂ්‍යයන් ජාතික විශ්වවිද්‍යාලවලට ඇතුලත් කිරීම උපායමාර්ගයක් වශයෙන් යොදාගත හැකි බැවින් ඉහත යෝජනාව සඳහා එකඟවෙමි. |

මහින්ද රාජපක්ෂ
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය

අමාත්‍ය මණ්ඩල සංදේශ අංක : HE/UD/ 2011/ 03 2011. 01. 25

## අමාත්‍ය මණ්ඩල සංදේශය

### ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවලට වැඩි විදේශීය සිසුන් ප්‍රමාණයක් ආකර්ශණය කර ගැනීම

1. දැනට ශ්‍රී ලංකාවේ ජාතික විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කර ගැනිමේදී අනුගමනය කරනු ලබන ප්‍රවේශ ප්‍රතිපත්තිය අනුව විශ්වවිද්‍යාලවල එක් එක් පාඨමාලා සඳහා ඇතුළත් කර ගන්නා මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 0.5% ක ප්‍රමාණයක් විදේශිය සිසුන් සඳහා වෙන් කර ඇත. රජයේ නව උසස් අධ්‍යාපන ප්‍රතිපත්තිය අනුව දේශීය සිසුන්ට මෙරට විශ්වවිද්‍යාලවලට ප්‍රවේශ වීමට වෙන් කර ඇති අවස්ථාවන්ට බාධාවක් නොවන පරිදි විදේශීය සිසුන්ටද ඒ සඳහා ඇති අවස්ථා වැඩි කිරීම මගින් ප්‍රතිලාභ රාශියක් ලැබෙන බව හඳුනා ගෙන ඇත.

2. විදේශ සිසුන් සඳහා මෙරට විශ්වවිද්‍යාලවල අධ්‍යයන කටයුතු සඳහා වැඩි අවස්ථා ලබාදීම මගින් ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනයේ ගුණාත්මක භාවය පිළිබඳව විදේශ රටවල් තුල ප්‍රචාරය විමත් ඒ තුලින් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල වල පාඨමාලා සඳහා විදේශිය සිසුන් වැඩි වැඩියෙන් ආකර්ශණය කර ගැනීමටත් හැකි වේ. එක් එක් පාඨමාලා සඳහා අය කරනු ලබන පාඨමාලා ගාස්තු විවිධ වන අතර එමගින් මෙරටට ලැබෙන විදේශ විනිමය ප්‍රමාණය වැඩි කර ගැනීමට හැකි වීම එයින් ලැබෙන වැදගත් ප්‍රතිලාභයකි. එලෙස උපයා ගනු ලබන විදේශ විනිමය මගින් විශ්වවිද්‍යාලවල පහසුකම් වැඩි කිරිම තුලින් මෙරට ජාතික විශ්වවිද්‍යාල සඳහා වාර්ෂිකව මහා භාණ්ඩාගාරය විසින් දැරීමට සිදුවන වැය බර සැලකිය යුතු ප්‍රමාණයකට අඩු කර ගැනීමට හැකි වනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද මෙම උපයනු ලබන මුදල් විශ්වවිද්‍යාලවල පහසුකම් වැඩි දියුණු කිරීමට භාවිතා කිරිමෙන් ජාතික විශ්වවිද්‍යාල ජාත්‍යන්තර විශ්වවිද්‍යාල තත්වයට පත් කිරීමට රජය විසින් ගනු ලබන ප්‍රයත්නයට රුකුලක් සපයනු ඇත. ඉහත හේතූන් මත දේශීය විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගන්නා විදේශීය සිසුන් ප්‍රමාණය ආරම්භයේදී 0.5% සිට 5% දක්වා වැඩි කිරීමට යෝජනා කරන අතර ආරම්භක අදියරෙහි සාර්ථක භාවය මත පසුව මෙම ප්‍රමාණය 10 % දක්වා වැඩි කිරීමටත් අපේක්ෂා කෙරේ.

3. මේ අනුව දේශිය සිසුන්ට මෙරට විශ්වවිද්‍යාලවලට ප්‍රවේශ වීමට වෙන් කර ඇති ඉඩ ප්‍රස්ථාවන් කිසිදු අයුරකින් අඩු නොකරමින් යෝජිත පරිදි දේශීය විශ්වවිද්‍යාලවල එක් එක් පාඨමාලා සඳහා ඇතුළත් කර ගන්නා විදේශීය සිසුන් ප්‍රමාණය 2011 වසරේ පටන් 0.5% සිට 5% දක්වා ආරම්භයේදී වැඩි කිරීමටත් එහි සාර්ථක භාවය මත පසුව මෙම ප්‍රමාණය 10 % දක්වා වැඩි කිරීමටත් ඒ සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත අවසර ලබා දීමට උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය අපේක්ෂා කරමි .

එස් . බී . දිසානායක
උසස් අධ්‍යාපන අමාත්‍ය

## A. Cabinet Papers

13. Cabinet Paper No.11/0211/521/005, a Memorandum dated 25.01.2011 by the Minister of Higher Education on "Attraction of more foreign Students to Sri Lankan Universities" - the above Memorandum was considered along with the observations of the Minister of Finance and Planning and approval was granted for the Ministry of Higher Education to permit the University Grants Commission to increase the intake of foreign students to the Universities in Sri Lanka for each course of study, from 0.5% to 5% initially from the year 2011, without reducing the opportunities for local students to enter Universities.

Action by: My/Higher Education - observations of the Minister of Finance and Planning annexed.

Copied to: My/Finance and Planning
My/External Affairs- copy of Memorandum and above observations annexed.

**සප්ත වාර්ෂික නිවාඩු**

**අනධ්‍යයන කාර්යමණ්ඩලය**

| | **සප්ත වාර්ෂික නිවාඩු ලබා සේවයට පැමිණ ඇති නිලධාරියා ස්ථිරවම සේවයේ යෙදී සිටින විශ්වවිද්‍යාලය** | **සප්ත වාර්ෂික නිවාඩු ලබා සිටින අනධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයාගේ නම** | **සප්ත වාර්ෂික නිවාඩු ලබා නැවත සේවයේ යෙදී සිටින විශ්වවිද්‍යාලය/ පශ්චාත් උපාධි ආයතනය** |
|---|---|---|---|
| (අ) | සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය | ආර්.එම්.ගුණපාල මයා (වැඩ ඉංජිනේරු) | කැලණිය විශ්වවිද්‍යාලය |
| (ආ) | යාපනය විශ්වවිද්‍යාලය | වී. කන්දීපන් මයා (ලේඛකාධිකාරී) | නැගෙනහිර විශ්වවිද්‍යාලය |
| (ඇ) | කොළඹ විශ්වවිද්‍යාලය | කේ.එස්.ටී.එස්.ජයසූරිය මයා | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| (ඈ) | කොළඹ විශ්වවිද්‍යාලය | ජී.එච් ගාමිණී මයා | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| (ඉ) | කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය (ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය) | ඩබ්.ඒ.එල්.වික්‍රමසිංහ මයා | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| (ඊ) | සබරගමුව විශ්වවිද්‍යාලය | කේ.ආර්.ඩී.සී. රත්නමුදලි මයා (අධ්‍යක්ෂ ශාරීරික හා උපදේශක අංශය) | මොරටුව විශ්වවිද්‍යාලය |
| (උ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | ඩී.එල්.ජී. ජයරත්න මයා (නියෝජ්‍ය ලේඛකාධිකාරී) | මොරටුව විශ්වවිද්‍යාලය |
| (ඌ) | මොරටුව විශ්වවිද්‍යාලය තාක්ෂණ ආයතනය | යූ.එස්. වඩුගේ මිය (ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී) | මොරටුව විශ්වවිද්‍යාලය |
| (එ) | බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය | ඩී. කුලසේකර (නියෝජ්‍ය ලේඛකාධිකාරී) | මොරටුව විශ්වවිද්‍යාලය |

අධ්‍යයන කාර්යමණ්ඩලය

--------------------------------

| | සප්තවාර්ෂික නිවාඩු ලබා සේවයට පැමිණ ඇති නිලධාරියා ස්ථිරව සේවයේ යෙදී සිටින විශ්වවිද්‍යාලය | සප්තවාර්ෂික නිවාඩු ලබා සිටින අධ්‍යයන කාර්යමණ්ඩල සමාජිකයන්ගේ නම | සප්ත වාර්ෂික නිවාඩු ලබා නැවත සේවයේ යෙදී සිටින විශ්වවිද්‍යාලය/ පශ්චාත් උපාධි ආයතනය |
|---|---|---|---|
| (අ) | කැලණිය විශ්වවිද්‍යාලය | (i) වෛද්‍ය එස්.එස් විලියම්ස් මහතා (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය) | යාපනය විශ්වවිද්‍යාලය |
| | | (ii) මහාචාර්ය යූ. එස් අමරසිංහ මහතා (ජලජීවී වගා හා මත්ස්‍ය අධ්‍යයන අංශය) | වයඹ විශ්වවිද්‍යාලය |
| | | (iii)ආචාර්ය ආර්.එම්.එස් .සී රත්නායක මහතා | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| (ආ) | රුහුණු විශ්වවිද්‍යාලය | මහාචාර්ය කේ.ජී.සෝමසිරි මයා (Associate professor in Physiology) | නැගෙනහිර විශ්වවිද්‍යාලය |
| (ඇ) | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | මහාචාර්ය ෂර්මලා කුමාර් | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය යටතේ ඇති කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය |
| (ඈ) | ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | ඒ.ආර්. කුමාරසිංහ මයා | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| (ඉ) | විවෘත විශ්වවිද්‍යාලය | එස්. ඒ. එම්.ඒ.එම්.එස්. සේනානායක | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| (ඊ) | මොරටුව විශ්වවිද්‍යාලය | යූ.ජී.ඒ. පුස්වැල්ල මයා | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| (උ) | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | ආචාර්ය සී.එල්. රණතුංග | ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය |
| (ඌ) | ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය | ආචාර්ය ඒ.එස්. චන්ද්‍රබෝස් | පේරාදෙනිය විශ්වවිද්‍යාලය |

| | | | |
|---|---|---|---|
| | | භූගෝලීය විද්‍යා දෙපාර්තමේන්තුව<br><br>කලා පීඨය | |
| (එ) | සබරගමුව විශ්වවිද්‍යාලය | ආචාර්ය එම්.එල්.එම්.සී. දිසානායක<br><br>ජීව විද්‍යා දෙපාර්තමේන්තුව<br><br>කෘෂිකර්ම පීඨය | පේරාදෙනිය විශ්වවිද්‍යාලය |
| (ඒ) | සබරගමුව විශ්වවිද්‍යාලය | ආචාර්ය එම්.එල්.එම්.සී. දිසානායක | පේරාදෙනිය විශ්වවිද්‍යාලය |
| | සබරගමුව විශ්වවිද්‍යාලය | ආචාර්ය ජ්.ඩබ්. විජේරත්න<br><br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br><br>පශු සම්පත් හා ධීවර පීඨය | වයඹ විශ්වවිද්‍යාලය |

බැඳුම්කර ගිවිසුම කඩකර ඇති අධ්‍යයන හා අනධ්‍යයන කාර්යමණ්ඩල විස්තර හා අයකර ගත යුතුව ඇති වටිනාකම්

| විශ්වවිද්‍යාලයේ නම | ගිවිසුම් කඩකළ ආචාර්යවරුන් ගණන | අයවිය යුතු මුදල රු. | ගිවිසුම් කඩකළ අනධ්‍යයන කාර්යමණ්ඩලය සාමාජිකයින් ගණන | අයවිය යුතු මුදල රු. |
|---|---|---|---|---|
| ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 03 | 8,483,169 | නැත | - |
| කැලණිය විශ්වවිද්‍යාලය | 21 | 75,077,754 | නැත | - |
| පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 130 | 113,766,761 | 03 | 2,948,948 |
| මොරටුව විශ්වවිද්‍යාලය | 29 | 51,788,857 | 02 | 772,705 |
| කොළඹ විශ්වවිද්‍යාලය | 32 | 43,349,296 | 01 | 465,138 |
| විවෘත විශ්වවිද්‍යාලය | 35 | 85,705,521 | 07 | 5,677,309 |
| සෞන්දර්ය විශ්වවිද්‍යාලය | 02 | 1,617,048 | නැත | |
| රුහුණු විශ්වවිද්‍යාලය | 18 | 20,932,217 | නැත | |
| වයඹ විශ්වවිද්‍යාලය | 03 | 2,634,003 | නැත | - |
| අග්නිදිග විශ්වවිද්‍යාලය | 05 | 3,910,556 | නැත | |
| සබරගමුව විශ්වවිද්‍යාලය | 14 | 68,943,858 | නැත | - |
| ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 51 | 105,027,673 | 07 | 2,854,944 |
| නැගෙනහිර විශ්වවිද්‍යාලය | 73 | 163,104,000 | නැත | |
| සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය | 02 | 1,617,048 | නැත | |
| ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය | 04 | 4,419,947 | නැත | |
| කොළඹ විශ්වවිද්‍යාලය - පරිගනක අධ්‍යයන ආයතනය | 03 | 2,032,948 | නැත | |
| යාපනය විශ්වවිද්‍යාලය | 74 | 71,000,000 | නැත | |
| **එකතුව** | 499 | 823,410,656 | 20 | 12,723,044 |

K·M·T·H· උඩමුල්ල.

ඇමුණුම - 26

ඇමුණුම - 24

## පානදුර දිස්ත්‍රික් උසාවියේදී ය.

මොරටුව විශ්වවිද්‍යාලය,

මොරටුව.

19 APR 2017

පැමිණිලිකරු.

අංකය: 4160/මුදල්.

එදිරිව.

කේ.එම්.ටී.එච්.උඩමුල්ල,

37, සිරිල් ජැන්ස් පාර,

පානදුර.

සහ තවත් අය.

විත්තිකරුවන්.

19 APR 2017



**පානදුර අති. දිසා විනිසුරු රෂන්ත ගොඩවෙල මැතිතුමා ඉදිරිපිටදී ය.**

**නඩු අංකය :- 4160/ මුදල්.**

**දිනය :- 2017.04.06**

සටහන් කර ගැනිම :- ල/ලේ. චන්ද්‍රා කරුණාරත්න විසිනි.

## තීන්දුව.

මෙම නඩුව පැමිණිලිකාර ආයතනය විසින් විත්තිකරුවන්ට විරුද්ධව පවරා ඇත්තේ 1වන විත්තිකරු පැමිණිලිකාර ආයතනයේ සේවය කරමින් සිටියදී ලැබුණායැයි කියනු ලබන විදේශ ශිෂ්‍යත්වයකට යෑම සඳහා පැමිණිලිකාර ආයතනය සහ 1වන විත්තිකරු අතර ඇති කර ගන්නා ලද ගිවිසුමක් අනුව 1වන විත්තිකරු ක්‍රියා නොකිරීම මත ගිවිසුම ප්‍රකාරව පැමිණිලිකාර ආයතනයට අයවිය යුතුව ඇතැයි කියනු ලබන මුදල අය කර ගැනිමට සහ එම ගිවිසුම මත 2 සිට 7 දක්වා විත්තිකරුවන් ඇප ගිවිසුමකට අත්සන් තබා ඇති බවත්, එම ඇප ගිවිසුම මත 2 සිට 7 දක්වා විත්තිකරුවන්ගෙන් අයවිමට ඇතැයි කියනු ලබන මුදල අය කරගැනිම සඳහාත් වේ. 1, 4, 5, 7 විත්තිකරුවන්ට විරුද්ධව ඇති නඩුව බහා තබා ඇති අතර, ඒ අනුව 2, 3, 6 විත්තිකරුවන්ට විරුද්ධව නඩුව විභාගයට ගෙන ඇත.

19 APR 2017



**හෝමාගම අති. දිසා විනිසුරු රුෂාන්ත ගොඩවෙල මැතිතුමා ඉදිරිපිටදී ය.**

**නඩු අංකය :- 4160/ මුදල්.**

**දිනය :- 2017.04.06**

සටහන් කර ගැනිම :- ලලේ. චින්ද්‍යා කරුණාරත්න විසිනි.

## තීන්දුව.

මෙම නඩුව පැමිණිලිකාර ආයතනය විසින් විත්තිකරුවන්ට විරුද්ධව පවරා ඇත්තේ 1වන විත්තිකරු පැමිණිලිකාර ආයතනයේ සේවය කරමින් සිටියදී ලැබුණායැයි කියනු ලබන විදේශ ශිෂ්‍යත්වයකට යෑම සඳහා පැමිණිලිකාර ආයතනය සහ 1වන විත්තිකරු අතර ඇති කර ගන්නා ලද ගිවිසුමක් අනුව 1වන විත්තිකරු ක්‍රියා නොකිරීම මත ගිවිසුම ප්‍රකාරව පැමිණිලිකාර ආයතනයට අයවිය යුතුව ඇතැයි කියනු ලබන මුදල අය කර ගැනිමට සහ එම ගිවිසුම මත 2 සිට 7 දක්වා විත්තිකරුවන් ඇප ගිවිසුමකට අත්සන් තබා ඇති බවත්, එම ඇප ගිවිසුම මත 2 සිට 7 දක්වා විත්තිකරුවන්ගෙන් අයවිමට ඇතැයි කියනු ලබන මුදල අය කරගැනිම සඳහාත් වේ. 1, 4, 5, 7 විත්තිකරුවන්ට විරුද්ධව ඇති නඩුව බහා තබා ඇති අතර, ඒ අනුව 2, 3, 6 විත්තිකරුවන්ට විරුද්ධව නඩුව විභාගයට ගෙන ඇත.

විභාගයේදී පහත දැක්වෙන පිළිගැනීම් සහ විසඳිය යුතු ප්‍රශ්න ඉදිරිපත් කර ඇත.

19 APR 2017

**පිළිගැනීම් :-**

01. අධිකරණ බලය පිළිගනී.

02. පැමිණිල්ල සමඟ පැ.9 ලෙසට ගොනු කොට ඇති ඇප බැඳුම්කරයේ 2, 3, 6 විත්තිකරුවන් අත්සන් තිබෙන බවට පිළිගනී.

03. පැමිණිල්ලේ 5වන ඡේදයේ සඳහන් සම්ප්‍රකාශ පැ.1 ලේඛනයේ අන්තර්ගත බවට පිළිගනී.

04. පැ.9 ගිවිසුමේ අකුරින් රුපියල් හාරලක්ෂ අනූතුන්දහස් එකසිය හැත්තැපහයි ශත පනස්තුනක් ලෙසටද ඉලක්කමින් 4093175.53ක් ලෙසට සටහන් වී ඇති බවට පිළිගනී.

**විසඳිය යුතු ප්‍රශ්න :-** (පැමිණිල්ල වෙනුවෙන්)

01. පැමිණිලිකාර විශ්ව විද්‍යාලය 1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනත යටතේ යථා පරිදි සංස්ථාපනය කරන ලද ස්වකීය සංස්ථාගත නාමයෙන් නඩු පැවරීමට සහ පවරනු ලැබීමට ශක්‍යතා ඇති ආයතනයක් වන්නේද ?

19 APR 2017



02. මෙම නඩුවට සෑම අවස්ථාවකදීම 1 වන විත්තිකරු පැමිණිලිකාර විශ්ව විද්‍යාලයේ කථිකාචාර්ය (පරිවාස) වශයෙන් සේවයේ නියුතුව සිටියේද ?

03. 1 වනු විත්තිකරු පැමිණිලිකාර විශ්ව විද්‍යාලයේ. සේවය කරමින් සිටියදී පැමිණිල්ලේ 4 වන ඡේදයේ දැක්වෙන පරිදි විලාසිතා ඉතිහාසය සහ සංස්කෘතිය පිළිබඳව පාඨමාලාව අධ්‍යනය කිරීම සඳහා යෑමට හැකි වන පරිදි පැමිණිලිකාර විශ්ව විද්‍යාලය විසින් 1වන විත්තිකරු වෙත 2004.01.19 වන දින සිට 2005.12.31 වන දින දක්වා විදේශ අධ්‍යන නිවාඩු ප්‍රධානය කර ඇත්ද ?

04. එම විදේශ අධ්‍යාපන නිවාඩුව සම්බන්ධයෙන් පැමිණිලිකාර විශ්ව විද්‍යාලය සහ 1වන විත්තිකරු අතර 2004.01.4 වන දින පැ.1 දරණ ගිවිසුමට එළඹෙන ලද්දේද ?

05. 2 සිට 7 දක්වා විත්තිකරුවන් 1වන විත්තිකරු විසින් අත්සන් කරන ලද පැ.1 ගිවිසුමේ කොන්දේසීන් වැඩිදුරටත් ඉටු කිරීම සනාථ කිරීම සඳහා සුරැකුමක් වශයෙන් පැ.9 දරණ ගිවිසුම වෙතට අත්සන් තබන ලද්දේද ?

06. පැමිණිලිකාර විශ්ව විද්‍යාලය සහ 1 වන විත්තිකරු ගිවිසුමට අනුකූලව 1වන විත්තිකරු වෙත ප්‍රදානය කර තිබු වැටුප් සහිත නිවාඩු

2005.12.31 වන දින අවසන් ලිපියෙන් තමාගේ නිවාඩු කාලය දීර්ඝ කරන ලෙසට ඉල්ලුම් කරන ලද්දේද ?

07. පැමිණිලිකාර විශ්ව විද්‍යාලය එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරමින් සිය 2006.06.28 වන දිනැති ලිපියෙන් සේවයට වාර්තා කරන මෙන් 1 වන විත්තිකරු වෙත දන්වා සිටින ලද්දේද ?

08. මේ අනුව 1වන විත්තිකරු සිය පශ්චාත් උපාධි පාඨමාලාව සම්පූර්ණ කර ශ්‍රී ලංකාවට පැමිණ පැමිණිලිකාර විශ්ව විද්‍යාලයේ කථිකාචාර්‍ය (පරිවාස) වශයෙන් 2006.07.31 සිට 2006.10.21 වන දින තෙක සේවය කරන ලද්දේද ?

09. 1වන විත්තිකරු සිය 2006.10.26 දින ලිපිය මගින් සේවයෙන් ඉල්ලා අස්වීමට ඉල්ලා සිටින ලද්දේද ?

10. පැමිණිලිකාර විශ්ව විද්‍යාලය 1 වන විත්තිකරුගේ එකී ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලද්දේද ?

11. 2006.10.27 වන දින සිට 1වන විත්තිකරු තවදුරටත් සේවයට නොපැමිණීම හේතුවෙන් සේවය අත්හැර ගියා සේ සළකන බවට දන්වා සිටින ලද්දේද ?

?? APR 2017



12. 1වන විත්තිකරු පැ.1 ගිවිසුම ප්‍රකාරව තම රාජකාරි කිරීමට භාර ගත් දින සිට අවුරුදු 07ක් පැමිණිලිකාර විශ්ව විද්‍යාලයට සේවය කිරීමට අපොහොසත් වි ඇද්ද ?

13. ඒ අනුව පැ.1 ගිවිසුමේ කොන්දේසි 1වන විත්තිකර උල්ලංඝනය කර තිබේද ?

14. ඒ අනුව 1වන විත්තිකරු පැ.1 ගිවිසුම කඩ කිරීම මත 1 වන විත්තිකරු විසින් පැමිණිලිකාර ආයතනය වෙතට රුපියල් හැටහය ලක්ෂ තුන්සිය හතරයි ශත හතලින් අටක් ගෙවීමට බැඳි සිටින්නේද ?

15. 1 වන විත්තිකරු විසින් එකී මුදල් ගෙවීම පැහැර හැරීම මත 2, 3, 6 විත්තිකරුවන් විසින් ඇපකරුවන් ලෙසට රුපියල් හතලිස් ලක්ෂ අනුතුන්දහස් හැත්තෑපහයි ශත පනස්තුනක් ගෙවීමට බැඳි සිටින්නේද ?

16. එම මුදල හෝ ඉන් කොටසක් 2, 3. 6 විත්තිකරුවන්ට දන්වා සිටින ලද්දේද ?

17. එම මුදල හෝ ඉන් කොටසක් 2, 3, 6 විත්තිකරුවන් ගෙවීමට අපොහොසත් වි ඇත්ද ?

18. එසේනම් පැමිණිල්ලේ ආයාවනයේ අ සිට ඇ ජේදවල සඳහන් සහන ලබා ගැනිමට පැමිණිලිකාර ආයතනයට හැකියාවක් ඇත්ද ?

**2, 3, 6 විත්තිකරුවන් වෙනුවෙන් විසඳිය යුතු ප්‍රශ්න :-**

19. මෙම නඩුකරය ගොනු කිරිමට ප්‍රථම පැ.1 වශයෙන් ඉදිරිපත් කරන ලද ගිවිසුමේ කොන්දේසි විත්තිකරුවන් දන නොසිටියේද ?

20.(1) කිසිදු විටෙක මෙම විත්තිකරුවන් පැමිණිලිකරු වෙත රුපියල් 4093175.53 මුදලක් ගෙවිමට පැ.9 ලේඛනය මගින් එකඟ නොවූයේද ?

(11). එකී පැ.9 ගිවිසුම් පත්‍රයේ දක්වා ඇති පරිදි විත්තිකරුවන් ගෙවිමට එකඟ වි ඇති මුදල රු.493175.53 මුදලක් පමණක් වන්නේද ?

(111). එකී පැ.9 ලේඛනයේ සඳහන් රුපියල් 4093175.53 මුදලක් මෙම විත්තිකරුවන්ගෙන් අය කර ගැනිම සඳහා නඩු පැවරිමට පැමිණිලිකරුට කිසිදු අයිතියක් නොමැත්තේද ?

21. විත්තිකරුවන් වෙත නිතියෙන් ලබා දි ඇති අයිතිවාසිකම් ගිවිසුමෙන් අත්හැරිය හැක්කේද ?

22.(1). පැමිණිල්ලේ පැ.9 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කර ඇති ගිවිසුම ප්‍රකාරව එම ගිවිසුමෙන් රු.493175.53 මුදලක් ගෙවන ලෙසට නිතිය ඉදිරියේ පිළිගත හැකි ඉල්ලිමක් විත්තිකරුවන් වෙත ඉදිරිපත් කර නොමැත්තේද ?



ර: 7/22 919458 /20..

12 APR 2017



(11). එසේනම් විත්තිකරුවන්ට එරෙහිව නඩු නිමිත්තක් පැමිණිල්ලට උපවය වි නැද්ද ?

23.(1). විත්තිකරුවන් පැ.9 දරණ ලේඛනය මඟින් පැමිණිලිකරු වෙත ගෙවීමට එකඟ වි ඇති මුදල් විත්තිකරුවන්ගෙන් අය කර ගැනීමේ පදනම පැමිණිලිකරු සහ 1 වන විත්තිකරු අතර ඇති පැ.1 දරණ ගිවිසුමේ කොන්දේසි හා නියමයන් උල්ලංඝනය කර ඇති බව පැමිණිලිකරු විසින් ඔප්පු කළයුතු වන්නේද ?

(11). මේ අවස්ථාවේදී එවැනි උල්ලංඝනය කිරීමක් ඔප්පු කිරීමට පැමිණිල්ල අපොහොසත් වි ඇත්ද ?

(111). එසේනම් ප.9 ගිවිසුම මත විත්තිකරුට එරෙහිව නඩු පැවරීමට පැමිණිලිකරුට අයිතියක් නොමැතිද ?

24. විත්තිකරුවන්ගේ ඉහත සඳහන් විසඳිය යුතු ප්‍රශ්න එකක් හෝ කිහිපයක් හෝ සියල්ලටම විත්තිකරුවන්ගේ වාසියට පිළිතුරු ලැබෙන්නේ නම් විත්තිකරුගේ උත්තරයේ අයැද ඇති සහන ලබාගැනීමට හැකියාවක් ඇද්ද ?

විභාගයේදී පැමිණිල්ල වෙනුවෙන් ජුණසිරි බ්‍රිටෝ නමැති ගණකාධිකාරීවරයෙක්ද, මනෝජිත් පැපිලියාන නමැති මොරටුව විශ්ව විද්‍යාලයේ

විගණන සහකාරවරයෙක්ද සාක්ෂි දී ඇති අතර, පැ.01 සිට පැ.14 දක්වා ලේඛන ලකුණු කර ඉදිරිපත් කර ඇත. 2, 3, 6 වගඋත්තරකරුවන් වෙනුවෙන් 2වන වගඋත්තරකරු පමණක් සාක්ෂි දී ඇත. ඉහත දැක්වෙන 1වන විසඳිය යුතු ප්‍රශ්නය පැමිණිල්ල විසින් ඉදිරිපත් කර ඇත්තේ පැමිණිලිකාර විශ්ව විද්‍යාලය නෛතික පුද්ගලයෙක් වශයෙන් නීත්‍යානුකූල නඩු පැවරීමට හැකි ආයතනයක්ද යන්න සම්බන්ධයෙන් වේ. ඒ සම්බන්ධයෙන් තහවුරු කිරීම සඳහා කිසිදු ලේඛනයක් හෝ සාක්ෂියක් පැමිණිල්ලෙන් ඉදිරිපත් කර නැත. ඒ අනුව පැමිණිලිකාර ආයතනය නීත්‍යානුකූලව නඩු පැවරීමේ හැකියාව ඇති ආයතනයක් බවට තහවුරු කර නොමැති බව පෙනී යයි.

1 වන වගඋත්තරකරු පැමිණිලිකාර විශ්ව විද්‍යාලයේ කථිකාචාර්යවරයෙක් ලෙස සේවය කර ඇති බවත්, ඔහු විදේශ ශිෂ්‍යත්වයක් ලබා විදේශ ගත ව ඇති බවත්, 2වන වගඋත්තරකරුගේ සාක්ෂිය අනුව වගඋත්තරකරුවන් විසින් පිළිගෙන ඇති බව පෙනී යයි. කෙසේවෙතත්, පැමිණිල්ල 1වන වගඋත්තරකරුට විරුද්ධව ඇති නඩුව බැහැර තබන ලෙස ඉල්ලීමක් කර ඇති අතර, ඉහත සඳහන් කළ පරිදි බැහැර තබා ඇත. 2, 3, 6 වගඋත්තරකරුවන්ට විරුද්ධව පැමිණිලිකාර ආයතනයට අදාළ නඩුනිමිත්ත උපවය වී ඇතැයි සඳහන් කර ඇත්තේ පැ.09 දරණ ලේඛනය මත වේ. පැ.09 දරණ ලේඛනය විශ්ලේෂණය කර බැලීමේදී එහි කරියප්පෙරුම මුදියන්සේලාගේ තමාල් හර්ෂණ උඩමුල්ල නමැත්තා බ්‍රිතාන්‍යයේ



ස.ලේ.ඉ.අං : 0 27
2/22 919458 /20..

[redacted]

19 APR 2017

(67)



ලන්ඩන් නුවර පිහිටි ආයතනයක පශ්චාත් උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා යෑමට පැමිණිලිකාර ආයතනය සමග අත්සන් තබා ඇති ගිවිසුමේ සඳහන් කොන්දේසි අදාළ තමාල් හර්ෂණ උඩමුල්ල යන තැනැත්තා ඉටු කළයුතු බවත්, එම කොන්දේසි කඩ කළහොත් පැ.09 ලේඛනයේ සඳහන් මුදල ගෙවන බවටත් සඳහන් වන බව පෙනී යයි. අදාළ මුදල තැන් දෙකක සඳහන්ව ඇති අතර, එනම් පිටු 1 සහ 2 හි සඳහන් වී ඇති අතර, එම මුදල ඉංග්‍රීසියෙන් සඳහන් වී ඇත්තේ Rupees Four Hundred Ninety Three Thousand One Hundred Seventy Five and Fifty Three Cents ලෙසය. එහි ඉදිරියෙන් වරහන් තුළ මුදල ඉලක්කමෙන් රු.4093175.53ක් වශයෙන් සඳහන් වී ඇත. ඒ අනුව අකුරෙන් සඳහන් කර ඇති මුදල සහ ඉලක්කමෙන් සඳහන් කර ඇති මුදල එකිනෙකට පරස්පර විරෝධී වේ. ඉහත සඳහන් කළ ස්ථාන දෙකෙහිම අදාළ පරස්පරතාවය දක්නට ඇත. එසේම එම මුදල අකුරෙන් සහ ඉලක්කමෙන් ලියා ඇත්තේ බැලූ බැල්මට පෙනෙන පරිදි අදාළ ගිවිසුමේ අනෙකුත් කොටස් සම්පූර්ණ කළ තැනැත්තා නොවන බව පැහැදිලිව පෙනී යයි. අකුරෙන් සහ ඉලක්කමෙන් ලියා ඇති ගණනක යම් නොගැලපීමක් ඇත්තේ නම් පිළිගත යුතු යැයි සාමාන්‍ය සම්මතය වන්නේ අකුරෙන් ලියූ ගණන වේ. අදාළ අකුරෙන් ලියූ ගණන නිවැරදි නොවන බවත්, ඉලක්කමෙන් ලියූ ගණන නිවැරදි මුදල වියයුතු බවටත් පැමිණිල්ල සාක්ෂි මගින් ප්‍රකාශ කර ඇතත්, එම

ඉලක්කමෙන් ලියූ මුදල නිවැරදි බවට එය තහවුරු කිරීම සඳහා එය ගණනය කළ ආකාරය සාක්ෂි මගින් තහවුරු කර නැත.

ඉහත සඳහන් කරන ලද පැ.09 ලේඛනයේ ඇපකරුවන් අත්සන් කළ ,දිනය ලෙස සඳහන් වන්නේ 2004.01.05 දින වේ. පැ.01 ලෙස ලකුණු කර ඇති 1වන විත්තිකරු පැමිණිලිකාර ආයතනය සමග ඇති කරගන්නා ලැදැයි කියනු ලබන ගිවිසුමේ දිනය ලෙස දැක්වෙන්නේ 2004.01.14 දින වේ. ඒ අනුව පැ.09 දරණ ඇප ගිවිසුම අත්සන් කරන අවස්ථාවේදී පැ.01 දරණ ගිවිසුමට අත්සන් තබා තිබී නැති බව පෙනී යයි. පැ.09 ඇප ගිවිසුමේ දැක්වෙන්නේ පැ.01 ගිවිසුමෙ සඳහන් කොන්දේසි කේ.එම්.ටී.එච් උඩමුල්ල යන අය එනම් 1 වන විත්තිකරු ඉටු නොකළහොත් හෝ කඩකළහොත් පැ.09 ලේඛනය අත්සන් තබා ඇති ඇපකරුවන් එම ලේඛනයේ දක්වෙන මුදල් ගෙවීමට එකග වන බව වේ. ඒ අනුව පැ.09 ලේඛනය ලියන අවස්ථාවේදී පැ.01 ලෙස ලකුණු කර ඇති ගිවිසුම ලියා අත්සන් කර නොතිබීම මත පැ.09 ලේඛනයේ සඳහන් කොන්දේසි කිසිවක් වලංගුවීමේ නෛතික හැකියාවක් නැත.

පැමිණිල්ලෙන් ඉදිරිපත් කරන ලද අනෙකුත් ලේඛන මත 1 වන විත්තිකරු විදේශ නිවාඩු අනුමත කර ඇති කාලය දීර්ඝ කරන ලෙසට පැමිණිලිකාර ආයතනයෙන් ඉල්ලා බවත්, පැමිණිලිකාර ආයතනයෙන් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇති බවත්, ඉන්පසුව 1වන විත්තිකරු විසින් ඉල්ලා

19 APR 2017



අස්වීමේ ලිපියක් භාර දී ඇති බවත් පෙනී යයි. එසේම ඉල්ලා අස්වීමට පෙර එන වත්තිකරු නැවත ලංකාවට පැමිණ පැමිණිලිකාර ආයතනයේ රාජකාරි ආරම්භ කර ඇති බවද පැමිණිල්ලේ සාක්ෂි මගින් පෙනී යයි. පැමිණිල්ල විසින් අදාළ ඉල්ලා අස්වීමේ ලිපිය භාර නොගත් බවට පැමිණිල්ලේ සාක්ෂිකරුවන් ප්‍රකාශ කර ඇතත් ඒ බව තහවුරු කිරීම සඳහා කිසිදු ලේඛනයක් ඉදිරිපත් කර නැත.

ඉහත දැක්වූ කරුණු අනුව ඉදිරිපත් කර ඇති විසඳිය යුතු ප්‍රශ්නවලට පහත පරිදි පිළිතුරු සපයමි.

01. ඔප්පු කර නැත.

02. ඔව්.

03. ඔව්.

04. ඔව්.

05. පැ.01 ගිවිසුම පැ.09 ඇප ගිවිසුමට අත්සන් තබන අවස්ථාවේදි වලංගුව පැවැති ගිවිසුමක් නොවන බැවින් පැ.09 ගිවිසුමේ කොන්දේසි වලංගු නොවේ.

06. ඔව්.

(65)

07. ඔව්.

08. ඔව්.

09. ඔව්.

19 APR 2017

10. ඔප්පු කර නැත.

11. ඔප්පු කර නැත.

13. ඔව්.

14. 1වන විත්තිකරුට විරුද්ධව නඩුව බහා තබා ඇති බැවින් මෙම ප්‍රශ්නයට පිළිතුරු දීමට නෛතික හැකියාවක් නැත.

15. නැත.

16. ඉහත විසඳිය යුතු ප්‍රශ්නවලට ලබා දුන් පිළිතුරු ප්‍රකාරව අදාළ නොවේ.

17. ඉහත විසඳිය යුතු ප්‍රශ්නවලට ලබා දුන් පිළිතුරු ප්‍රකාරව අදාළ නොවේ.

18. නැත.

19. ඔව්.

20.(i). ඔව්.

(ii). ඔව්.

19 APR 2017

(iii). ඔව.

21. අර්ථ විරහිත විසඳිය යුතු ප්‍රශ්නයක් බැවින් පිළිතුරු ලබාදීමට නොහැක.

22.( i) ඔව.

( ii). ඔව.

23.( i). ඔව.

( ii). ඔප්පු කර ඇත.

( iii). තීන්දුවේ සඳහන් හේතු අනුව නෛතික අයිතියක් නැත.

24. තීන්දුවේ සඳහන් සහන අය කරගතහැකිය.

ඉහත විසඳිය යුතු ප්‍රශ්නවලට ලබා දුන් පිළිතුරු ප්‍රකාරව 2, 3, 6 තිකරුවන්ට විරුද්ධව නඩුව ගාස්තු රහිතව නිශ්ප්‍රභා කරමි.

(රංජන්ත ගොඩවෙල)

අති. දිසා විනිසුරු,

පානදුර.

2017.04.06

ඉහතින් සඳහන් වන්නේ පානදුර දිසා අධිකරණ නඩු අංක 4160/මුදල් නඩුවේ 2017.04.06 වන දින සටහනේ සත්‍ය සහතික පිටපතක් බව මෙයින් සහතික කරමි.
සැකසුම :-
සැසඳුම :-
රෙජිස්ට්‍රාර්.
රිසිට්පත් අංකය :- W/23 739057, 2017.04.19

ඇමුණුම - 25

ආයතන සංග්‍රහය V පරිච්ඡේදය



7.3 අංක 7.1 හෝ 7.2 ඡේදවල නියමයන්ට අනුව තනතුර අත්හැර ගියා සේ සලකනු ලැබූ තැනැත්තකුට ඉන් පසු ඔහුගේ තනතුරේ රාජකාරි කටයුතු නැවත භාර ගැනීමට හෝ පැමිණීමේ ලේඛනය අත්සන් කිරීමට හෝ අවසර නො දිය යුතු ය.

7.4 තනතුර අත්හැර ගියා සේ සලකනු ලබන තැනැත්තකුට විරුද්ධ ව චෝදනා පත්‍ර නොකළ යුතු අතර ඔහුගේ නො පැමිණීමට හෝ දිවයිනට පෙරළා පැමිණීමට අසමත් වීමට හෝ හේතු නො විමසිය යුතු ය. — චෝදනා නොකළ යුතු ය.

7.5 ඔහු දිවයිනේ සිටී නම් මාසයක් ඇතුළත දී ද දිවයිනෙන් බැහැර ව සිටී නම් මාස තුනක් ඇතුළත ද ස්වෙච්ඡාවෙන් නිදහසට හේතු ඉදිරිපත් කරයි නම්, එය 111 පරිච්ඡේදයේ 20.13 හා 20.14 උපඡේදවල විධිවිධාන පරිදි තීරණයක් ගැනීම සඳහා අදාළ පත්කිරීමේ බලධරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. — ස්වෙච්ඡාවෙන් නිදහසට කරුණු ඉදිරිපත් කිරීම

7.6 ඒ තැනැත්තා බැඳුම් කරයකට යටත් ව සිටී නම් ඔහු විසින් කොමිෂන් සභාවට/උසස් අධ්‍යාපන ආයතනයට බැඳුම්කරය යටතේ ගෙවීමට බැඳී ඇති සියලු මුදල් සම්පූර්ණයෙන් ගෙවිය යුතු බව ඔහුට දැන්විය යුතු ය. මේ මුදලට, ඔහුට හෝ ඔහු වෙනුවෙන් විශ්ව විද්‍යාලය විසින් හෝ ශිෂ්‍යත්ව ප්‍රදානය කරන ආයතනයක් විසින් ගෙවා ඇති සියලුම වැටුප් හා දීමනා ද, ගුවන් බලපත්‍ර වියදම ද, ලියා පදිංචි කිරීමේ ගාස්තු, අධ්‍යයන හා විභාග ගාස්තු, යැපීම් හා ජීවන දීමනා සහ වෙනත් ගෙවීම් ද ඇතුළත් වේ. — ගිවිසුමකට බැඳී ඇති තැනැත්තා සම්පූර්ණයෙන් නිරවුල් කිරීමට දැනීම

7.6.1 සඳහන් කර ඇති කාල සීමාව තුල දී (සති තුනක් පමණ) පිළිතුරක් නො ලද හොත් ඒ මුදල් නියම කරනු ලබන කාලයක් තුළ දී ගෙවන ලෙස බැඳුම් කරයේ ඇපකරුවන්ට දන්වා යැවිය යුතු ය.

7.6.2 නියමිත කාල් සීමාව තුළ දී ඇපකරුවන්ගෙන් පිළිතුරක් නොලද හොත් මුදල් ආපසු අයකර ගැනීමට නීතිමය පියවර ගැනීම් සඳහා අදාළ පරිදි කොමිෂන් සභාවට/උසස් අධ්‍යාපන ආයතනයට සම්පූර්ණ වාර්තාවක් යැවිය යුතු ය.

7.7 බැඳුම්කරයේ කොන්දේසිවලට අනුකූල ව එය නිරවුල් කරන ලද නම්, කලින් ලැබී තිබිය හැකි ඉල්ලා අස්වීමේ ලිපිය තීරණයක් ගැනීම සඳහා අවශ්‍යාවෝචිත පරිදි කොමිෂන් සභාවට/ආයතනයේ පාලක බල මණ්ඩලයට ඉදිරිපත් කළ හැකි ය.

*බැඳුම්කරය සම්පූර්ණයෙන් නිරවුල් කළ විට*

7.8 සම්පූර්ණ මුදල ගෙවා බේරුමක් කර නැත්නම්, ඒ තැනැත්තා වෙත සේවය අත් හැර ගියා සේ සලකනු ලබන බව ප්‍රකාශ කෙරෙන දැන්වීම නිකුත් කර ඇති බව ත් කොමිෂන් සභාවේ/උසස් අධ්‍යාපන ආයතනයේ සේවයේ නැවත වැඩ භාර ගෙන නැති බවත් පහත සඳහන් අයට දැන්විය යුතු ය.

*නිරවුල් නොකළ විට*

(අ) ශිෂ්‍යත්වය ප්‍රදානය කළ ආයතනය - මොනු කොමිෂන් සභාව/උසස් අධ්‍යාපන ආයතනය සමග බැඳුම් කරයකට අත්සන් කර ඇති බව දැන්වමින්;

(ආ) තානාපති අත් හැර ගිය තැනැත්තා සිටි බවට/සිටින බවට වාර්තා වී ඇති රටේ ශ්‍රී ලංකා මහ කොමසාරිස්තුමා හෝ තානාපතිවරයා;

(ඇ) අග්‍රාමාත්‍ය තුමාගේ ලේකම්;

(ඈ) විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්;

*ආ-ඊ දක්වා අදාළ තැනැත්තා ගේ ගමන් බලපත්‍රයේ වලංගු භාවය සම්බන්ධයෙන් කටයුතු කිරීමට*

(ඉ) ආගමන විගමන පාලකවරයා;

(ඊ) විනිමය පාලකවරයා

(උ) රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්;

(ඌ) මහා භාණ්ඩාගාරයේ මහජන ව්‍යාපාර අංශයේ අධ්‍යක්ෂ.

*උ-ඌ - රජයේ, රාජ්‍ය සංස්ථාවල හෝ සංස්ථාපිත මණ්ඩලවල රැකියා ලබා ගැනීම වැළැක්වීමට*

7.9 වෙනත් ආකාරයක නියෝගයක් දී නැත්නම් කොමිෂන් සභාව/උසස් අධ්‍යාපන ආයතනය විසින් ඉල්ලා අස්වීම භාරගත් බවට හෝ විශ්‍රාම ගිය බවට ලිපියක් නිකුත් කරන තුරු විශ්‍රාම වැටුපක් හෝ අර්ථසාධක අරමුදලක් හෝ ගෙවීම අනුමත නො කළ යුතු ය.

*විශ්‍රාම වැටුප/ අර්ථ සාධක අරමුදල*

7.10 ඉල්ලා අස්වීම/විශ්‍රාම යැම සම්බන්ධයෙන් කළ යුතු දැන්වීම වෙනුවට සාමාන්‍යයෙන් අය විය යුතු මාසයක වැටුප, ඒ තැනැත්තාට කොමිෂන් සභාවෙන්/උසස් අධ්‍යාපන ආයතනයෙන් ගෙවීමට ඇති මුදලින් අය කර ගත යුතු මුදලක් ලෙස සැලකිය යුතු ය.

*ඉල්ලා අස්වීම/ විශ්‍රාම යැම ගැන කලින් දැනුම්දීම වෙනුවට වැටුප*

ඇමුණුම - 26

පසුගිය වර්ෂ 04 ක අන්තර්ජාල පහසුකම් වෙනුවෙන් මෙම ආයතනයට කර තිබූ ගෙවීම්

| විශ්වවිද්‍යාලය/ ආයතනය | වර්ෂය | | | | |
|---|---|---|---|---|---|
| | 2014 | 2015 | 2016 | 2017 | එකතුව |
| සෞන්දර්‍ය කලා විශ්වවිද්‍යාලය | - | 17,846,778 | 18,759,955 | 21,690,002 | 58,296,735 |
| කැලණිය විශ්වවිද්‍යාලය | 15,273,761 | 26,127,628 | 43,233,589 | 47,594,273 | 132,229,251 |
| කොළඹ විශ්වවිද්‍යාලය | - | - | | | |
| ශ්‍රී ජයවර්ධන පුර විශ්වවිද්‍යාලය | 20,830,247 | 20,830,247 | 28,723,363 | 28,423,141 | 98,806,998 |
| පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 40,588,241 | 39,629,550 | 59,539,868 | 38,471,477 | 174,229,136 |
| මොරටුව විශ්වවිද්‍යාලය | 33,430,466 | 33,430,466 | 41,650,974 | 47,215,767 | 155,727,673 |
| රුහුණ විශ්වවිද්‍යාලය | | | | | |
| වයඹ විශ්වවිද්‍යාලය | 8,052,639 | 14,067,438 | 16,522,439 | 18,936,459 | 57,578,975 |
| ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 6,869,857 | 6,869,873 | 7,569,072 | 8,743,197 | 30,051,999 |
| රජරට විශ්වවිද්‍යාලය | 9,086,390 | 9,085,860 | 10,522,210 | 11,882,887 | 40,577,248 |
| යාපනය විශ්වවිද්‍යාලය | | | | | |
| සබරගමුව විශ්වවිද්‍යාලය | 11,982,653 | 11,982,653 | 14,149,533 | 16,311,143 | 54,425,982 |
| කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (පේරාදෙණිය විශ්වවිද්‍යාලය) | | 2,328,414 | 2,378,591 | 2,442,060 | 7,149,065 |
| මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය (පේරාදෙණිය විශ්වවිද්‍යාලය) | - | - | 2,957,950 | 3,848,626 | 6,806,576 |
| ගම්පහ වික්‍රම ආරච්චි ආයුර්වේද වෛද්‍යායතනය | 2,200,223 | 2,539,562 | 3,013,077 | 4,154,821 | 11,907,683 |
| නැගෙනහිර විශ්වවිද්‍යාලය | 8,695,694 | 9,216,253 | 11,176,839 | 13,698,064 | 42,786,850 |

| | | | | | |
|---|---|---|---|---|---|
| කොළඹ විශ්වවිද්‍යාලය යටතේ ජෛව රසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනය | | 763,069 | 1,640,312 | 1,651,046 | 4,054,427 |
| කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය | 1,037,288 | 1,037,288 | 1,036,961 | 1,538,983 | 4,650,520 |
| | **152,301,098** | **190,009,248** | **257,649,251** | **256,118,656** | **856,078,253** |

විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන විසින් පවත්වා ගෙන තිබූ අරමුදල්

| විශ්වවිද්‍යාලය | අරමුදල් සංඛ්‍යාව | 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| කොළඹ විශ්වවිද්‍යාලය | 13 | 1,805,786,534 |
| කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයන ආයතනය | 07 | 202,290,102 |
| කොළඹ විශ්වවිද්‍යාලය යටතේ වූ මානව සම්පත් අභිවර්ධන ආයතනය | 01 | 94,444,254 |
| කොළඹ විශ්වවිද්‍යාලය යටතේ වූ | | |
| ජෛව රසායන අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනය | 02 | 18,852 ,704 |
| වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 03 | 10,055,227 |
| පේරාදෙණිය විශ්වවිද්‍යාලය යටතේ වූ | | |
| වෙනත් අරමුදල් | 194 | 918,466,870 |
| ත්‍යාග අරමුදල් | 259 | 191,003,729 |
| පර්යේෂණ අරමුදල් | 73 | 207,836,826 |
| බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය | 06 | 41,412,357 |
| කැලණිය විශ්වවිද්‍යාලය | 15 | 833,477,134 |
| ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද වෛද්‍ය ආයතනය | 12 | 5,367,027 |
| පශ්චාත් උපාධි ආයතනය | 02 | 2,322,995 |
| බෞද්ධ හා පාලි පශ්චාත් උපාධි ආයතනය | 07 | 28,866,966 |
| මොරටුව විශ්වවිද්‍යාලය | 02 | 623,321,922 |
| රුහුණු විශ්වවිද්‍යාලය | 40 | 279,289,097 |
| ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය යටතේ වූ | | |

| | | |
|---|---|---|
| ත්‍යාග අරමුදල් | 64 | 5,063,427 |
| වෙනත් අරමුදල් | 74 | 313,590,003 |
| ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 15 | 51,387,459 |
| ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 05 | 34,108,781 |
| | <u>794</u> | <u>5,666,943,414</u> |

<u>වැය නොකළ ප්‍රාග්ධන ප්‍රදාන</u>

| විශ්වවිද්‍යාලය | 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| කොළඹ විශ්වවිද්‍යාලය | 698,213,632 |
| ජෛව රසායන අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනය | 10,530,399 |
| කොළඹ විශ්වවිද්‍යාලය යටතේ වූ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 1,087,946 |
| කොළඹ විශ්වවිද්‍යාලය යටතේ වූ කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය | 5,118,024 |
| කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනය | 4,314,513 |
| කොළඹ විශ්වවිද්‍යාලය යටතේ වූ මානව සම්පත් අභිවර්ධන ආයතනය | 6,303,980 |
| පේරාදෙණිය විශ්වවිද්‍යාලය යටතේ වූ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 6,067,991 |
| පේරාදෙණිය විශ්වවිද්‍යාලය | නැත |
| ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 5,448,425 |
| බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය | 17,034,435 |
| කැලණිය විශ්වවිද්‍යාලය | 440,426,491 |
| ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද වෛද්‍ය ආයතනය | 191,753,989 |
| පශ්චාත් උපාධි ආයතනය | 2,753,989 |
| බෞද්ධ හා පාලි පශ්චාත් උපාධි ආයතනය | 2,703,670 |
| මොරටුව විශ්වවිද්‍යාලය | නැත |
| ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 21,817,404 |
| ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 1,642,414 |
| සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය | නැත |
| | <u>1,416,216,302</u> |

ඇමුණුම - 29

විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන විසින් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීම

| විශ්වවිද්‍යාලය හෝ උසස් අධ්‍යාපන ආයතනය | ස්ථාවර තැන්පතු වටිනාකම රු. (2017 දෙසැම්බර් 31 දිනට) |
|---|---|
| කොළඹ විශ්ව විද්‍යාලය | 2,254,759,942 |
| මානව සම්පත් අභිවර්ධන ආයතනය (UOC) | 293,863,716 |
| කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනය (UOC) | 711,177,421 |
| වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (UOC) | 205,475,432 |
| ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනය (UOC) | 54,279,977 |
| මොරටුව විශ්වවිද්‍යාලය | 468,147,165 |
| තාක්ෂණ ආයතනය - මොරටුව විශ්වවිද්‍යාලය | 19,082,110 |
| ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය | 55,011,956 |
| ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 1,141,497,783 |
| කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය (USJP) | 443,611,669 |
| කැලණිය විශ්වවිද්‍යාලය | 2,896,243,778 |
| සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය | 19,019,019 |
| ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය (UOK) | 214,936,567 |
| පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය (UOK) | 1,650,658 |
| පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය (UOK) | 19,885,264 |
| ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය | 1,445,935,694 |
| ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය | 46,761,464 |
| පේරාදෙණිය විශ්වවිද්‍යාලය ( Restricted Funds) | 200,076,011 |
| පේරාදෙණිය විශ්වවිද්‍යාලය (Other Funds) | 964,541,198 |
| මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (UOP) | 27,150,896 |
| කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (UOP) | 405,414,065 |
| විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (UOP) | 328,050,018 |
| අග්නිදිග විශ්ව විද්‍යාලය | 113,248,329 |
| නැගෙනහිර විශ්වවිද්‍යාලය | 71,438,331 |
| ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය | 227,459,297 |

| | |
|---|---|
| ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය | 31,495,339 |
| වයඹ විශ්වවිද්‍යාලය | 120,766,588 |
| ශ්‍රී ලංකා සබරගමුව විශ්විද්‍යාලය | 63,627,312 |
| රුහුණු විශ්ව විද්‍යාලය | 207,618,651 |
| ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 23,501,018 |
| යාපනය විශ්වවිද්‍යාලය | 1,016,149,341 |
| **එකතුව** | **14,091,876,009** |

<u>අධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු 2017 දෙසැම්බර් 31 දිනට</u>

| | | අනුමත | තත්‍ය | පුරප්පාඩු | ගෙවා ඇති වැටුප |
|---|---|---|---|---|---|
| 01. | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 1178 | 857 | 321 | 1,361,107,609 |
| 02. | කොළඹ විශ්වවිද්‍යාලය | 1144 | 862 | 282 | 1,495,411,974 |
| 03. | කොළඹ විශ්වවිද්‍යාලය - පරිගණක අධ්‍යයන ආයතනය | 163 | 97 | 66 | 123,049,736 |
| 04. | වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (කොළඹ විශ්වවිද්‍යාලය) | 13 | 13 | - | 27,453,803 |
| 05. | මානව සම්පත් අභිවර්ධන ආයතනය (කොළඹ විශ්වවිද්‍යාලය) | 12 | 09 | 03 | 472,539 |
| 06. | කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය (කොළඹ විශ්වවිද්‍යාලය) | 10 | 05 | 05 | 4,268,672 |
| 07. | රුහුණු විශ්වවිද්‍යාලය | 780 | 570 | 210 | 1,065,772,600 |
| 08. | කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය (පේරාදෙණිය විශ්වවිද්‍යාලය) | 07 | 04 | 03 | 2,672,871 |
| 09. | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (පේරාදෙණිය විශ්වවිද්‍යාලය) | 04 | 01 | 03 | - |
| 10. | පාලි හා බෞද්ධ විශ්වවිද්‍යාලය | 60 | 55 | 05 | 130,451,278 |
| 11. | කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය | 17 | 14 | 03 | 5,499,276 |
| 12. | ජෛව රසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනය | 16 | 09 | 07 | 13,180,476 |
| 13. | ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 280 | 192 | 88 | 267,383,227 |
| 14. | පශ්චාත් උපාධි ආයතනය කැලණිය විශ්වවිද්‍යාලය | 15 | 10 | 05 | 25,787,988 |
| 15. | කැලණිය විශ්වවිද්‍යාලය | 832 | 590 | 242 | 379,052,091 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 16. | ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද වෛද්‍ය ආයතනය | 56 | 38 | 18 | 79,614,496 |
| 17 . | පාලි හා බෞද්ධ අධ්‍යාපන පශ්චාත් උපාධි ආයතනය - කැලණිය විශ්වවිද්‍යාලය | 09 | 09 | - | 19,259,623 |
| | | 4,596 | 3,335 | 1,261 | 5,000,438,259 |

ඇමුණුම - 31

<u>අනධ්‍යයන කාර්ය මණ්ඩලය 2017 දෙසැම්බර් 31 දිනට</u>

| | අනුමත | තත්‍ය | පුරප්පාඩු | ගෙවා ඇති වැටුප රු. |
|---|---|---|---|---|
| පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 2565 | 2071 | 494 | 1,761,117,389 |
| කොළඹ විශ්වවිද්‍යාලය | 1192 | 895 | 297 | 775,506,091 |
| කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක අධ්‍යාපන ආයතනය | 105 | 78 | 27 | 60,445,144 |
| වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (කොළඹ විශ්වවිද්‍යාලය) | 119 | 103 | 16 | 82,149,487 |
| කොළඹ විශ්වවිද්‍යාලය කෘෂි තාක්ෂණ හා ග්‍රාමීය විද්‍යා ආයතනය | 15 | 13 | 02 | 7,943,373 |
| රුහුණු විශ්වවිද්‍යාලය | 1024 | 833 | 191 | |
| රජරට විශ්වවිද්‍යාලය | 541 | 427 | 114 | 336,928,233 |
| කෘෂි කර්ම පශ්චාත් උපාධි ආයතනය (පේරාදෙණිය විශ්වවිද්‍යාලය) | 50 | 27 | 23 | 32,361,770 |
| විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (පේරාදෙණිය විශ්වවිද්‍යාලය) | 36 | 28 | 08 | |
| මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (පේරාදෙණිය විශ්වවිද්‍යාලය) | 12 | 10 | 02 | |
| බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය | 195 | 117 | 78 | 70,738,292 |
| කලමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය | 27 | 27 | | 17,415,600 |
| ජෛව රසායන ජෛව වේද හා ජෛව තාක්ෂණ ආයතනය | 21 | 11 | 10 | 6,980,269 |
| ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 224 | 147 | 77 | 80,250,883 |

| | | | | |
|---|---|---|---|---|
| පශ්චාත් උපාධි ආයතනය කැලණිය විශ්වවිද්‍යාලය | 24 | 20 | 4 | 14,462,111 |
| කැලණිය විශ්වවිද්‍යාලය | 896 | 768 | 128 | 238,647,033 |
| වික්‍රමාරච්චි ආයුර්වේද ආයතනය | 132 | 115 | 17 | 96,193,446 |
| පාලි හා බෞද්ධ අධ්‍යාපන පශ්චාත් උපාධි ආයතනය කැලණිය විශ්වවිද්‍යාලය | 29 | 26 | 3 | 19,020,980 |
| | **7,207** | **5,716** | **1,491** | |

ඇමුණුම - 32

34

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

ආයතන චක්‍රලේඛ ලිපි අංක: 06/2014

නො. 20, වෝඩ් පෙදෙස,
කොළඹ 07
2014, මාර්තු මස 26 වන දින.

උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

**සංග්‍රහ වියදම් සඳහා ගෙවීම**

සංග්‍රහ දීමනා ප්‍රතිපූර්ණය කිරීම වෙනුවෙන් නිකුත් කර ඇති 1979.03.14 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 07, 1979.04.23 දිනැති අංක 18, 1979.08.17 දිනැති අංක 31, 1982.05.18 දිනැති අංක 172, 1984.08.01 දිනැති අංක 265, 1984.11.05 දිනැති අංක 278, 1984.12.04 දිනැති අංක 284, 1987.07.02 දිනැති අංක 350, 1988.04.06 දිනැති අංක 364, 1991.10.01 දිනැති අංක 491 සහ 1992.03.09 දිනැති අංක 508 කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

2013.10.10, 2014.01.06 සහ 2014.03.05 දිනයන්හි රැස්වූ 882, 887, සහ 890 වැනි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා රැස්වීම් වාර වලදී, 2014.01.01 දින සිට උක්ත දීමනාව "සංග්‍රහ වියදම් සඳහා ගෙවීම" යනුවෙන් නැවත නම් කිරීමටත් පවත්නා දීමනා පහත පරිදි වැඩි කිරීමටත් තීරණය කරන ලදී.

| තනතුර | සංශෝධිත දීමනාව මාසික මූලික වැටුපේ ප්‍රතිශතයක් ලෙස (රු.) |
|---|---|
| සභාපති/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | 20% |
| උප සභාපති/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | 15% |
| උපකුලපති | 15% |
| ලේකම්/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | 12% |
| මණ්ඩප වල මණ්ඩපාධිපති | 12% |
| ආයතන අධ්‍යක්ෂ | 12% |
| පීඨයක පීඨාධිපති | 10% |
| ලේඛකාධිකාරී / අතිරේක ලේකම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | 10% |
| අධ්‍යයන අංශ ප්‍රධානී | 8% |
| මූල්‍යාධිකාරිවරුන් හා ඒ හා සමාන ශ්‍රේණිවල සිටින නිලධාරීන් | 10% |

තවද, මෙම ගෙවීම සඳහා සුදුසුකම් ලබන නිලධාරීන් එකී ගෙවීම සඳහා බිල්පත් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවන අතර එම සංග්‍රහ වියදම දරන ලද බවට තමා විසින් සහතික කරන ලද ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම මෙම ගෙවීම සඳහා ප්‍රමාණවත් වේ.

මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වීමත් සමඟම කොමිෂන් සභා චක්‍රලේඛ අංක 18, 172, 278, 284, 350, 364, 491 හා 508 ත්,මේ සම්බන්ධයෙන් උපදෙස් ලබාදී ඇති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 07, 31, සහ 265 හි අදාල කොටස් ද අවලංගු වේ.

කරුණාකර ඒ අනුව කටයුතු කරන්න.

අ/කළේ: මහාචාර්ය ක්ෂණිකා හිරිඹුරේගම
සභාපතිනිය

පිටපත්:

1. ලේකම්/ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති කාර්යාලය
3. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උප සභාපති
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයින්
5. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම්
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල වල ලේඛකාධිකාරිවරුන්
8. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ගණකාධිකාරී
9. විශ්වවිද්‍යාල වල මුල්‍යාධිකාරීවරුන්
10. උසස් අධ්‍යාපන ආයතන වල පුස්තකාලයාධිපතිවරුන්/ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන් / සහකාර පුස්තකාලයාධිපතිවරුන්
11. උසස් අධ්‍යාපන ආයතන /මණ්ඩප වල නියෝජ්‍ය ලේඛකාධිකාරිවරුන්/ජ්‍යෙ.ස.ලේ /ස.ලේ
12. උසස් අධ්‍යාපන ආයතන /මණ්ඩප වල නියෝජ්‍ය මුල්‍යාධිකාරීවරුන්/ජ්‍යෙ.ස.මු/ස.මු
13. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක
14. විශ්වවිද්‍යාල වල රජයේ විගණන අධිකාරිවරුන්
15. උසස් අධ්‍යාපන ආයතන වල ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන්/ ස.අ.වි
16. වෘත්තීය සමිතිවල ලේකම්වරුන්
17. විගණකාධිපති

ගොනු අංකය: යූ.ජී.සී./එච්.ආර්./6/1/5